# සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## 10 - 11 ශ්‍රේණි



සිංහල දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

ADB SEMP

# සිංහල සාහිත්‍ය රසාස්වාදය

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

10 - 11 ශ්‍රේණි

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

2007

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ජාතික අධ්‍යාපන ආයතනය
පළමුවන මුද්‍රණය: 2007

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ISBN 978 - 955 - 654 - 138 - 0

"ආසියානු සංවර්ධන බැංකුවේ
ද්විතීය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
මගින් මුද්‍රණය කරන ලදී."

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපනය ආයතනය

මුද්‍රණය ඃ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.

## පෙරවදන

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විෂයෙහි විෂයමාලාවේ ඇතිකළ වෙනස්කම් අවධානයට ගෙන සාහිත්‍ය විෂය නිර්දේශයේ ප්‍රාමාණික හා ගුණාත්මකභාවයන් ජනිත කිරීමේ අධ්‍යාශයෙන් අභිනව අන්තර්ගතයන් කෙරෙහි යොමුවීම අගය කළ යුතු ය.

එයට අනුරූප ව රචිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරු භවතුන්ගේ වින්දන හා චින්තන ශක්තිය මගින් රසඥතාව වර්ධනය කර ගැනීමටත් ඒ මගින් ශිෂ්‍ය සමූහයාගේ පරිකල්පනය පුබුදු කරවන්නටත් හේතුපාදක වේ. කෘතහස්ත උපදේශක හා ලේඛක මණ්ඩලයක පරිශ්‍රමයෙන් සකසා ඇති මෙය මැනවින් පරිශීලනය කරමින් තම නිර්මාණ දායකත්වය ද සපයමින් සිසු අභිරුචීන් පරිණතිය හා වයස් මට්ටම් ආදිය අවධානයට ගෙන පාඩම් සැලසුම් කිරීමට යොමු වීම අත්‍යවශ්‍ය ය.

මෙම කෘතිය සැකසීමේ කාර්යයේ නියැළුණු සියලු දෙනාට ස්තුතිය පිරිනමමි.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## සංදේශය

අභිනව විෂයමාලාවේ දර්ශනය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව විමර්ශන පූර්වක අවධානය සහිත ව රචිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, සාහිත්‍යය හා රසාස්වාදය විෂය නිර්දේශයේ එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි දී මතු කර ගෙන ඇති ප්‍රධාන නිපුණතා ප්‍රවර්ධනය කර ගනිමින් ඉගෙනුම් කාර්යය අර්ථවත් මඟකට යොමු කරන්නට අත්වැළක් සපයන බව පෙනේ.

මෙහිදී ගුරු භවතුන්ගේ කාර්යභාරය විය යුත්තේ මෙම නිපුණතා පිළිබඳව මනා අවබෝධයකින් යුතු ව සාහිත්‍ය පොතපත නිතර පරිශීලනය කරන සහෘදයකු ලෙස ශිෂ්‍ය සමූහයාගේ රසඥතාව පුබුදු කරන්නට මාර්ගෝපදේශයක් ලබා දීමයි.

එමඟින් මනුෂ්‍ය ජීවිතය අර්ථවත් කර ගන්නට, ජීවත් වීමට අවශ්‍ය අවබෝධය ගැඹුරු කරගන්නට, මානව දයාව මිනිසුන් තුළ ජනිත කරවන්නට අවශ්‍ය පසුබිමක් සිසුන් තුළ ගොඩනැගෙනු ඇත. එය නිපුණතා ප්‍රවේශයෙන් අරුත් ගන්වන ජීවිත අභියෝග ජයගැනීම යන දිනුම් කණුවට ළඟා වීම සඳහා මහඟු පිටුබලයක් වනු ඇතැයි මගේ විශ්වාසයයි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# සිංහල සාහිත්‍ය විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදක මණ්ඩලය

- උපදේශනය
  මහාචාර්ය ජේ.ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා - අධ්‍යක්ෂ ජනරාල්
  ජාතික අධ්‍යාපන ආයතනය
- අධීක්ෂණය
  විමල් සියඹලාගොඩ මහතා - සහකාර අධ්‍යක්ෂ ජනරාල්
  භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
- මෙහෙයවීම
  අධ්‍යක්ෂ
  ආචාර්ය සුරනිමල ලේකම්ගේ මහතා - සිංහල දෙපාර්තමේන්තුව
  ජාතික අධ්‍යාපන ආයතනය
- විෂය විශේෂඥ උපදේශකත්වය -
  මහාචාර්ය ගාමිණී දෑළ බණ්ඩාර මහතා - කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය
- සම්බන්ධීකරණය -
  ජේමසිරි සුබසිංහ මහතා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී,
  සිංහල දෙපාර්තමේන්තුව
  ජාතික අධ්‍යාපන ආයතනය
- සංස්කරණය -
  එම්.ජී. සුසිල් සිරිසේන මහතා - ව්‍යාපෘති නිලධාරී, සිංහල දෙපාර්තමේන්තුව
  ජාතික අධ්‍යාපන ආයතනය
  ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා - ව්‍යාපෘති නිලධාරී, සිංහල දෙපාර්තමේන්තුව
  ජාතික අධ්‍යාපන ආයතනය
  ඩබ්ලිව්.පී. මංගල ගුණරත්න මහතා - සහකාර ව්‍යාපෘති නිලධාරී,
  සිංහල දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන
  ආයතනය
- බාහිර සම්පත් දායකත්වය -
  ජේ. සෙනෙවිරත්න මහතා - විදුහල්පති/ ව/හලා/ශ්‍රී සීලානන්ද ම.වි.,
  කොස්වත්ත.
  කපුරු බණ්ඩාර ජයතිලක මහතා - විශ්‍රාමික විදුහල්පති/ 45/3, පාසල් මාවත,
  රත්නපිටිය, බොරලැස්ගමුව
  වඩුගේ කරුණාරත්න මහතා - විශ්‍රාමික ගුරු/ 22, පොල්පිත්ගම,
  කෝන් වැව.
  ලීලානන්ද වික්‍රමසිංහ මහතා - විශ්‍රාමික ගුරු/ ධර්මපාල මාවත,
  නූපේ, මාතර
  ඩබ්ලිව්.එම්. නිශ්ශංක බණ්ඩාර මහතා - ගුරු සේවය/ ගම්/බිය/දොම්පේ මහා
  විද්‍යාලය, දොම්පේ
  එච්.බී. සුවිසල් හේරත් මහත්මිය - ගුරු උපදේශක/ කෑ/දෙහි/හක්බෙල්ලාවක
  කනිෂ්ඨ විද්‍යාලය, හක්බෙල්ලාවක
  එච්.පී. විජේරත්න මහතා - ගුරු සේවය/ කොට්ඨාස අධ්‍යාපන
  කාර්යාලය, නාත්තණ්ඩිය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## පටුන


| | | | පිටුව |
|---|---|---|---|
| | විෂය නිර්දේශය | | 01 |
| 1. | පුරාතන ගද්‍ය - | උම්මග්ග ජාතකය | 03 |
| 2. | පුරාතන පද්‍ය - | බුදුගුණඅලංකාරය | 06 |
| 3. | නූතන ගද්‍ය (නවකතා)- | පෙත්සම | 12 |
| 4. | නූතන පද්‍ය සංග්‍රහය | | 15 |
| 4.1 | වෙස්සන්තර ජාතක කාව්‍ය | - | 19 |
| 4.2 | වදන් කවි පොත | - | 22 |
| 4.3 | යසෝදරාවත | - | 24 |
| 4.4 | ඉතින් ආයුබෝවන් ලක් මවුනි ගරු | - | 26 |
| 4.5 | ලංකා මාතා | - | 28 |
| 4.6 | කම්මැලි මිනිහෙක් | - | 30 |
| 4.7 | හිඟන්නා | - | 33 |
| 4.8 | හැවිල්ල | - | 36 |
| 4.9 | මගේ රට | - | 39 |
| 4.10 | පිටිසර ළමයෙක් | - | 41 |
| 4.11 | දුප්පත් ළමයෙක් | - | 43 |
| 4.12 | කුරුලු කූඩුවක් | - | 46 |
| 4.13 | කාසි | - | 49 |
| 4.14 | කිරාගේ පවුල | - | 51 |
| 4.15 | ගවපල්ලාගේ මඟුල | - | 53 |
| 4.16 | කවිකොළ කාරයා | - | 56 |
| 4.17 | සුරාපානය | - | 59 |
| 4.18 | අකුරට යනවයි කියලා | - | 61 |
| 4.19 | ඉරපායා ඉර මුදුනට යන්න එපා | - | 63 |
| 4.20 | වත්කඩ බඳිමු | - | 65 |
| 4.21 | මරණය | - | 68 |
| 4.22 | සිට්ටම්මා | - | 71 |
| 4.23 | සෙවනැලි | - | 73 |


Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# සිංහල සාහිත්‍යය හා රසාස්වාදය විෂය නිර්දේශය
## 10 - 11 ශ්‍රේණි

1. පුරාතන ගද්‍ය - **උම්මග්ග ජාතකය**
2. පුරාතන පද්‍ය - **බුදුගුණඅලංකාරය**
3. නූතන ගද්‍ය (නවකතා)- **පෙත්සම**
4. නූතන පද්‍ය සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| 4.1 | වෙස්සන්තර ජාතක කාව්‍ය | - | 520 සිට 542 දක්වා |
| 4.2 | වදන් කවි පොත | - | 30 - 37, 42 |
| 4.3 | යසෝදරාවත | - | තෝරාගත් කවි |
| 4.4 | ඉතින් ආයුබෝවන් ලක් මවුනි ගරු | - | |
| 4.5 | ලංකා මාතා | - | එස්. මහින්ද හිමි |
| 4.6 | කම්මැලි මිනිහෙක් | - | පී.එච්. පෙරේරා |
| 4.7 | හිඟන්නා | - | කුමාරතුංග මුනිදාස |
| 4.8 | හැවිල්ල | - | රැපියල් තෙන්නකෝන් |
| 4.9 | මගේ රට | - | පී.බී. අල්විස් පෙරේරා |
| 4.10 | පිටිසර ළමයෙක් | - | මීමන ප්‍රේමතිලක |
| 4.11 | දුප්පත් ළමයෙක් | - | කේයස් |
| 4.12 | කුරුලු කූඩුවක් | - | එච්.එම්. කුඩලිගම |
| 4.13 | කාසි | - | උඳුගොඩ නවරත්න |
| 4.14 | කිරාගේ පවුල | - | ධර්ම ශ්‍රී කුරුප්පු |
| 4.15 | ගවපල්ලාගේ මඟුල | - | උපනන්ද බටුගෙදර |
| 4.16 | කවිකොළ කාරයා | - | විල්සන් හෑගොඩ |
| 4.17 | සුරාපානය | - | ජෝන් රාජදාස |
| 4.18 | අකුරට යනවයි කියලා | - | චන්ද්‍රරත්න මානවසිංහ |
| 4.19 | ඉරපායා ඉර මුදුනට යන්න එපා | - | විමලරත්න කුමාරගම |
| 4.20 | වත්කඩ බඳිමු | - | ගුණදාස අමරසේකර |
| 4.21 | මරණය | - | මහගමසේකර |
| 4.22 | සිට්ටම්මා | - | විමල් දිසානායක |
| 4.23 | සෙවනැලි | - | මර්සලින් ජයකොඩි පියතුමා |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# විෂය නිපුණතා

**පුරාතන ගද්‍ය**
**උම්මග්ග ජාතකය**

- උසස් සාහිත්‍ය කෘති පරිශීලනය මගින් ඒ කෙරෙහි ඇල්මක් ඇති කරගෙන එහි සමාජ සංස්කෘතික අගය වටහා ගනිමින් ජීවිත පරිඥානය ලබයි.
- පැරණි සාහිත්‍යය සිංහල භාෂාවේ ජීවය හා අනන්‍යතාව පිළිබිඹු කරන ජාතික උරුමයක් බව වටහා ගනිමින් උමංදාවේ බස්වහර හා ව්‍යාකාරණ සම්ප්‍රදායන් ගවේෂණය කරයි.
- උම්මග්ග ජාතකය මැනවින් අධ්‍යයනය කරමින් වින්දන චින්තන හා නිර්මාණාත්මක ශක්‍යතා මතු කර ගැනීමට අවශ්‍ය පරිචය ලබයි.

**පුරාතන පද්‍ය**
**බුදුගුණඅලංකාරය**

- උසස් සාහිත්‍ය කෘති පරිශීලනය මගින් ඒ කෙරෙහි ඇල්මක් ඇති කරගෙන එහි සමාජ සංස්කෘතික අගය වටහා ගනිමින් ජීවිත පරිඥානය ලබයි.
- නියමිත පද්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතුව කියවමින් එහි උපයුක්ත මට සිලිටි සරල භාෂාව හා එහි විශේෂතා අධ්‍යයනය කරයි.
- සිව්පද කාව්‍යයේ විවිධත්වය මතු කළ මෙම නිර්මාණ ග්‍රන්ථය සංස්කතික දායාදයන් හඳුනාගන්නට ඉන් පෝෂණය ලබා නව නිර්මාණ බිහි කරන්නට හා ජීවිතාවබෝධයක් ලබන්නට හේතුවන බව අධ්‍යයනය කරයි.

**නූතන ගද්‍ය - පෙත්සම නව කතාව**

- සිංහල නවකතාව, එහි ගමන් මග හා විශේෂතා අවබෝධ කර ගෙන පෙත්සම නවකතාවට හිමි තැන අධ්‍යයනය කරයි.
- නවකතාවේ මූලික ලක්ෂණ (වස්තු විෂය, භාෂාව) හා පෙත්සම නවකතාවේ සුවිශේෂතා අවබෝධ කර ගෙන පැහැදිලි ව දක්වයි.
- පෙත්සම නවකතාවේ චරිත නිරූපණය පිළිබඳ ප්‍රමුඛ ලක්ෂණ මතු කර ගනිමින් ඉදිරිපත් කරයි.

**නූතන පද්‍ය සංග්‍රහය**

- කොළඹ යුගයේ සාහිත්‍යයේ විවිධ අවස්ථා හා විවිධ අංශවල පද්‍ය රචකයින්ගේ නියෝජනයක් වන මෙම කවියන්ගේ විශේෂතා පිළිබඳව අවබෝධයෙන් යුතුව කරුණු සොයා ලියා දක්වයි.
- පද්‍ය පන්ති ගායනා කිරීමේ ශක්‍යතා ලබමින් ඒවායේ අර්ථ රසය, භාසාව, අත්දැකීම්, විවිධ අලංකාර, කාව්‍යමය උපක්‍රම පිළිබඳ විමර්ශනය කරයි.
  කාව්‍ය රසාස්වාදය මගින් භාවමය පක්ෂය සංවර්ධනය කර ගනිමින් කාව්‍ය නිර්මාණයට අවශ්‍ය කුසලතා ගොඩනගා ගනියි.
- ජනකවි කියවා රසවිඳීම මගින් එහි විශේෂතා හා යහපත් ආකල්ප සංවර්ධනය කර ගැනීම සඳහා කරුණු රැස්කරයි.



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 1 උම්මග්ග ජාතකය

## 1.1 හැඳින්වීම

කුරුණෑගල රාජධානි සමය සමස්ත වශයෙන් සලකන විට එය සාහිත්‍යික ව්‍යාපාරයන් අතින් පොළොන්නරු, දඹදෙණි හා කෝට්ටේ වැනි රාජධානි සමයන් තරම් උත්කර්ෂවත් බවක් නොදැක් වූ බව සත්‍යයකි. එතෙකුදු වුවත් කුරුණෑගල යුගයෙහි ද එක්තරා ප්‍රමාණයක සාහිත්‍ය ආලෝකයක් පැතිර තිබුණේ ය.

විචාරවත් රසිකයන්ගේ සම්මානනයට පාත්‍රව ඇති ජාතක පොත, වෘත්ත ගන්ධි ශෛලියෙන් රචිත දළාදා සිරිත, කුවේණි අස්න හා දඹදෙණි අස්න මෙකල ගද්‍ය සාහිත්‍යය වර්ණවත් කළේ ය.

මේ යුගයට අයත් විල්ගම්මුල මාහිමියන්ගේ කෘතියක් ලෙස සැලකෙන සඳකිඳුරු දා කව, ජාතක කථා ආශ්‍රයෙන් කාව්‍ය රචනා කිරීම පෙර පටන් ම සිංහල කවියාට පුරුදු පුහුණු වූවක් බව සිහිගන්වයි. එය අභිරුචියෙන් කියවිය හැකි කාව්‍යයකි. කෙසේ නමුත් මේ කෘති කෙරෙහි විචාරක්ෂිය යොමු කරන විට කුරුණෑගල යුගය සාහිත්‍ය අතින් නිසරු යුගයක් ලෙස බැහැර කිරීම ද යුක්ති යුක්ත නොවන බව පෙනී යයි.

**උම්මග්ග ජාතකය** කුරුණෑගල රාජධානි සමයේ සිංහල බණ කතා සාහිත්‍යයට එක් වූ අතිශයින් ම ජනප්‍රිය කෘතියකි. සිවුවැනි පැරකුම්බා රාජ්‍යයේ ඇමතිවරයෙකු වූ වීරසිංහ ප්‍රතිරාජ විසින් ලියුවකි. උමගක් පිළිබඳ කතාව ග්‍රන්ථයේ ප්‍රධාන ප්‍රවෘත්තිය වී ඇති නිසා උම්මග්ග ජාතකය යන නම ආරෝපණය කර ඇත. බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥා පාරමිතාව ඉස්මතු කරන මෙම කතාව පන්සිය පනස් ජාතක පොතෙහි ඇතුළත් ව ඇත.

බෝධිසත්ත්වයන් වහන්සේ මහෞෂධ පඬි ව ඉපදී තම ප්‍රඥාව වහල් කොට ගෙන කළ කටයුතු හා ලද ජයග්‍රහණ කතාවෙන් විස්තර වේ. චූලනි බ්‍රහ්මදත්ත රජුගේ උපදේශකයා වූ කේවට්ට බමුණාගේත් වේදේහ රජුගේ උපදේශකයන් වූ සේනකාදී බමුණු පඬිවරුන්ගේත් ඥානය අභිබවමින් ඔවුන් අවඥාවට ලක් කරමින් සියලු අභියෝග ජයගත් ප්‍රඥාවන්තයෙකි මහෞෂධ පඬිවරයා. ඒ අනුව බලන විට ක්ෂත්‍රියන් හා බ්‍රහ්මණයන් යටපත් කොට වෛශ්‍යයන් (ගොවි කුලය) නඟාලීමට දැරූ උත්සාහය **උම්මග්ග ජාතකයෙන්** පෙනේ. සංකීර්ණ චරිත නිරූපණ, සජීවී අවස්ථා නිරූපණ, කුතුහලය දනවන සංසිද්ධි හා අතුරු කතා ආදියෙන් සමන්විත **උම්මග්ග ජාතකය** රසිකයාට ගැඹුරු ආස්වාදයක් ලබා දෙයි.

මෙහි ඇතුළත් සමාජ තොරතුරු, දැනුම වැඩීමටත් සමාජ සාර ධර්ම ජීවන දෘෂ්ටිය හා ආකල්පමය සංවර්ධනයටත් හේතු වේ. එපමණක් නොව පසුකාලීන කලාකරුවන්ට සිය නිර්මාණ සඳහා කතා වස්තු සපයා දුන් කෘතියක් ද වේ. සමාජ සදාචාරය හා රස වින්දනය අපේක්ෂා කරන්නන්ට අදත් නවතාවෙන් කියවිය හැකි ග්‍රන්ථයකි උම්මග්ග ජාතකය.

1.2 අභිමතාර්ථ

- කුරුණෑගල යුගයේ සාහිත්‍යය පසුබිම, ජාතක කතාවල පොදු ලක්ෂණවලට අනුගත වන ලෙස උම්මග්ග ජාතකය රචනා වී ඇති බව අවබෝධ කර ගැනීම
- මහෞෂධ පණ්ඩිතයා ස්ථානෝචිත ප්‍රඥාවෙන් අධිෂ්ඨානයෙන් හා කාර්ය සූරත්වයෙන් උද්ගත වූ සියලු අභියෝග ජය ගත් ආකාරය අවබෝධ කර ගැනීම
- චූලනී බ්‍රහ්මදත්ත හා වේදේහ රජුන්ගේත්, කේවට්ට හා මහෞෂධ පණ්ඩිතයන්ගෙත්, සේනකාදීන්ගේත්, තලතා, උදුම්බරා, නන්දා හා අමරා දේවියන්ගේත් චරිත ස්වභාවයන් හඳුනා ගැනීම
- අතීතයේ යුද්ධ උපක්‍රම සන්නිවේදන ක්‍රම හා තාක්ෂණ ශිල්පීය දැනුම හඳුනා ගැනීම
- රජුන් බමුණන් හාස්‍යයට හා උපහාසයට ලක් කරමින් ගොවි පුතෙකු වූ මහෞෂධ වර්ණනාත්මක ව අගයන අයුරු අවබෝධ කර ගැනීම
- මහෞෂධ චරිතයේ සංකීර්ණ ලක්ෂණ හඳුනා ගැනීම
- කාලීන සමාජ ඇවතුම් පැවතුම් සිතුම්පැතුම් හා සමාජ සාරධර්ම ද සංස්කෘතික ලක්ෂණ ද සැලකිල්ලට ගැනීම
- බස් වහරෙත් රචනා රීතියේත් විශේෂතා හඳුනා ගැනීම
- වර්ණනා, අවස්ථා නිරූපණය හා සංවාදවල සජීවී බව අවබෝධ කර ගැනීම
- සිත් ගන්නා සුලු අවස්ථා වස්තු කර ගනිමින් නිර්මාණ කුසලතා වර්ධනය කර ගැනීම

1.3 අභිමතාර්ථ සාධනය

1.3.1 ප්‍රවේශය

- කාලගෝල නාට්‍යයේ ගීත කොටසක් ගායනා කරමින්
- උම්මග්ග ජාතකයේ කතා හා අවස්ථා හෝ දික්තල කාලගෝල නාට්‍යයේ ගීත කොටසක් ගායනා කරමින් හෝ-සිසුන්ගේ පෙර දැනුම විමසන සාකච්ඡාවකින්
- ගුරුවරයාට අභිමත වෙනත් අයුරකින්

1.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පාඩම කාණ්ඩ වශයෙන් සිසුන් ලවා කියවමින් දුෂ්කර පද පැහැදිලි කර ගැනීමට අවස්ථාව සැලසීම. (පාඩමේ ඇතුළත් වැදගත් තොරතුරු සිසුන්ට පැහැදිලි කර දීම සඳහා ද මේ අවස්ථාව යොදා ගන්න).
- පාඩම් පිළිබඳ අවබෝධය තහවුරු කිරීමටත් ඒ තොරතුරුවලින් පැවසෙන අදහස් භාවිත කිරීමටත් සිසුන් යොමු කරවීම පහත සඳහන් ශීර්ෂ යටතේ යොදා ගැනීම

- **මහෞෂධ පණ්ඩිතයාගේ ස්ථානෝචිත ප්‍රඥාව ප්‍රකට වන තැන්**
  - බාල කාලයේ ප්‍රශ්න විසඳූ ආකාරය
  - සේනකාදි පණ්ඩිතයන් අභිබවා, රාජ්‍ය උපදේශකයා වීම
  - මියුලු නුවර ආරක්ෂක කටයුතු
  - චරපුරුෂ සේවය
  - සුරා මණ්ඩපය විනාශ කිරීම
  - බ්‍රහ්මදත්ත රජුගේ සේනාව එළවා දැමීම
  - අනුකේවට්ට උපාය
  - ධර්ම යුද්ධය
  - උමං කර්මාන්තය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- **ප්‍රධාන චරිතවල කැපී පෙනෙන ලක්ෂණ ලේඛන ගත කිරීම**

• මහෞෂධ, කේවට්ට, වේදේහ රජු, චූලනී බ්‍රහ්මදත්ත රජු, තලතාදේවිය, අමරාදේවිය, උදුම්බරා දේවිය, සේනකාදි පඬිවරු

- **කියවන්නාත් අසන්නාටත් ප්‍රිය උපදවන අයුරින් බස් වහර යෙදීම**
- රචනා රීතියේ දක්නට ලැබෙන විශේෂතා පිළිබඳ ව සටහන් තබා ගැනීම.
  - උපමා භාවිතය
  - ශබ්ද ධ්වනිය අනුප්‍රාසය
  - සරල හා සංකීර්ණ වාක්‍ය

- **අවස්ථා නිරූපණයේ ඇති විශේෂතා සාකච්ඡා කිරීම**
  - ධර්ම යුද්ධය
  - විවාහ යෝජනාව සඳහා කේවට්ට බ්‍රාහ්මණයා මහෞෂධ පඬිවරයාගේ නිවසට පැමිණීම.
  - සේනකාදී පඬිවරුන් උමගෙන් යාමට සූදානම් වීම
- නාට්‍යෝචිත අවස්ථා
  - සිරි කාලකණ්ණි ප්‍රශ්නය
  - කාළගෝළ ප්‍රශ්නය

- **රස ජනනය**

- **ශෘංගාර, හාස්‍ය, රෞද්‍ර, භයානක උපහාස හා අද්භූත ආදී සාහිත්‍ය රස උද්දීපනය වන අවස්ථා මතුකර දෙමින් සිසුන්ගේ වින්දන ශක්තිය පුළුල් කිරීම**
  - ගිරා, සැළලිහිණි සංවාදය
  - සතර කන් මන්ත්‍රණය
  - ධර්ම යුද්ධය
  - මියුලු නුවර වැටලීම
  - උමං කර්මාන්තය

1.4 තක්සේරුව / ඇගයීම

■ වාචික ප්‍රශ්න මඟින් දැනුම විමසීම
■ චරිත හා අවස්ථා නිරූපණය පිළිබඳ දැනුම හා අවබෝධය විමසීමට යෝග්‍ය ලිඛිත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
■ මහෞෂධ පඬිතුමාත් කේවට්ට පඬිතුමාත් අතර සංවාදයක් ප්‍රබන්ධ කිරීම
■ සිත්ගත් අවස්ථාවක් වස්තු කරගෙන කෙටි නාට්‍යයක් නිර්මාණය කිරීම හා ඉදිරිපත් කිරීම.
■ සිත්ගත් අතුරු කතාවක් සරල බසින් ලිවීම

1.5 පරිශීලනය

- උමංදා විනිස - සුචරිත ගම්ලත්
- බණ කතා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ
- සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ
- සිංහල සාහිත්‍ය වංශය - පුංචි බණ්ඩාර සන්නස්ගල

# 2 බුදුගුණ අලංකාරය

## 2.1 හැඳින්වීම

කෝට්ටේ යුගයේ සාහිත්‍යය

කෝට්ටේ යුගය (ක්‍රි.ව. 1412 - 1580) සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකේ. ඊට බොහෝ දුරට හේතු වුයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ලෙස කැපී පෙනෙන වර්ධනයක් කාව්‍ය නිර්මාණ අංශයෙහි සිදු වීමය. විශේෂයෙන් සවන සිරි පැරකුම්බාවන්ගේ රාජ්‍ය සමය (ක්‍රි.ව. 1415 - 1467) සාහිත්‍ය උන්නතිය සම්බන්ධයෙන් වැදගත් යුගයකි. රටෙහි දේශපාලන ස්ථාවර භාවයක් තිබීම, රජු උගතෙකු මෙන් ම කවියෙකු ද වීම, කවියන්ට රජුගේ නොමද අනුග්‍රහය ලැබීම, දියුණු තත්ත්වයක පැවති අධ්‍යාපන ආයතන, විද්වත් ලේඛක පරපුරක් බිහිවීම ආදී විවිධ සාධක එම සාහිත්‍ය උන්නතිය සඳහා හේතු වූ බව පැහැදිලි ය.

### 2.1.1 කෝට්ටේ යුගයේ අධ්‍යාපන ආයතන

- කෑරගල පද්මාවතී පිරිවෙන
- තොටගමුවේ ශ්‍රී විජයබාහු පිරිවෙන
- වීදාගම ශ්‍රී ඝනානන්ද පිරවෙන
- දෙවිනුවර තිලක පිරිවෙන
- පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන

### 2.1.2 කෝට්ටේ සාහිත්‍ය යුගය පෝෂණය කළ පඬිවරුඃ

- තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි
- ධම්මදින්නාචාර්ය සිද්ධාර්ථ විමලකීර්ති මාහිමි
- වීදාගම මෛත්‍රෙය මාහිමි
- වැත්තෑවේ හිමි
- දෙවිනුවර තිලක පිරුවන්පති හිමි
- සවන සිරි පැරකුම්බා මහරජු
- නන්නූර් තුනයා මැති
- ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී

### **2.1.3** කෝට්ටේ යුගයේ බිහි වූ කාව්‍ය නිර්මාණ

2.1.3.1 පද්‍ය සාහිත්‍යය

| | | | |
|---|---|---|---|
| • ජාතක කාව්‍ය | - **කාව්‍යශේඛරය** | - | තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | **ගුත්තිල කාව්‍යය** | - | වැත්තෑවේ හිමි |
| • සන්දේශ කාව්‍ය | - **පරෙවි සන්දේශය** | - | තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | **සැලිහිණි සන්දේශය** | - | තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි |
| | **ගිරා සන්දේශය** | - | කර්තෘ අඥාතයි |
| | **හංස සන්දේශය** | - | වීදාගම මෛත්‍රෙය මාහිමි ලෙසඅනුමාන කෙරේ |
| | **කෝකිල සන්දේශය** | - | දෙවිනුවර තිලක පිරුවන්පති හිමි |
| • භක්ති කාව්‍ය | - **බුදුගුණ අලංකාරය** | - | වීදාගම මෛත්‍රය මාහිමි |
| • විරුද කාව්‍ය | - **පැරකුම්බා සිරිත** | - | කර්තෘ අඥාතයි |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ප්‍රසස්ති කාව්‍ය - **එළුසිලෝ ශතකය** - කර්තෘ අඥාතයි
- උපදේශ කාව්‍ය - **ලෝවැඩ සඟරාව** - වීදාගම මෛත්‍රෙය මාහිමි
- කතා කාව්‍ය - **වයන්තිමාලය** - වීදාගම ත්‍රිසිංහල කවිතිලක
- කෝෂ ග්‍රන්ථ - **රුවන්මල් නිඝණ්ඩුව** - සවන පැරකුම්බා රජතුමා
- ඡන්දස් ග්‍රන්ථ - **කව් ලකුණු මිණිමල** - වීදාගම මෛත්‍රෙය මාහිමි
- මාලකාව්‍ය - **දහම් ගැට මාලාව** - වීදාගම මාහිමියන්ගේ කෘතියක් ලෙස අනුමාන කෙරේ.
- අස්න කවි - **කුවේණි අස්න** - උතුරුමුළ මහතෙරිඳු (වෘත්ත ගන්ධි ශෛලිය).

2.1.3.2 ගද්‍ය සාහිත්‍යය

කෝට්ටේ සාහිත්‍ය යුගය පද්‍ය කාව්‍යයේ ස්වර්ණමය යුගයක් ලෙස සලකන තරමට කවිය පිළිබඳ වර්ධනයක් පෙන්නුම් කරන අතර ගද්‍ය සාහිත්‍ය සම්බන්ධයෙන් ද කැපී පෙනෙන යුගයක් නොවේ. එම යුගයේ ලියැවුණු ගද්‍ය ග්‍රන්ථ අතලොස්සකි.

- ගද්‍ය කෘති - **සද්ධර්ම රත්නාකරය**
  **චුල්ලබෝධි වංශය**
  **කඨිනානිසංසය**
  **පංචිකා ප්‍රදීපය**
- සන්න පොත් - **ගණිත සිහ සන්නය**
  **භක්තිශතක සන්නය**
  **කාව්‍යශේඛර සන්නය**
  **දහම්ගැට සන්නය**
- ගැටපද - **කාව්‍යශේඛර ගැටපදය**

2.1.4 බුදුගුණ අලංකාරය - කතුවරයා

ග්‍රන්ථ අවසානයේ සඳහන් වන අන්දමට මෙහි කතුවරයා රයිගම්පුර වීදාගම මහ වෙහෙරවැඩ වාසය කළ මෙත් මහනෙත් පාමුල මහ තෙරිඳු ය. රයිගම වීදාගම මහවෙහෙර කෝට්ටේ යුගයේ පැවති ප්‍රකට විද්‍යා ස්ථානයකි. වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන නමින් ද ප්‍රසිද්ධ එම විද්‍යා ස්ථානය ආරම්භ වූයේ කුරුණෑගල පුර යුගයේ දී ය. මහානේත්‍ර ප්‍රාසාද මූලයෙහි අධිපති වීම එවක සම්මානනීය පදවියක් විය. වීදාගම මෛත්‍රෙය මාහිමියෝ එම පදවියෙන් පිදුම් ලැබූ ශ්‍රේෂ්ඨ පඬිරුවනකි.

**ලෝවැඩ සඟරාව, බුදුගුණ අලංකාරය කව්ලකුණු මිණිමල, දහම්ගැට මාලාව** උන්වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ වන අතර කර්තෘ සඳහන් නොවන හංස සන්දේශය ද උන්වහන්සේගේ නිර්මාණයක් යයි සැලකේ. පත්තිනි දෙවියන් වෙනුවෙන් පැවැත්වෙන ගම්මඩු පුණ්‍යෝත්සවයන්හි දී ගායනා කරන පන්තිස් කෝල්මුර කවි අතර "**දං කටිනය**" හා "**ගජබා පුවත**" වීදාගම මහා මෛත්‍රෙය මාහිමියන් විසින් රචනා කර ඇත.

2.1.4.1 බුදුගුණ අලංකාර කතුවරයාගේ අරමුණ

**බුදුගුණ අලංකාරය** පිළිබඳ හැඳින්වීමක් "සිංහල සාහිත්‍ය රසාස්වාදය" පෙළපොතට ඇතුළත් කර ඇත. බුදුගුණ අලංකාරය සම්බන්ධයෙන් එහි ඇතුළත් මූලික කරුණු තවදුරටත් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමෙන් ඔබට අවශ්‍ය පසුබිම් දැනුම සංවර්ධනය කරගත හැකි වනු ඇත.

වචනාර්ථයෙන් ප්‍රකාශ වන පරිදි බුදුගුණ අලංකාරය බුදුරජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කිරීම සඳහා රචනා කරන ලද්දකි. එය කතුවරයාගේ මුඛ්‍ය අරමුණ වූ බවට සැකයක් නැත. එහෙත් ග්‍රන්ථය රචනා වූ යුගයේ දේශපාලන වාතාවරණය හා සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු සහ ග්‍රන්ථයේ අන්තර්ගත කරුණු අතර යම් සම්බන්ධයක් ඇති බව පෙනෙයි. කිසියම් සමාජ අවශ්‍යතාවක් සපුරාලීම සඳහා ග්‍රන්ථය රචනා කරන්නට ඇති බව අන්තර්ගතය හා සමකාලීන සමාජ ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු කිරීමෙන් හඳුනා ගත හැකි වෙයි.

සවන පැරකුම්බාවන් සමයේ එක් සේසත් කළ ශ්‍රී ලංකාවෙහි සාමකාමී ස්ථාවර දේශපාලන වාතාවරණයක් පැවතුණත් එතුමාගෙන් පසු මේ තත්ත්වය අවුල්වියවුල් වී ගිය බවක් පෙනෙයි. එතුමාගෙන් පසු මේ තත්ත්වය රජ වූ ළදරු ජයබාහු කුමරු (උලකුඩය දේවියගේ පුත්) සිහසුනෙන් නෙරපා සපුමල් කුමාරයා සවන බුවනෙකබාහු නමින් රජ විය. රජ පවුලේ  අභ්‍යන්තර ගැටුම් උත්සන්න වෙමින් පැවතිණ. වීදාගම මෛත්‍රෙය මාහිමියන් **බුදුගුණඅලංකාරය**, රචනා කරන්නේ සවන බුවනෙකබා රජුගේ තුන්වන රාජ්‍ය වර්ෂයේ දී ය. දැහැමි රාජ්‍ය පාලනයක ස්වරූපය පාලකයන්ට හඳුන්වා දීමේ අවශ්‍යතාවක් මතුවන්නට ඇත. රජුන් අද මිටු වූ කල්හි මුළු මහත් රාජ්‍යය ම විනාශ වන බව බුදුගුණාලංකාරයෙන් ප්‍රකාශ වෙයි. ලිච්ඡවී රාජ්‍ය සභාවේ ඇති වන සාකච්ඡාව ඒ සඳහා යොදා ගැනේ. යහපත් ජනසම්මතවාදී රාජ්‍ය පාලනයක පාලකයාගේ භූමිකාව හඳුන්වාදීමක් එයින් සිදුවෙයි. එසේ නම් කාලීන දේශපාලන ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින් රාජ්‍යානුශාසනාවක් කිරීම කතුවරයාගේ අරමුණක් වූ බව පෙනෙයි. විශාලා මහනුවර තුන්බිය පිළිබඳ සිද්ධිය කතුවරයා ඊට උචිත ප්‍රස්තුතයක් බවට පත් කර ගෙන ඇත.

රජු අධාර්මික වීම රාජ්‍ය පාලනය බිඳ වැටී රට විනාශයට පත්වීමට හේතුවක් වන බව ලිච්ඡවී රජු මඟින් ප්‍රකාශ කරන්නේ කතුවරයා ජීවත් වූ යුගයේ පාලකයන්ට ද යම් ඉඟියක් සපයමිනි.

රජුන් අද මිටු ව ත්
වෙති මැතිඳෝ ද එපව ත්
දැක උන්ගේ පව ත්
බමුණු ගහපතියෝ ද එ ගනි ත් (104)

ලිච්ඡවී රජුන්ගේ දැහැමි රාජ්‍ය පාලනය පිළිබඳ තොරතුරු 38 සිට 76 දක්වා පද්‍යවලින් ප්‍රකාශ වෙයි. වර්ධනය වෙමින් පැවති අයහපත් දේශපාලන පසුබිම පිළිබඳ ව කතුවරයන් වහන්සේ මනා සංවේදී බවකින් යුක්ත ව සිටි ආකාරය මෙයින් පැහැදිලි වේ.

එවක සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ ව විමසන විට ද **බුදුගුණ අලංකාර** කවියා යුගයේ අවශ්‍යතාවක් සපුරාලීම තම අරමුණක් කර ගෙන ඇති බව පෙනෙයි. පොළොන්නරු යුගයේ සිට ම වර්ධනය වෙමින් පැවති හින්දු භක්තිවාදය මේ වන විට ජන ආගම හා බැඳී දෙවි දේවතාවන්ගේ බල පරාක්‍රමය බෞද්ධ වන්දනාමාන දක්වා ව්‍යාප්ත ව ගොස් තිබුණු බවට සාධක ඇත. විශේෂයෙන් ආගම් හා බැඳුණු ශිව විෂ්ණු වැනි දෙවිවරු විෂයෙහි පුද පූජා ප්‍රචලිත ව පැවති බව කෝට්ටේ යුගයේ ලියැවුණු සන්දේශ කාව්‍යවලින් ද පැහැදිලි වෙයි. දෙවියන් හා ඔවුන් වෙනුවෙන් කරන ලද පුද පූජා නිර්දය ලෙස උපහාසයට ලක් කරමින් විවේචනයට හසු කිරීමට **බුදුගුණඅලංකාර** කතුවරයා එඩිතර වී ඇති අයුරු 134 සිට 183 දක්වා පද්‍යවලින් පැහැදිලි වෙයි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

2.1.5 බුදුගුණ අලංකාරය - අන්තර්ගතය

2.1.4.1 බුදුගුණ අලංකාරය - අන්තර්ගතය

- තෙරුවන් නැමදීම හා අරමුණ පැහැදිලි කිරීම (01 - 09)
- විසල්පුර වැණුම (10 - 36)
- ලිච්ඡවී රජ වැණුම (37 - 77)
- විශාලා නුවර තුන්බිය (වැණුම) (78 - 101)
- තුන්බිය ඇති වීමට හේතු- සොයා බැලීම (102 - 120)
- තුන්බිය දුරු කිරීමේ මං සෙවීම (121 - 185)
- බුදු ගුණ වැණුම
  - බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය (186 - 261)
  - නව අරහාදි බුදු ගුණ (262 - 271)
  - මහා පුරුෂ ලක්ෂණ (272 - 305)
  - බුදු සිරිතේ අසිරිය (306 - 329)
  - විසල් පුරයට වැඩම වීම දක්වා බුදු සිරිත (330 - 433)
- විසල් පුරයට වැඩම වීම (434 - 565)
- තුන්බිය දුරු කිරීම (366 - 600)
- කතුවරයාගේ අනුශාසනාව (601 - 608)
- කර්තෘ සන්දර්ශන කවි (609 - 611)

2.2 අභිමතාර්ථ

- කෝට්ටේ යුගයේ සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු රැස් කිරීම
- **බුදුගුණ අලංකාරය** සම්භාව්‍ය කාව්‍ය ග්‍රන්ථයක් ලෙස හඳුනා ගැනීම
- බුදුගුණ අලංකාරයේ කතුවරයන් වහන්සේගේ වෙනත් සාහිත්‍ය නිර්මාණ හඳුනා ගැනීම
- **බුදුගුණ අලංකාරයේ** අරමුණු හඳුනා ගැනීම
- **බුදුගුණ අලංකාරයේ** අන්තර්ගතය වටහා ගැනීම
- **බුදුගුණ අලංකාරයේ** සාහිත්‍යමය අගය විමසීම
- භක්ති කාව්‍යයක් සහ විරෝධ කාව්‍යයක් ලෙස **බුදුගුණ අලංකාරය** අගය කිරීම
- **බුදුගුණ අලංකාරයේ** ඇතුළත් දේශපාලන, සමාජ, සංස්කෘතික තොරතුරු හඳුනා ගැනීම
- **බුදුගුණ අලංකාරයේ** ඇතුළත් විවිධ විරිත් හඳුනා ගෙන ඒ අනුව කවි ගායනා කිරීම

2.3 අභිමතාර්ථ සාධනය

2.3.1 ප්‍රවේශය

- **බුදුගුණ අලංකාරය** අදීන ලක්ෂණවලින් යුත් උපහාසාත්මක කාව්‍යයක් ලෙස හඳුන්වා දීමෙන්
- හෙළ බසෙහි හා කවියෙහි මිහිර අත්විඳීමට අවස්ථාවක් සැලසීමෙන්
- සම්භාව්‍ය පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීමෙන්

ආදී සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න. ග්‍රන්ථය හැදෑරීම පිළිබඳව සිසුන් තුළ ඇල්මක් හා උනන්දුවක් ඇති කරනසුලු ප්‍රවේශයක් තෝරා ගැනීම අවශ්‍ය යි. අන්තර්ගතය වැණුම් වශයෙන් වෙන් කොට ගෙන පාඩම් සැලසුම් කර ගැනීම සුදුසු ය. එක් එක් පාඩම් සඳහා සුදුසු පරිදි ප්‍රවේශයක් ලබා ගන්න.

2.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි ශබ්ද නඟා තාලානුකූල ව කියවීම සඳහා සිසුන් යොමු කිරීම
- එක් එක් වැණුම පිළිබඳ රස විඳීමක යෙදෙමින් ප්‍රස්තුතය අරමුණ, සංකල්ප රූප, භාෂාව, වර්ණනා රීතිය ආදී කරුණු මතු කර දැක්වීම
- **බුත් සරණෙහි** "ගංගා රෝහණ කථා" පරිච්ඡේදය කියවා කතුවරයා විසින් එමගින් ලබා ඇති ආභාසය අදාළ වර්ණනාවන්හි දී යොදා ගෙන ඇති අයුරු පැහැදිලි කිරීම
- අර්ථාවබෝධයට දුෂ්කර වචනවල හා වෙනත් විශේෂ යෙදුම්වල අරුත් පැහැදිලි කිරීම.(පදගතාර්ථ පෙළපොතෙහි දක්වා ඇත).
- කෝට්ටේ යුගයේ සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු විස්තර කිරීම
- **බුදුගුණ අලංකාර** කතුවරයා හා උන්වහන්සේගේ සාහිත්‍ය කෘති පිළිබඳ තොරතුරු පැහැදිලි කිරීම
- ග්‍රන්ථය ඇසුරින් කතුවරයාගේ අරමුණ පැහැදිලි කිරීම
- **බුදු ගුණ අලංකාරයේ** අන්තර්ගතය සංක්ෂේපයෙන් දැක්වීම
- **බුදුගුණ අලංකාරයේ** සාහිත්‍යමය අගය විමසීම
  එක් එක් වර්ණනාවට අදාළ ව.
  - වර්ණනාවන්හි ඇතුළත් කරුණු හඳුනා ගැනීම
  - කතුවරයාගේ අරමුණ පැහැදිලි කිරීම
  - යොදා ගන්නා විරිතෙහි උචිත බව හඳුනා ගැනීම
  - යොදා ගන්නා උපමා රූපක ආදී සංකල්ප රූපවල උචිතානුචිත බව සහ අපූර්වත්වය හඳුනා ගැනීම
  - යොදා ගන්නා භාෂාවේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම
  - විවිධ සාහිත්‍ය රස ඉස්මතු කොට දැක්වීම
- භක්ති කාව්‍යයක් උපහාස කාව්‍යයක් වශයෙන් **බුදුගුණ අලංකාරයේ** අගය විමසීම
  - කතුවරයාගේ අරමුණ
  - ආකෘතික ලක්ෂණ (ග්‍රන්ථයේ සැලැස්ම)
  - අන්තර්ගතය
  - වර්ණනා ශෛලිය
  - භක්තිය/ උපහාසය දැනවීම - යනාදී කරුණු අධ්‍යයනය කිරීම.
- අවස්ථා නිරූපණයේ දී කතුවරයා දක්වන කුසලතාව හඳුනා ගැනීම.
  - තුන්බිය
  - බුදුවීම
  - රජගහනුවරට වැඩමවීම
  - වේළුවන පූජාව
  - ගංගා රෝහණ පූජාව ආදී වර්ණනාවන් ඇසුරින්.
- යහ පාලනයක ලක්ෂණ හඳුනා ගැනීම
  - ලිච්ඡවී රාජ වර්ණනාව ඇසුරින්
- සමාජ සංස්කෘතික තොරතුරු හඳුනා ගැනීම:
  - නිවටුන්, බමුණන්, දෙවියන් හා පුද පූජා පිළිබඳ ව එන තොරතුරු ඇසුරින්
- බුදු ගුණ අලංකාරයේ ඇතුළත් විවිධ විරිත් හඳුනා ගෙන ඒ අනුව තාලානුකූලව කවි ගායනා කිරීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

2.4 තක්සේරුව / ඇගයීම

- කෝට්ටේ යුගයේ සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීමට උචිත පැවරුමක්
- වීදාගම මහා මෛත්‍රෙය මාහිමියන් සහ උන්වහන්සේගේ කෘති පිළිබඳ තොරතුරු ඇතුළත් බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීම
- කතුවරයාගේ අරමුණු පැහැදිලි කිරීමට අදාළ තොරතුරු දැක්වීම
- **බුදුගුණ අලංකාරය** භක්ති කාව්‍යයක් උපහාසය කාව්‍යයක් ලෙස අගය කිරීමට යෝග්‍ය පැවරුමක්
- **බුදු ගුණ අලංකාරයේ** ඇතුළත් රාජ්‍ය පාලනයට අදාළ තොරතුරු වර්තමාන රාජ්‍ය පාලනය හා සැසඳීමක් පිළිබඳ විමසීමක්
- **බුදුගුණ අලංකාර** කතුවරයාගේ අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ ඇගයීමක්
- **බුදු ගුණ අලංකාරයේ** ඇතුළත් වර්ණනාවන්හි සාහිත්‍ය අගය විමසීමට සුදුසු පැවරුමක්
- කතුවරයාගේ ස්වාධීන ලක්ෂණ පැහැදිලි කරමින් කරුණු දැක්වීම
- කවියා යොදාගත් විශේෂ කාව්‍යෝපක්‍රම විභාග කිරීම
- තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් කවි ගායනා කිරීම

2.5 පරිශීලනයට

සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
කෝට්ටේ යුගය - කේ.ඩී.පී. වික්‍රමසිංහ
බුත්සරණ (ගංගා රෝහණ කථා)

## 3 පෙත්සම

### 3.1 හැඳින්වීම

නුවර කලාවියේ පරිපාලන නිලධාරියෙකු ලෙස සේවය කළ ලීල් ගුණසේකර මහතා කලාගම් පළාතේ සමාජ ආර්ථික පරිසරයෙන් ලද අත්දැකීමක් පෙත්සම නව කතාවට විෂය කර ගෙන ඇත. පෙත්සම බස්වහර හා කතා රටාව අතින් සිංහල නවකතා ක්ෂේත්‍රයට 60 දශකයේ එක් වූ අමුතු ආරක් ගත් නවකතාවකි. මෙය කලාගම් පළාතේ සියඹලාව ගම කේන්ද්‍ර කර ගෙන ඇත. එහි ජනතාව ස්වභාවය ධර්මයේ අභියෝග හා නිලබල පැලැන්තියේ පීඩනයන් මැද ගත කළ වේදනාකාරී දිවි පෙවෙත කතාවෙන් විස්තර වේ.

ගැමි ජන ජීවිතය උරුම කොටගත් ආර්ථික දුෂ්කරතා, ඇවතුම් පැවතුම්, අන්‍යෝන්‍ය සබඳතා හා බැඳුණු සාරධර්ම ඔස්සේ කතාව විකාශනය වෙයි. විවිධ චරිත සමායෝජනයෙන් තිලකරත්නගේ චරිතය මැනවින් ගොඩනගා ඇත. ජන ව්‍යවහාරයන් ද කැටි කොට ගත් බස්වහර ද සරල රචනා රීතිය ද රසිකයා නවකතාව වෙත ඇද බැඳ ගැනීමට සමත් ය. එය රස වින්දනය තීව්‍ර කිරීමට ද හේතු වේ. යොවුන් සාහිත්‍ය නිර්මාණයක් සේ සැලකිය හැකි පෙත්සම සිසුන්ගේ නිර්මාණ හැකියා වර්ධනයට ද පාදක කොට ගත හැකි ය.

### 3.2 අභිමතාර්ථ

- පරිසරයෙන් ලබන කවර අත්දැකීමක් වුව ද සරල ලෙසත්, අපූර්ව ලෙසත් ඉදිරිපත් කළ හැකි බව අවබෝධ කර ගැනීම.
- කෙටි පරිච්ඡේද, සරල බස් වහර හා රචනා රීතිය මඟින් ප්‍රබලවූත්, සිත් ගන්නා සුලු වූත්, කතා විකාශනයක් ගොඩ නැගෙන බව දැන ගැනීම
- නුවර කලාවියේ ගමක සමාජ ආර්ථික පසුබිම ගැමියන් හා රාජ්‍ය නිලධාරීන් අතර පැවති සබඳතා හඳුනා ගැනීම
- විවිධ දුෂ්කරතා මැද ජීවත් වෙමින් උත්සාහය හා කැපවීම මඟින් අපේක්ෂා ඉටුකර ගත් තිලකරත්නගේ චරිත ස්වභාවය හඳුනා ගැනීම හා එය ආදර්ශයක් සේ සැලකීමට පෙළඹීම.
- ගැමි සමාජ සාරධර්ම හඳුනා ගෙන ඒවා අගය කිරීම
- සරල ජීවන පුවත් වස්තු කර ගෙන නිර්මාණ කිරීමේ ශක්‍යතා වර්ධනය කර ගැනීම.

### 3.3 අභිමතාර්ථ සාධනය

#### 3.3.1 ප්‍රවේශය

- සිසුන් පෙත්සම නව කතාව කියවීමේ දී ජනිත වූ හැඟීම් පිළිබඳ ව විමසන සාකච්ඡාවකින්
- ගුරු භවතාගේ අත්දැකීම් හා රුචිය මත මීට වෙනස් ක්‍රමයකට වුවද ප්‍රවේශ විය හැකිය.

#### 3.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පාඩමේ පරිච්ඡේද කිහිපයක් නිහඬ ව කියවා ගැනීමට සිසුන් යොමු කිරීම. එසේ කියවීමේ දී පහත සඳහන් තොරතුරු පිළිබඳ ව අවධානය යොමු කරවීම.
  - සිත් ගන්නා සුලු වැකි හා ප්‍රකාශ
  - ආර්ථික තොරතුරු
  - ජන ජීවිතයේ විවිධ ක්‍රියා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- නිලධාරීන් හා ඔවුන්ගේ ගති පැවතුම්
- සොබා දහමේ අභියෝග
- තිලකරත්නගේ චරිත ස්වභාවය
- පන්සලේ හාමුදුරුවන් හා පාසලේ මුල්ගුරු තුමා සමාජය සමඟ පැවති සබඳතා
- ගැමි ජන බස්වහර
- සමාජ සාර ධර්ම
- අතුරු කතා

3.3.2.1 සිත් ගන්නා සුලු වැකි හා ප්‍රකාශ

ගමේ වැව වාං දැමීම ඉතා ම සිරියාවන්ත යි. අපේ ගමේ කවුරුත් එකවරම සිනහ වන්නාක් මෙන් වැව පිරී ඉතිරී වානෙන් වතුර ඇදහැලේ.

3.3.2.2 ආර්ථික තොරතුරු

- කුඹුරු හා හේන් වගා විනාශ වීම නිසා ජන ජීවිතයේ කඩා වැටීම්
- රජයේ රැකියා
- නීති විරෝධී ධනෝපායන මාර්ග

3.3.2.3 ජන ජීවිතයේ විවිධ ක්‍රියා

- ඥාතිත්වය
- සාමූහිකත්වය
- විරෝධාකල්ප
- සරල ජීවන පැවැත්ම
- ගමන්බිමන්
- විවිධ දුෂ්කරතා

3.3.3.4 නිලධාරීන් හා ඔවුන්ගේ ගති පැවතුම්

- හිටපු විදානේ
- විදානේ
- සමූපකාර මැනේජර්
- වැව් ලේකම්
- උපදිසාපති

3.3.3.5 සොබා දහමේ අභියෝග

- නියඟ
- වැස්ස
- වනය

3.3.3.6 තිලකරත්නගේ චරිත ස්වභාවය

- බාල කාලයේ හැසිරීම්
- ඉගෙනීමට දැක් වූ ආශාව
- විවිධ රැකියාවල යෙදීම
- ගුරුවරයෙකු වීම

3.3.3.7 පන්සලේ හාමුදුරුවන් හා පාසලේ මුල් ගුරුතුමා ගැමියන් සමඟ පැවැති සබඳතා

- ගැමියන් මුහුණ පෑ දුෂ්කරතා මඟහරවා ගැනීමට දායක වීම
- ඔවුන් කෙරෙහි ගැමියන් දැක් වූ ගෞරවය

3.3.3.8 ගැමි ජනබස් වහර

වාන, මේසැරේ, එතකොට, හැටියට, බවුන්දලා, පැටියෝ ආදී ජන වහරට සමීප වදන්.

3.3.3.9 සමාජ සාර ධර්ම
- වැඩිහිටියන්ට ගරු සරුවීම
- දෙමාපියන් හා දරුවන් අතර බැඳීම
- ආගමට ඇති බැති බර බව
- අසරණයන්ට පිහිට වීම
- චාම් සරල ජීවිතය

3.3.3.10 අතුරු කතා
- ධාතුසේන රජු කලා වැවේ බැම්මට සම කළ බව
- ජයශ්‍රී මහා බෝධීන් වහන්සේට නිගරු කළ කෙනෙකු දඬුවම් විඳීම

3.4 තක්සේරුව / ඇගයීම

- වාචික ප්‍රශ්න මඟින් කතාවේ අන්තර්ගතය පිළිබඳ අවබෝධය විමසීම
- වස්තු විෂය, කතා විකාශනය, චරිත නිරූපණය හා බස්වහර පිළිබඳ දැනුම කුසලතා හා ආකල්ප විමසා බැලීමට යෝග්‍ය ලිඛිත ප්‍රශ්නවලට පිළිතුරු දීමට සැලැස්වීම.
- සරල සිදුවීම් පාදක කොට ගෙන නිර්මාණ කිරීමට යොමු කෙරෙන නිර්මාණාත්මක රචනා ඇගැයීම

3.5 පරිශීලනය
- අත්සන - ලිල් ගුණසේකර

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## සිංහල පද්‍ය කාව්‍යයේ ආරම්භය හා විකාශනය

සිංහල කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භය අනුරාධපුර යුගය දක්වා ඈතට විහිද යන්නකි. අද දක්වා බිහි වූ නිර්මාණ තුළින් දේශජ කවිත්වයක විශිෂ්ට මං සලකුණු ප්‍රකට කරයි. මුලින් ම අපේ අවධානයට යොමු වන්නේ සීගිරි ගී ය. සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් සිය ගණනක් පුද්ගලයන් විසින් මෙහි එන ගී රචනා කරනු ලැබ ඇත. සාමාන්‍ය ජනයා පවා පුළුල් සාහිත්‍ය ඥානයකින් කටයුතු කළ බව එයින් පැහැදිලි වෙයි. පවුරක ලියැවුණු මේ ගී හැරෙන්නට ග්‍රන්ථාරූඪ වූ පොතක් ලෙස අපට හමුවන්නේ **සියබස්ලකරයි.** එය කාව්‍යකරණය සඳහා අවශ්‍ය උපදේශ සංග්‍රහයකි. පොළොන්නරු සාහිත්‍ය යුගය වන විට **සසදාවත, මුවදෙව්දාව** නම් උසස් කාව්‍ය කෘති දෙකක් බිහි විය. ගී චරිත යොදාගත් මේවා අද දක්වා අතිශය සම්භාවනාවට ලක් වූ කෘති ය. සිංහල ගී කාව්‍යයේ විශිෂ්ට මං සලකුණු තැබූ "**කව්සිළුමිණ**" නම් මහා කාව්‍යය බිහිවන්නේ දඹදෙණි රාජ්‍ය යුගයේ දී ය. ඉන් අනතුරු ව අපට පද්‍ය කෘති හමුවන්නේ ගම්පල යුගයේ දී ය. ඒ **මයුර සන්දේශය** හා **තිසර සන්දේශයයි.**

සිංහල පද්‍ය සාහිත්‍යයට විවිධ අංග එකතු වූ යුගයකි කෝට්ටේ සාහිත්‍ය අවදිය. **දහම්ගැට මාලය, එළුසිලෝශතකය, කව්ලකුණු මිණිමල, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව, ගුත්තිල කාව්‍යය, පැරකුම්බා සිරිත, පරෙවි සන්දේශය, කෝකිල සන්දේශය, සැළලිහිණි සන්දේශය, ගිරා සන්දේශය, හංස සන්දේශය**, ආදී සන්දේශ, ප්‍රශස්ති, ගී, උපදේශ, බුදුගුණ කාව්‍ය කීපයක් ම මෙකල රචනා විය. **කාව්‍යශේඛරය** නම් විශිෂ්ට ගණයේ මහා කාව්‍යය ද බිහි වූයේ මේ යුගයේ දී ය. එනිසා පද්‍ය සාහිත්‍යයේ වඩාත් අවධානයට ලක් වූ කාලයක් ලෙස කෝට්ටේ යුගය හැඳින්විය හැකි ය.

**සැවුල් අස්න, දහම් සොඬකව, කුසදා කව, සුභාෂිතය, කුස්තන්තීනු හටන** යනාදී කාව්‍ය ග්‍රන්ථ බිහි වන්නේ අනතුරු ව එන සීතාවක යුගයේ දී ය. මහනුවර අවදිය වන විට ද වැඩි පද්‍ය කෘති සංඛ්‍යාවක් අපට හමුවේ. **මහාපදරංග, විදුර, පද්මාවතී, සම්බුලා** වැනි ජාතක කාව්‍ය ද **මන්දාරම්පුර පුවත** වැනි ඉතිහාස කාව්‍යය ද හටන් කාව්‍යය ද, **යසෝදරාවත, තුන්සරණය** වැනි කාව්‍යය ග්‍රන්ථ ද මේ යුගය නියෝජනය කරන කෘති ය. මාතර යුගයේ කවිය ද මීට සමාන්තර ව සිංහල පද්‍ය සාහිත්‍යයට වඩාත් වැඩි සේවයක් සිදු කළේ ය. මාතර යුගයේ දී **ගංගා රෝහණ වර්ණනාව, කව්මිණ කොඬල, රතවතී කාව්‍ය, දුනුවිල හටන, නීල කොබෝ සංදේශය, අලු කොබෝ සංදේශය,** වැනි සංදේශ කෘති බිහිවිය.

මේ යුගයේ ගජමන් නෝනා, රංචා ගොඩ ළමයා වැනි කිවිඳියන් සිටීම විශේෂ ලක්ෂණයක් විය. විසිවන සියවස වන විට කොළඹ කවිය ඇරඹෙයි. විවිධ තේමාවන් හා නව අත්හදා බැලීම් රැසක් ඔස්සේ සංවර්ධනය වූ මේ කවි යුගය අධ්‍යයනයේ පහසුව සඳහා කොටස් කරගත හැකි ය.

- විසිවන සියවසේ සිංහල කවියේ ප්‍රථම භාගය
- විසිවන සියවසේ සිංහල කවියේ ද්විතීය භාගය
- විසිවන සියවසේ සිංහල කවියේ තෘතීය භාගය
- විසිවන සියවසේ සිංහල කවියේ චතුර්ථ භාගය

යනුවෙන් වර්ග කළ හැකි අතර, ඇතැමෙක් පහත සඳහන් පරිදි ද වර්ග කරති.

- කොළඹ යුගයේ මුල්/ වැඩිහිටි කවි පරපුර
- කොළඹ යුගයේ දෙවැනි / තරුණ කවි පරපුර
- හෙළ හවුලේ කවිය
- නිදහස් / නිසඳැස් කවි පරපුර යනුවෙනි.

ස්වාධීන ජාතික චින්තනයක අවශ්‍යතාවන් මුදුන් පමුණුවා ගැනීම් වස්, දේශාභිමානී හැඟීම් ජනනය කළ කවි රචනා කිරීමට කොළඹ කවියේ මුල් නිර්මාණ කරුවෝ උත්සාහ ගත්හ. එස්. මහින්ද හිමි, ආනන්ද රාජකාරුණා, පී.එච්. පෙරේරා වැනි කවීහු ප්‍රමුඛත්වය ගත්හ. **ලංකා මාතා, නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය, ලංකාඩම්බරය, නමෝ මාතා** යනු ඒ මඟ ගත් නිර්මාණ කීපයකි. ස්වභාව සෞන්දර්යය, ආලය, ස්ත්‍රිය, ආදී තේමාවන් මුල්කරගත් රචනා ද මොවුහු නිර්මාණය කළහ. මීට අමතර ව ළමා කාව්‍ය රචනය කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කර ඇත. **හඳ, ගඟ, හිරු, තාරකා, කුරුල්ලෝ, සමනලයා, ජාතික තොටිල්ල, කඳුකර දර්ශන,** වැනි නිර්මාණ ඒ අතර වඩාත් ප්‍රචලිත ය. භාෂාව, උපමා රූපකාදිය නැවුම් රසස්වාදයක් ජනිත කිරීමට සුදුසු පරිදි මේවායේ භාවිත ව ඇත.

විසිවන සියවසේ සිංහල කවියේ ද්විතීය භාගය, නියෝජනය කරන්නෝ තරුණ කවීන් යනුවෙන් හැඳින් වූ පී.බී. අල්විස් පෙරේරා, විමලරත්න කුමාරගම, සාගර පලන්සූරිය (කේයස්) , මීමන ප්‍රේමතිලක, එච්.එම්. කුඩලිගම, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, කපිල ඊ. සෙනෙවිරත්න උඳුගොඩ නවරත්න, උපනන්ද බටුගෙදර, යූ.ඒ.එස්. පෙරේරා, බැන්ටිස් රණවීර, ධර්ම ශ්‍රී කුරුප්පු, බී.එච්. අමරසේන, යනාදීහු ය. ඔවුහු සමකාලීන සමාජ වාතාවරණය තුළ තිබූ සමාජ ප්‍රබලතා මෙන් ම දුබලතා ද, සමාජ අසාධාරණය, පන්ති අරගලය වැනි අනුභූතීන් ස්වකීය නිර්මාණවලට පාදක කර ගන්න. එපමණක් ද නොව කාන්තාව ආදරය, ස්වභාව සෞන්දර්යය, ගම්බද සිරියාව වැනි තේමා ද මාතෘකා විය. සමකාලීන ඉංග්‍රීසි පද්‍ය සාහිත්‍යයෙහි ද ආභාසය ලබමින් නිර්මාණය කළ කවි කතා කීපයක් ද මොවුන් අතින් බිහි විය. **සුදෝසුදු, කිරිහාමි, සොහොන් බිම, පාලුගම, සපුමලී** ආදී කෘති ඒ අතර ප්‍රධාන ය.

මේ යුගයේ දී හෙළ හවුලේ කවිය ද ප්‍රචලිත විය. කුමාරතුංග මුනිදාස, රැපියෙල් තෙන්නකෝන්, අනඳපිය කුඩාතිහි ආදී කවීහු මෙම නිර්මාණයන්හි ප්‍රමුඛයෝ වූහ. සමකාලීන සමාජ වාතාවරණයෙන් ගත් අනුභූතීන් කෙරෙහි ද භාෂාව මෙන් ම කාව්‍ය ආකෘතිය කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරමින් ලියූ **වවුලුව, කුකුළු හැවිල්ල, පිය සමර,** යන කෘති වඩාත් ජනප්‍රිය විය. "**උදය, දොරට වැඩුම, හාවා, නැළවිල්ල**" යන ළමා නිර්මාණ බිහි කරමින් දියුණු ළමා සාහිත්‍යයක ලකුණු ද ප්‍රකට කෙරිණ.

නිදහස්/ නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය ගැන වැඩි අවධානයක් යොමු කළ අවධිය ලෙස චතුර්ථ භාගය සඳහන් කළ හැකි ය. මේ යටතේ නව අත්හදා බැලීම් කළ කවීහු කීපදෙනෙකි. ජී.බී. සේනානායක, සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර, මහගම සේකර, යනාදීහු ප්‍රමුඛයෝ වූහ. භාෂාව ආකෘතිය මෙන් ම වස්තු විෂයයන්හි ද වෙනස්කම් කිරීමට ඔවුහු පසුබට නොවූහ. ආදරය, කාන්තාව, සොබා සොඳුරු බව පමණක් නොව පරිසර විනාශය, සමාජ අසාධාරණකම්, ජීවන ගැටලු, පන්ති අරගලය, නව යටත් විජිත වාදය, කම්කරු ප්‍රශ්න ආදිය ද ස්වකීය කාව්‍ය තේමාවන් බවට පත් විය. මේ සම්ප්‍රදාය ගුරු කොට ගත් බොහෝ දෙනෙක් නිසඳැස් නිර්මාණකරණයට පිවිසියහ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- කාව්‍ය රසාස්වාදය

රස විඳීමේ ලැදිකම සෑම මිනිසකු තුළ ම ස්වභාවයෙන් පවතී. එසේ නොවුණ හොත් බිහි වන්නේ රසහීන සමාජයකි. එයින් සමාජ සුන්දරත්වය සේ ම සංස්කෘතික දියුණුවක් අපේක්ෂා කළ නොහැකි ය. සමාජය තුළ පවත්නා විවිධ වූ කරුණු කවියෙකුට සිය නිර්මාණකරණය සඳහා අත්දැකීම් බවට පත් කර ගත හැකි ය. ඒවා යම් අපූර්වත්වයකින් යුතු ව ඉදිරිපත් කරන විට රස ජනනය වෙයි. එම රසය අදාළ නිර්මාණයේ අර්ථයෙහි මෙන් ම ශබ්දයෙහි ද තිබිය යුතු ය. රස තීව්‍ර කර ගැනීමට අවශ්‍ය වූ විට කවියාට යම් යම් උපක්‍රම භාවිත කළ හැකි ය. භාෂා භාවිතය, ආකෘති තෝරා ගැනීම, උපමා රූපකාදිය භාවිතය ඒ අතර ප්‍රධාන වෙයි. මේවා භාවිතයෙන් සහෘදයාට සියුම් ව ආමන්ත්‍රණය කිරීමට කවියා උත්සාහ ගනී. නිර්මාණයේ රසවත් බව රැක ගැනීම ද වඩාත් වැදගත් වෙයි. භාෂා ව්‍යවහාරය නිර්මාණ වස්තු බීජයට ගැළපෙන සේ යොදා ගැනීම, අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කිරීම හා උචිත ආකෘතියක් (සිව්පද, ගී, නිසඳැස් ආදී) යොදා ගැනීම ද මෙම රසවත් බවට හේතුවෙයි. මේ කරුණුවලට හා නිර්මාණයෙන් හෙළිවන ජීවන දෘෂ්ටිය ගැන ද අවධානය යොමු කරමින් සාහිත්‍ය රසාස්වාදයෙහි යෙදිය හැකි ය.

- පද්‍ය නිර්මාණ රසවිඳීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු

"සිංහල සාහිත්‍ය රසාස්වාදය" ග්‍රන්ථයේ ඇතුළත් කවි පන්ති අධ්‍යයනයේ දී හා රසවිඳීමේ දී පහත දැක්වෙන අභිමතාර්ථ සාධනය අපේක්ෂා කෙරේ. එක් එක් කවි පන්තියට සුවිශේෂ ව එම අභිමතාර්ථ හඳුනා ගෙන ඒ අනුව ඉගෙනුම් ක්‍රියාවලිය සැලසුම් කරගන්න.

- කාව්‍ය සම්ප්‍රදාය හඳුනා ගැනීම
- කවියා, ඔහුගේ නිර්මාණ සහ සාහිත්‍ය යුගය පිළිබඳ අවබෝධය
- කාව්‍යානුභූතිය වටහා ගැනීම (අත්දැකීම / වස්තු විෂය)
- කාව්‍යයේ ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම
- කවියාගේ අරමුණ හඳුනා ගැනීම
- කාව්‍යෝපක්‍රම හඳුනා ගැනීම
- කවියාගේ නිර්මාණාත්මක කුසලතා අගය කිරීම
- කවියාගේ ජීවන දෘෂ්ටිය අවබෝධ කර ගැනීම
- කවි ගායනා කිරීමේ කුසලතා වර්ධනය කර ගැනීම

4.2.2 අභිමතාර්ථ

- පැරණි අධ්‍යාපන ක්‍රමයේ ස්වරූපය අවබෝධ කර ගැනීම
- ගිහි ජීවිතයේ පවත්නා දුෂ්කරතා වටහා ගැනීම
- ශිෂ්‍යයා තුළ පැවතිය යුතු ගුරු භක්තිය හා දෙවියන් පිළිබඳ විශ්වාස තේරුම් ගැනීම
- එවක ශිෂ්‍යයා හා වාර්තමාන ශිෂ්‍යයා අතර ඇති වී ඇති අවංක බව නිර්ව්‍යාජත්වය හා කැපවීම විමසා බැලීම
- කවිවල වචනාර්ථ හා අදහස් නිවැරදි ව තේරුම් ගැනීම

4.2.4 තක්සේරුව / ඇගයීම

- රසවත් යෙදුම් හා ව්‍යාංගාර්ථ මතු කරමින් ඒවා රසවත් වූ අයුරු පැහැදිලි කරන්න.
- ගුරුවරයා හා ශිෂ්‍යයා, ඉගෙනීමේ අගය ආදී තේමා ඔස්සේ කවි කිහිපයක් රචනා කරවීම.
- සාම්ප්‍රදායික අධ්‍යාපනය හා නූතන අධ්‍යාපනය යන මැයෙන් විවාදයක් පැවැත්වීම

4.2.5 පරිශීලනය

- **නම් පොත හා මගුල් ලකුණ**
- **සුභාෂිතය**

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.1 වෙස්සන්තර ජාතක කාව්‍යය

### 4.1.1 හැඳින්වීම

මහනුවර යුගයේ විසූ නිර්නාමික කවියෙකුගේ නිර්මාණයක් සේ සැලකෙන **වෙස්සන්තර ජාතක** කාව්‍යය පොදු ජනතාව අතර බෙහෙවින් ජනප්‍රිය වූ කාව්‍යයකි. මෙය කොතරම් ජනප්‍රිය වී ද යත් මළ ගෙවල ගායනයට පවා යොදාගත් බව පෙනේ. බෝසත් සිරිත කාව්‍යයට නැගීමට ප්‍රිය කළ කවියෙකු ජාතක පොතේ එන වෙස්සන්තර ජාතකය සිය කාවයයට වස්තු කර ගෙන තිබේ. බුදුරජාණන් වහන්සේගේ දාන පාරමිතාව පොදු ජනතාවට හඳුන්වා දීම කවියාගේ අරමුණ වී ඇති බව පෙනේ. ඊට උචිත පරිදි සරල බස් වහරකින් හා රීතියකින් ලියා ඇති මෙය නොතිත් ආශාවකින් කියවිය හැකි නිර්මාණයකි. ඇතැම් තැනක දක්නා ලැබෙන පුනරුක්තිය හා වාර්තා ස්වරූපය කවියාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වයට හානියක් වී නොමැත. සිංහල සාහිත්‍යය හා රසාස්වාදය ග්‍රන්ථයේ ඇතුළත් ව ඇති සම්මා සම්බුදු වනදා නිවන් දකින් අම්මා කවි පන්තිය එවැන්නකි. එය මව් සෙනෙහස පිළිබඳ කදිම චිත්‍රයක් ද මවන්නකි.

### 4.1.2 අභිමතාර්ථ

- දන්දීමේ අගය පැවසීමේ දී වෙස්සන්තර ජාතක කාව්‍ය කතුවරයා විශේෂ තැනක් ගන්නා බව අවබෝධ කර ගැනීම
- දරුවන් හා මව අතර ඇති සෙනෙහස, දරුවන් මව පිළිබඳ ව සිතන ආකාරය අවබෝධ කර ගැනීම
- දන්දීමේ ආශාව විනා දරුවන් පිළිබඳ අහිතක් වෙස්සන්තර රජු තුළ නොවූ බව අවබෝධ කර ගැනීම
- දරුවන් හැදීමේ දී මවක දරන වෙහෙස හඳුනා ගැනීම
- කවි ගායනා හැකියා හා රසවින්දන හැකියා වර්ධනය කිරීම
- කවි නිර්මාණකරණයට පෙළඹීම

### 4.1.3 අභිමතාර්ථ සාධනය

#### 4.1.3.1 ප්‍රවේශය

- ගායන හැකියා ඇති සිසුවෙකු හෝ පාසලේ සංගීත ගුරු භවතා හෝ සහභාගි කරවා ගෙන පද්‍යයක් තාලානුකූලව ගායනා කර සිසුන්ගේ රස ජනනය වන අයුරින් පාඩමට පිවිසිය හැකි ය.
- ඔබට අභිමත වෙනත් ක්‍රමයකින් හෝ පාඩමට ප්‍රවේශ විය හැකි ය.

#### 4.1.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- සිසුන් සහභාගි කර ගෙන කවි ගායනා කරමින් අන්තර්ගත තොරතුරු සාකච්ඡා කිරීම මෙහි දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
  - **අම්මා වෙනුවෙන් දරුවන් කරන ප්‍රාර්ථනා**
    - "සම්මා සම්බුදුවන දා නිවන් දකින් අම්මා"
    - "සතර අපාවල නො ඉපද නිවන් දකින් අම්මා"
    - "දුකක් නැතිව නිවන් දකින් පිංවත් අපේ අම්මා"

- **සිය මවගේ ආරක්ෂාව පැතීම**

- "වෙසතුරු පිය රජුනි ඔබට බාරයි අපෙ අම්මා"
- "ආදාරෙක් ඔබ මිස නැත අම්මා හට මෙඅතේ "
- " අප සේ පිය රජුනි දනට නොදෙන්න අපේ අම්මා"

- තමන් වෙනුවෙන් අම්මා දැක් වූ සෙනෙහස

- " උසුලා දසමසක් කුසේ වැදූ දැයි අපේ අම්මා"
- " හදා වඩා රස කිරි දීඇති කළ දැයි පෙම්නේ
  අඬා විඩා හැර පලවැල ගෙන දුන් දැයි නිතිනේ "
- " දෙන්නා දෙවුකුලෙන් වඩා ආදැයි අපේ අම්මා "
- "ලපසේ සඳ විලසේ දවසක් වෙන්නුවෙම් මා"
- "ගසක දොඩම් මදැයි කියා කෑ දැයි අපේ අම්මා "

- **සිය පියා වෙනුවෙන් මවගේ කැපවීම**

- " සිය පිරිවර රට තොට හැම වස්තුව ඇති අම්මා
  එද ලොබ හැර ඔබ සමඟින් තපසට ආවෙම්මා"
- " රෑ දාවල් වත් පිළිවෙත් කළ දැයි සමගිනේ"

- **දරුවන්ගේ හදවතේ ජනිත දුක් වේදනා**

- වම්මා කඳුලැලි ඉස ඉස ඇවිදින් දැයිඅම්මා
  අම්මා අප අතහැරලා පෑවෙන කොයි ලෙසිනේ
  අම්මොයි කියන බසක් ඇසුන විට කඳුළැලි වැගිරීම

- **පියා රහසින් තමන් බමුණාට දන් දුන්න ද පියා කෙරෙහි උපකේෂා සහගත වීම**

- " සැපයේ අප දන් දුන්නේ වැදුවෙන් වද අම්මා"
- " පිය රජ අප අත්හැරලා ඉන්නේ දෝ නොදැනේ"
- "පියරජ ඇයි අම්මා ගිය අත නොබලා ඉන්නෙ"
- " පින් දීලා ඉන්නේ දෝ පියරජ සම සිතිනේ "
- " පිය රජ සිත් පහදා සිට දීලා අප දැම්මා "

- **තමන් ගත කළ ප්‍රීතිමත් ජීවිතය සිහි කරයි.**

- "එක අතකින් නියෙන් ගා ගා දෙනතේ කිරි බොම්මා"
- "නිලතුරුවල සෙවණැලිවල කෙළ කෙළ උන්නෙම්මා"
- "මේ හිමයේ ආදා සිට මේ දුක් නොදනිම්මා"

- **පැදි පෙළෙන් ජනිත වන රසය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කිරීම**

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.1.4 තක්සේරුව / ඇගයීම

- පද්‍ය පන්තියෙන් සිසුන් ලද අවබෝධය මැන බැලීම සඳහා ඉදිරිපත් කෙරෙන වාචික ප්‍රශ්න
- පද්‍ය පන්තියෙන් පැවසෙන මව්ගුණ
- දරුවන් මව කෙරෙහි දැක් වූ සෙනෙහස
- රස වින්දනය තීව්‍ර කිරීම සඳහා කවියා භාවිත කොට ඇති උපක්‍රම ආදී ශීර්ෂ යටතේ ලිඛිත පිළිතුරු ලිවීමට යොමු කිරීම.

4.1.5 පරිශීලනය

**වෙස්සන්තර ජාතක කාව්‍යය**
**සිංහල සාහිත්‍ය වංශය** - පුංචි බණ්ඩාර සන්නස්ගල
**බුත්සරණ** ග්‍රන්ථයේ එන වෙස්සන්තර ජාතකය
**පන්සිය පනස් ජාතක** පොත.

## 4.2 වදන් කවි පොත

### 4.2.1 හැඳින්වීම

සිංහල හෝඩිය හඳුන්වා දීමේ අරමුණ ඇති ව ලියා ඇති වදන්කවි පොත මහනුවර යුගයේ සාහිත්‍ය ක්ෂේත්‍රයට අයත් එක් කාව්‍යයකි. මෙය මහනුවර වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ අඥාත කතුවරයෙකු විසින් ලියැවුණකැයි සැලකේ. සිංහල හෝඩියේ අක්ෂර හඳුන්වා දීමෙන් සෑහීමකට නොපත් කවියා ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමේ අගය ද එය මහත් දුෂ්කරතා මධ්‍යයෙහි විඳ ලද යුතු දෙයක් බව ද ඒ සඳහා දේව්දේවතාවුන්ගේ පිහිට යැදීමේ අවශ්‍ය බව ද කියයි. ගණ දෙවියන් උදෙසා අකුරු කරන්නන් කළ යුතු පූජාවන් පිළිබඳ පුළුල් විස්තරයක් ද නැණ නුවණ වඩනු සඳහා පිදිය යුතු දෙවිවරුන් පිළිබඳ තොරතුරු ද ඇතුළත් වේ. පහත දැක්වෙන කවිය එක් නිදසුනකි.

සිද්ධ කිහිරැලි සමන් බොක්සල් විභීෂණ සිව්වරම් රජ පති
සිද්ධ මහ බඹ සක් ද ඉසිවර කතරගම දෙවියනුත් සිත රැති
සිද්ධ පත්තිනි දොළහ දෙවියෝ හද්‍රකාලී දේවි ගණ පති
සිද්ධ සිරිලක මෙහැම දෙවියෝ මෙමට ආසිරි දිගාදෙන් නිති

### 4.2.2 අභිමතාර්ථ

- පැරණි අධ්‍යාපන ක්‍රමයේ ස්වරූපය අවබෝධ කර ගැනීම
- ගිහි ජීවිතයේ පවත්නා දුෂ්කරතා වටහා ගැනීම
- ශිෂ්‍යයා තුළ පැවතිය යුතු ගුරු භක්තිය හා දෙවියන් පිළිබඳ විශ්වාස තේරුම් ගැනීම
- එවක ශිෂ්‍යයා හා වර්තමාන ශිෂ්‍යයා අතර ඇති වී ඇති අවංක බව නිර්ව්‍යාජත්වය හා කැපවීම විමසා බැලීම
- කවිවල වචනාර්ථ හා අදහස් නිවැරදි ව තේරුම් ගැනීම

### 4.2.3 අභිමතාර්ථ සාධනය

#### 4.2.3.1 ප්‍රවේශය

- පන්තියේ සිසුවෙකු හෝ ගුරුවරයා හෝ ශ්‍රව්‍ය පටයක ආධාරයෙන් හෝ රසවත් ව ගායනා කිරීම මඟින්

#### 4.2.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි ගායනා කරමින් අරුත් පැහැදිලි කර දීම.
- කවියාගේ අරමුණ, ප්‍රකාශිත අදහස් සිසුන් සමඟ සාකච්ඡා කිරීම.
- පැරණි අධ්‍යාපන ක්‍රමයේත් නූතන අධ්‍යාපන ක්‍රමයේත් විෂමතා සාකච්ඡා කිරීම.
- ඉගෙනීමේ වටිනාකම අගය කිරීමට සිසුන් යොමු කිරීම

පහත සඳහන් කරුණු ගැන සිසු අවධානය යොමු කරවීම.

- රස අහරක් කුසට නැතිව නිදි නොලබා විසිතුරු ඇඳුම් නොලැබ වුවත් ඉදිරි යහපත සඳහා ඇල්මෙන් අකුරු ඉගෙන ගත යුතු බව
- ඉගෙන ගැනීම අතපසු කරන අපට නොයෙක් දඬුවම් තිබුණත් ඒවා අපට අවශ්‍ය නැත. මින් ඉදිරියට ප්‍රමාද නොවී ඉගෙන ගන්නා බව කියයි.



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

අධ්‍යාපන ආයතන කෙතරම් දුෂ්කර තැන් ලෙස සැලකුවේ ද යන බව **එය දඟ ගෙයක් සේ වූ බවත් තම මෑණියන් තමා දඟ ගෙයක ලූ බවත් කියයි.** අම්මෝ කියා දුක් වේදනා කීවත් පියා බලා ගෙන සිටියත් ගුරුවරයාගේ පහරදීම නොනවතින බව.

4.2.4 තක්සේරුව හා ඇගයීම

- රසවත් යෙදුම් හා ව්‍යංගාර්ථ මතු කරමින් ඒවා රසවත් වූ අයුරු පැහැදිලි කරන්න.
- ගුරුවරයා හා ශිෂ්‍යයා ඉගෙනීමේ අගය ආදී තේමා ඔස්සේ කවි කිහිපයක් ශිෂ්‍යයා ලවා රචනා කරවීම
- සාම්ප්‍රදායික අධ්‍යාපනය හා නූතන අධ්‍යාපනය යන මැයෙන් විවාදයක් පැවැත්වීම

4.2.5 පරිශීලනය

- **නම් පොත හා මඟුල් ලකුණ**
- **සුභාෂිතය**

## 4.3 යසෝදරා වත

### 4.3.1 හැඳින්වීම

පොදුජන ප්‍රසාදය දිනා ගෙන ඇති **යසෝදරාවත** මහනුවර යුගයේ ලියැ වී ඇති රසවත් කාව්‍යනිර්මාණයකි. ශ්‍රැතිගෝචර බව ජන කවියේ ආවේණික ලක්ෂණය වුව ද එහි ඇති කාව්‍යමය ගුණය ද හඳුනා ගත් කවියා **තුන් සරණේ, වෙස්සන්තර ජාතක කාව්‍යය** ලියූ මඟ අනුව යමින් **යසෝදරාවත** ද ලියා ඇති බව පෙනේ. මෙහි කතුවරයා අඥාතය. හෙතෙම බුදුසිරිත හා බෝසත් සිරිත කාව්‍යයට නැඟීමට ප්‍රිය කළ කවියෙකු බව පෙනේ. යසෝදරා දේවියගේ චරිතයේ පරමාදර්ශී බව ඉස්මතු කරමින් සම කාලීන කාන්තා සමාජය චරිතවත් කිරීම කවියාගේ අරමුණ වූ බව පැහැදිලි ය. කෘතිය අවසානයේ ඇතුළත් පහත සඳහන් කවියෙන් මේ බව පසක් වේ.

| | |
|---|---|
| අසමින මේ දහම් අඟනෝ ගෙන | සිතට |
| යටැසින රචා වත් නොබලා තම | හිමිට |
| වසමින රන් රසසෙ එකතින් අදර | කොට |
| උපදිනු යසෝදර බිසවුන් ලෙස | සොඳට |

විවිධ කාව්‍යෝපක්‍රම භාවිත කරමින් සරල බස්වහරකින් ලියා ඇති යසෝදරා වත රසවත් කාව්‍යයකි.

### 4.3.2 අභිමතාර්ථ

- ජන කාව්‍ය හා යසෝදරාවතේ ජන කාව්‍ය ලක්ෂණ හඳුනා ගැනීම
- යසෝදරා දේවියගේ චරිත ස්වභාවය හඳුනා ගැනීම
- පිය බිරිඳක ලෙස යසෝදරා සිය හිමියාගෙන් වෙන් ව යාම සාධාරණීකරණය කරන අයුරු අවබෝධ කර ගැනීම
- ප්‍රාර්ථනාවන්හි අව්‍යාජත්වය අවබෝධ කර ගැනීම
- කවියා භාවිත කරන බස්වහර හා විවිධ කාව්‍යෝපක්‍රම හඳුනා ගැනීම හා අගය කිරීම
- කාව්‍යයේ ආධ්‍යාශය අගය කිරීම
- කාව්‍ය නිර්මාණ හැකියා වර්ධනය කිරීම

### 4.3.3 අභිමතාර්ථ සාධනය

#### 4.3.3.1 ප්‍රවේශය

- පන්තියේ සිසුන් දෙදෙනෙකු යොදා ගෙන කවි කිහිපයක් ගායනා කිරීම මඟින් හෝ සකස් කරගත් හඬ පටයක් මඟින්

#### 4.3.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- සිසුන්ට කේවල හා සාමූහික වශයෙන් ගායනා කරවීමට අවස්ථාව සැලසීම.
- කවිවල සමස්ත අදහස මතු කිරීම හා වචනාර්ථ පිළිබඳ අවබෝධය
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සිසුන් සමඟ සාකච්ඡා කිරීම
    - කවියාගේ අරමුණ
    - යසෝදරාවගේ පෙර අත්බවේ අත්දැකීම්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සිය සැමියා සමඟ ගත කළ ජීවිතය පිළිබඳව යසෝදරාව සිතන ආකාරය
- කවියාගේ බස් වහර
- උපමා, රූපක හා ධ්වනිතාර්ථ, ආදී කාව්‍යෝපක්‍රම
- කවි පන්තිය රසවත් නිර්මාණයක් ලෙස අගය කිරීම

4.3.4 තක්සේරුව / ඇගයීම

- ■ මතකයෙන් ගායනා කිරීමේ හැකියාව විමසා බලන ප්‍රායෝගික ක්‍රියාකාරකමක්
- ■ තෙමා වැටේ, රන්කඳට, සුරිය මඬල, ඇත් රජුනි, වැනි භාවාර්ථ ඉක්මවා යන ධ්වනිතාර්ථවත් පද විමසීමට යොමු කිරීම
- ■ පද්‍ය පන්තියේ ඇතුළත් ජන වහරේ එන වදන් උපුටා ගෙන ඒවායේ අරුත් දැක්වීම **යසෝදරාවත** කාව්‍යයේ ප්‍රස්තුතයෙන් මතු වන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම

43.5 පරිශීලනය

- ■ ජනකවි සංග්‍රහ කළ කෘති
- ■ **තුන් සරණේ, පත්තිනිහෑල්ල,** ආදී පොත්
- ■ **යසෝදරාවත** පිළිබඳ ලියවී ඇති විචාර

## 4.4 ඉතින් ආයුබෝවන් ලක්මවුනි ගරු

### 4.4.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අවසාන රජතුමා වූ ශ්‍රී වික්‍රමසිංහ රජතුමා ඉංග්‍රීසින් විසින් සිරකරුවකු වශයෙන් අල්ලා ගෙන පිටුවහල් කිරීම සඳහා කොළඹ වරායෙන් නැවට නංවන ලදි. දහහත් වසරක් තමා පාලනය කළ දේශයෙනුත් තම රටවැසියාගෙනුත් සදහට ම වෙන් වී යන මේ මොහොත රජුට ඉමහත් සංවේගය දනවන අවස්ථාවක් විය. ක්‍රමයෙන් තමා සමඟ වූ නැව ශ්‍රී ලංකා දිවයිනෙන් ඈත්ව යත්ම රජුට දරා ගත නොහැකි වේ. එහිදී සිය රට දෙස බලා රජතුමා පවසන කවි පෙළක් සේ සලකා පසුකාලීන අප්‍රකට කවියෙකු විසින් රචනා කරන ලද පැදි පෙළකි "**ඉතින් ආයුබෝවන් ලක්මවුනි ගරු**".

ඉහත පුවත ඇසුරෙන් කරන ලද රචනයක් බැවින් මෙම පැදිපෙළ ජන ශ්‍රැති ඇසුරෙන් බිහි වූ ජනකවියක් ලෙස හැඳින්වි හැකි ය.

පැදිපෙළේ මුඛ්‍ය රසය වන්නේ කරුණා රසයයි.
ඉතින් ආයුබෝවන් ලක්මවුනි ගරු යන අවසාන පද්‍යයෙන් කරුණා රසය තීව්‍ර වේ.

උඩරට රදලවරුන් බලකාමයෙන් යුතු ව රජුට විරුද්ධ ව කරන ලද කුමන්ත්‍රණ නිසා රජු සමඟ සිංහල රාජ්‍යය ද ඉංග්‍රීසීන්ට නතු විය. කවියා සිය පැදි පෙළෙන් මෙම ව්‍යසනයට හේතු පෙන්වා දෙයි.

ආරම්භයේ දී සිංහල රාජ්‍යයේ අභිමානවත් බවත් ආදීනත්වයත් පෙන්වා දෙන කවියා ජාතිය සතු දුබලතා නිසා එම අදීන අභිමානවත් කිරීටය. අපිට අහිමි වූ බව පවසයි. රජුට මෙම විපත අත් වීමට ආසන්න තම හේතුව ලෙස කවියා දකින්නේ රජු මතට යොමු වීමයි. එහෙත් එය බලලෝභී පිරිසකගේ උපක්‍රමයක් මඟින් සිදු වූවක් බව පවසන්නේ

"අපායට බියෙන් මත්පැන් නොබි වි   මට
උපායෙන් පොවා යළි මා ගෙන ස   තුට"
යනුවෙන් දක්වමිනි.

සිංහල රාජ්‍ය උරුමය වන දළදා වහන්සේ පිහිටි දළදා මැදුර, අහස් කුස සිපගන්නා මහදාගැබ්, කැළණි මහ වෙහෙර, සමන්ගිර, සිරිපතුල් සටහන ආදී අතිපූජනීය වස්තූන් ගැන සිහිපත් කරන්නේ දේශාභිමානය ඇති කරවන ආකාරයෙනි.

"රජකම් කළත් කළ කම් පලදෙන   බැවිනි

මෙතරම් දුකක් සිදුවිය මගෙ පෙර   පවිනි"

යනුවෙන් බුදුදහමට අනුව රජු කළ පූර්ව කර්මවලට විපාක වශයෙන් මෙම මහා ව්‍යසනය සිදු වුවත් සිංහල රාජ්‍ය උරුමය වූ රාජ රුධිරය තිබෙන තාක් කඳුළු නොසලන බවත් පවසමින් සිංහල රාජකීයත්වයේ අභිමානය දැක්වීමට ද කවියා උත්සාහ ගෙන ඇති බව පෙනේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

කාව්‍ය රසය උද්දීපනය කිරීම සඳහා කවියා යොදා ගෙන ඇති කාව්‍යමය උපක්‍රම ද අගය කළ යුතු ය.

දෙදහස් නිදහස්, උදහස්
හිම්මේ, පෙම්මේ, දැම්මේ අම්මේ

වැනි අනුප්‍රාස යෙදුම් මඟින් ශබ්ද රසය ද අහෝ, ඉතා, අහෝ ගණඳුරයි හෝ හෝ හඬ නැගෙයි, කොහෝමවත්, ඉතින් ආයුබෝවන් වැනි යෙදුම් මඟින් කරුණා රසය ද දනවයි. සෑම පද්‍යයක ම මුල එළි වැට යොදා ගැනීමට ද කවියා උත්සාහ ගෙන ඇත.

4.4.3 අභිමතාර්ථ සාධනය

4.4.3.1 ප්‍රවේශය

- ගුරුවරයාට වඩාත් සුදුසු ප්‍රවේශයක් තෝරා ගැනීමට හැකි ය.
- සිසුන්ගේ අවධානය හා රුචිකත්වය ඇති වන ප්‍රවේශයකින් පාඩමට පිවිසීම අවශ්‍ය වේ.

4.4.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පැදි පෙළේ මුඛ්‍ය රසය මතු වන සේ කණ්ඩායම් වශයෙන් හා තනි තනිව ගායනා කරවීම
- එක් එක් සිසුන්ගේ සිත්ගත් කවි ගායනා කිරීමට අවස්ථාව සලසා දීම
- පැදි පෙළෙන් මතුවන ප්‍රස්තුත සිද්ධිය මතු කොට සාකච්ඡා කිරීම
- සමකාලීන දේශපාලනික හා සාමාජික තොරතුරු මතු කොට දැක්වීම
- පද්‍ය පන්තියෙන් මතු කෙරෙන සාහිත්‍ය රසය පිළිබඳව සාකච්ඡා කිරීම සහ එම රසය ජනනය කරවීම සඳහා කවියා යොදාගත් කාව්‍යමය උපක්‍රම පරීක්ෂා කර බැලීම
- සිසුන්ගේ මෙවැනි අත්දැකීමක් පදනම් කොට ගෙන කවි පන්තියක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවීම.

4.4.4 තක්සේරුව/ ඇගයීම

- ■ කවි පෙළෙන් කරුණා රසය මතුවන අවස්ථා උපුටා ගැනෙන අභ්‍යාසයක්
- ■ මම ශ්‍රී වික්‍රම රජසිංහ වෙමි. යන මැයෙන් කතාවක් පැවැත්වීම
- ■ දේශානුරාගී හැඟීම් දැනවෙන කවි කීපයක් නිර්මාණය කරවීම

4.4.5 පරිශීලනය

■ ජන කවි සංග්‍රහයක්

## 4.5 ලංකා මාතා

### 4.5.1 හැඳින්වීම

1901 වර්ෂයේ සිකිම් දේශයේ දී උපත ලද එස්.කේ. තෂිනූම්ගල් නම් ටිබෙට් ජාතික දරුවා ශ්‍රී ලංකාවට පැමිණ ඇත්තේ ඔහුට වයස අවුරුදු 12 දී පමණ ය. 1914 වර්ෂයේ දී එසේ පැමිණ ඇතැයි විශ්වාස කෙරේ. අනතුරු ව මොහු සිකිම් මහින්ද නමින් ලංකාවේ දී පැවිදි බිමට පත් ව විහාරස්ථාන කිහිපයක් ම මුල් කරගෙන ශාසනික සේවාවන්හි නිරත විය. මේ අතර ම සිංහල, පාළි, සංස්කෘත යන පෙරදිග භාෂාධ්‍යනයෙහි ද යෙදී භාෂා ප්‍රවීණයෙක් විය. මේ නිසා ම වසර ගණනාවක් කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු වශයෙන් ද සේවය කිරීමට අවස්ථාව උදා විය. වසර 50ක පමණ කෙටි ආයු කාලයක් ගෙවා මේ හිමියන් වර්ෂ 1951 මාර්තු මස 16 වන දින අපවත් වූහ. මේ කාලය තුළ ශාසනයට පමණක් නොව රටට, ජාතියට මෙන්ම සාහිත්‍යයට සිදු කළ මෙහෙය අපමණ ය. උන්වහන්සේගේ නිර්මාණාත්මක කාව්‍යකරණය කෙරෙහි පමණක් මෙහි දී අවධානය යොමු කරන විට එය අංශ කීපයක් යටතේ සාකච්ඡා කළ හැකි ය.

**නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය, ලංකා මාතා** ආදී ජාතිකාභිමානය මතු කෙරෙන කාව්‍යයන් ද, **රාත්‍රිය, රෝසමල, උදය, අන්ධ ළමයා** වැනි ළමා කාව්‍යයන් ද **ඉබ්බෙක්, මීදිවැල හා හිවලා, කකුළුවා හා බමුණා, සැබෑ යාළුවෝ, වෙසතුරු පුවත**, වැනි කවි කතාවන් ද, **දුටුගැමුණු මහරජ, ගාන්ධි ස්තෝත්‍ර** ආදී අභිවාදන කාව්‍යයන් ද **සාලි රාජකුමාර, අශෝකමාලා** වැනි ප්‍රේම කාව්‍යයන් ද, **අවුරුදු කවි, වස්සාන කාලය, ගීත විනෝදේ, ඔබා මුතුදම**, ආදී විවිධ විෂයය යටතේ ලියැවුණු කාව්‍යයන් ද මේ හිමියන් අතින් බිහි විය.

මේ අතුරින් වඩා ජනප්‍රියත්වයට පත් වන්නේ මුන්වහන්සේගේ ළමා කවි හා ජාතිකාභිමානී කාව්‍ය නිර්මාණයන් ය. ජාතිකාභිමානී කාව්‍යය නිර්මාණ අතර "**ලංකා මාතා**" යනු ජාතික නිදහස දේශයේ අභිමානය වෙනුවෙන් කැපවීම් කිරීමට පසුබසින ජාතියක් නැඟී සිටුවීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයකි. බටහිර පුහු අටෝපකාරී සමාජයට ආශා වෙමින් දෙබිඩි ජීවිත ගත කරන අනුකරණවාදී දේශීය පැලැන්තියේ ගති ලක්ෂණත්, ඔවුන්ගේ වහල් මානසිකත්වයත් පිළිබඳ මනා යථාර්ථ නිරූපණයක් කිරීමට මහින්ද හිමියෝ මෙම නිර්මාණයෙන් උත්සාහ ගෙන ඇත. දේශය, දේශයේ මිනිසුන් ඇඳ වැටෙද්දී පිටරැටියනට වැඳ වැටී ගරු නම්බුනාම ලබමින් මහේශාක්‍ය ලීලායෙන් ජීවත් වීමට වෙර දරන පැලැන්තිය මෙසේ නිර්දය විවේචනයට ලක් කරයි. විදේශවල සුඛවිහරණය වෙනුවෙන් කෝටි ගණන් වියදම් කරන මේ අනුකාරක ධනපතියෝ තම නිවස ඉදිරියට එන අසරණ දිළින්දෙකුට සුලු උපකාරයක්වත් නොකරති. මේ පසුබිම යටතේ දේශය බේරා ගැනීමට සුදුසු විමුක්ති කාමියෙකුගේ ආගමනයක් ප්‍රාර්ථනා කරති. මේ චින්තනය ඉදිරිපත් කිරීම සඳහා රූපක ආදී අලංකාර විධි මෙන්ම සරල භාෂා ව්‍යවහාරය ද කවියට මනා පිටිවහලක් ලබාදෙයි. සිය අභිමතාර්ථ සාධනය වෙනුවෙන් කාව්‍ය භාෂාව ආවේගශීලී ලෙස යොදා ගෙන ඇත.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.5.2 අභිමතාර්ථ

- එස්. මහින්ද හිමියන් හා ඒ හිමියන්ගේ කාව්‍ය රචනා පිළිබඳ ව විමසා බැලීම
- **ලංකා මාතා** කවි පන්තියේ අන්තර්ගතය පිළිබඳ අවබෝධ කර ගැනීම
- කවි පන්තියෙන් කියැවෙන දේශාභිමානී හැඟීම් මතු කර ගනිමින් රස විඳීම
- දේශාභිමානී හැඟීම් ජනනය වන කවි කීපයක් නිර්මාණය කිරීම
- පද්‍ය පන්තියේ ඇතුළත් රසවත් යෙදුම් උපුටා ඒවා භාවිත කිරීමේ අවස්ථා මතු කර ගැනීම

4.5.3 අභිමතාර්ථ සාධනය

4.5.3.1 ප්‍රවේශය

- දේශාභිමානී ගීතයක් ශ්‍රවණය කිරීමට සැලැස්වීමෙන්
- එස්. මහින්ද හිමියන්ගේ මෙවැනි වෙනත් කවියක් හෝ ගීතයක් ගායනය කිරීමෙන්.
  උදා: මුනි සිරිපා සිඳිමින්ගේ යන කවි පන්තිය
- ඔබට අභිමත වෙනත් සුදුසු ප්‍රවේශයක් තෝරා ගන්න.

4.5.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පද්‍ය පන්තිය තාලානුකූල ව ගායනා කරවීම
- කවියා සහ ඔහුගේ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කිරීම
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතුකර දැක්වීම
- කවි පන්තියෙන් මතු කෙරෙන දේශාභිමානී හැඟීම් දනවන අවස්ථා ඉදිරිපත් කිරීම
- කවියා තම අරමුණ මුදුන්පත් කර ගැනීමට යෙදු කාව්‍යෝපක්‍රම පිළිබඳ විමසීම.

ඇගැයුම / තක්සේරුව

- සමකාලීන සමාජය විවරණය කෙරෙන කවි පන්තියක් ලෙස එහි ඇති වැදගත්කම පිළිබඳ අභ්‍යාසයක්.
- දේශාභිමානී හැඟීම් ජනනය වන කවි පද උපුටා ලියවීම
- දේශාභිමානී ගීතයක් හෝ කවියක් රචනා කරවීම

පරිශීලනය

- **නිදහසේ දැහැන** - එස්. මහින්ද හිමි
- **නිදහසේ මන්ත්‍රණය** - එස්. මහින්ද හිමි

## 4.6 කම්මැලි මිනිහෙක්

### 4.6.1 හැඳින්වීම

චිරන්තන පද්‍ය සම්ප්‍රදාය මෙන් ම නූතන පද්‍ය සම්ප්‍රදාය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරමින් ඒවායේ සංකලනාත්මක රීතියක් අනුව ස්වකීය පද්‍ය නිර්මාණ එළි දැක්වූවෙකි. බොරලැස්ගමුවේ පී.එච්. පෙරේරා කවියා 1896 ජුලි 14 වැනි දින බොරලැස්ගමුවේ රත්තනපිටියේ දී උපන් මෙතුමා පසුකාලීන ව සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන්නේ ගුරුවරයෙකු වශයෙනි. ඉතිහාසය පිළිබඳ කරුණු හැදෑරුවෙකු, කථිකයෙකු හා චිත්‍ර ශිල්පියෙකු වශයෙන් ප්‍රමුඛත්වයක් ගත් මෙම කවියා විවිධ තේමා පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදුණේ ය. "**සැළලිහිණි අස්න**" නම් කෘතිය සැළලිහිණි සන්දේශයේ කවිවලට නිර්මාණය කළ චිත්‍රවලින් සමන්විත කෘතියකි. **බුද්ධ ස්තෝත්‍ර, කුරක්කන් හේන, කිවිඳෙකුගේ අදහස්, පරලොවට පණිවිඩයක්, දරු නැළවිල්ල, මගේ මල්ලී, අපේ රට,** යන කාව්‍ය නිර්මාණ මොහුගේ නිර්මාණ කුසලතාව ප්‍රකට කරන කෘති ය. කොළඹ යුගයේ කවියෙකු වූ මෙතුමාගේ කම්මැලි මිනිහෙක් යන්න වඩාත් නිර්මාණශීලී එකක් ලෙස හැඳින්විය හැකි ය.

කම්මැලියෙකු සතුව පවත්නා දුර්වලතා මෙන් ම ප්‍රයෝගශීලී කපටි ලක්ෂණ ධ්වනිත කෙරෙන කාව්‍ය නිර්මාණයකි කම්මැලි මිනිහෙක් යන්න. කම්මැලියාට දිවැස් තිබේ යන සිංහල කියමන ප්‍රකට කෙරෙමින් ස්වකීය කාව්‍ය චින්තාවලීන් ඉතා සරල ව සිත්ගන්නා ආකාරයෙන් ඉදිරිපත් කරයි. කම්මැලියෙකුගේ චිත්ත රූපයක් සහෘද මනසේ මවාපෑමට තරම් මෙය සමත් ය. කවියා තම භාෂා හැකියාව මනාව ප්‍රයෝජනය සඳහා ගෙන ඇති බැව් පෙනෙයි.

යමෙකුගේ සම්පත් විනාශ මුඛයට පත්වන ප්‍රධාන කාරණයකි අලස බව. අලසයෙකුගේ ලක්ෂණ කීපයක් බුදු දහමෙහි විස්තර වන අතර ඒ සියල්ල අපූර්වත්වයෙන් යුක්තව කවියට නඟා ඇත. එපමණක් නොව කම්මැලියෙකු සතු මානසික ස්වභාවය ද කදිමට නිරූපණය කරයි.

නිතර ම මතුරන බැරි මන්තරයේ
අතපය කැක්කුම ඇති නිරතුරුයේ
කොතන කොයිකවත් වැතිරෙන තරයේ
කැතකම් පිරි හිත ඉතිර පැතිරයේ

පුද්ගල හා සමාජ සංවර්ධනය කෙරෙහි අත්‍යවශ්‍ය උද්‍යෝගය, උනන්දුව, ධෛර්යය, නොමැති මිනිසුන් ඇති සමාජයක් තුළ ප්‍රකට පරිහානි ලක්ෂණ දෛවය, වාසනාව නිරන්තරයෙන් පෙරටු කොට ගනී.

වාසනාව එනතුරු කට දී ගෙන
කේන්දරය වෙත දෝස තබා ගෙන
අනුන්ම සපයන දෙයින් යැපී ගෙන
ඉන්නට හපනා දෑස පියා ගෙන

යනුවෙන් ඒ බැව් කාව්‍යාත්මකව දක්වයි. සමාජය අපේක්ෂා කරන යහපත් චින්තනය, ක්‍රියාශීලී සහභාගිත්වය එවැනි පුද්ගලයන්ගෙන් අපේක්ෂා කළ නොහැකි බව.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

සොලවන මුත් අතපය ඉඳ හිටලා
පළ ඇති කිසිවක හිත නොම පටලා
පොළොවට බරැතිව ඇවිදින වටලා
මළ කඳ පෙන්වයි කම්මැලි සිවලා

යන්නෙන් පැහැදිලි කරයි.

මෙලෙස කාව්‍ය රසාස්වාදය කෙරෙහි අවධානය යොමු කරමින් කවි පන්තියේ සුවිශේෂ අවස්ථා මතු කර ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කළ හැකි ය. මෙහි ඇතුළත් සමහර පද්‍යයන්හි දී ජුගුප්සා ජනක හැඟීම් මතු කෙරෙයි. ඒ සමඟ බිභත්ස ආදී රස ජනනය වන ආකාරය ද විමසා බැලිය හැකි ය. නිදසුන්

වතක් කබල් ලණු දිරූ සියල්ලා
ඇඳක් ද ඉසකේ පිරුණු අවුල්ලා
ගතක් ඇතුව කුණු තැවරී විපුල්ලා
සැපක් විඳිය කම්මැලි ගැඩවිල්ලා

4.6.2 අභිමතාර්ථ

- ජී.එච්. පෙරේරා කවියා සහ ඔහුගේ නිර්මාණ පිළිබඳව විමසා බැලීම.
- කවි පන්තිය තුළින් සමාජයේ වෙසෙන දුබල පුද්ගලයන් විවරණය කෙරෙන ආකාරය පිළිබඳ සොයා බැලීම
- පද්‍ය පන්තියේ රස ජනනය සඳහා කවියා යොදාගත් උපායමාර්ග පිළිබඳ අවබෝධයක් ලබාදීම.
- යමෙකුගේ විනාශයට කම්මැලිකම හේතුවන බව සනාථ කිරීමට කවියා ගත් වෙහෙස සමාජ ශෝධනයට හේතුවන බව වටහා ගැනීම

4.6.3 අභිමතාර්ථ සාධනය

4.6.3.1 ප්‍රවේශය

` 
- ඔබට අභිමත පරිද්දෙන් සුදුසු ප්‍රවේශයක් සකසා ගත හැකි ය.
- පරිසරයෙන් සපයා ගත හැකි පාඩමට අදාළ සරල ඉගෙනුම් සම්පත් පරිහරණය කරමින්
- කම්මැලියෙකුගේ ලක්ෂණ සාකච්ඡා කරමින්

4.6.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- තනිව හෝ සාමුහික ව, විරිත්වලට අනුව සිසුන් සමඟ ගායනා කිරීම
- කම්මැලි මිනිසාගේ ලක්ෂණ පිළිබඳ ව රසවත් ව ඉදිරිපත් කරන ආකාරය මතු කිරීම
- සමාජ හා පුද්ගල සංවර්ධනයට නම් කම්මැලිකම දුරලිය යුතු බව අවධාරණය කිරීම
- නිර්මාණයෙන් ජනනය වන සාහිත්‍යමය රසය පිළිබඳ අවධානය යොමු කිරීම

4.6.4 තක්සේරුව හා ඇගයීම

- සමාජයේ වෙසෙන දුබල පුද්ගලයන්ගේ ගතිලක්ෂණ උපහාසයට ලක් කරමින් සමාජයට පණිවුඩ දෙන ආකාරය පිළිබඳව සොයා බැලෙන අභ්‍යාසයක්
- රස මතු කිරීමට කවියා යොදාගත් උපක්‍රම දැක්වෙන සටහනක් සකස් කරවීම

4.6.5 පරිශීලනය

- **නූතන කාව්‍ය සංග්‍රහය** - ආරිය රාජකරුණා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.7 හිඟන්නා

### 4.7.1 හැඳින්වීම

1987 ජුලි 25 වැනි දින මාතර දික්වැල්ලේ දී පවුලේ දොළොස්වැන්නා ලෙස උපන් මුනිදාස කුමාරතුංග ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා මාතර ශාන්ත තෝමස් විදුහලෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබී ය. පිරිවෙන් ඇසුරෙන් පාලි සංස්කෘත භාෂා උගත් මෙතුමා කොළඹ ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් ගුරු පුහුණුව ලබා විදුහල්පති තනතුරකට පත්විය. ඉන්පසු පාසල් පරීක්ෂකවරයෙකු වශයෙන් සේවය කොට නිට්ටඹුව, බලපිටිය ගුරු විද්‍යාලවල විදුහල්පතිවරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

'**ලක්මිණි**' '**පහන**' පුවත්පතේ සංස්කාරක වරයා වූ මෙතුමා '**සුබස**' සඟරාවේ ආරම්භක සංස්කාරක වරයා ද විය. '**ස්වදේශ මිත්‍රයා**' පත්‍රයට ලිපි සැපයූ කුමාරතුංග මහතා සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ රැසක් සංස්කරණය කිරීමෙන් හා තවත් විශාල ප්‍රමාණයකට විවරණ සැපයීමෙන් මහත් භාෂා සාහිත්‍ය සේවයක් සිදු කොට ඇත.

ළමුන් සඳහා **මඟුල් කෑම, හත්පණ, හීන්සැරය, කියවන නුවණ**වැනි පොත් ද **කුමර ගී, පියසමර**, වැනි පද්‍ය ග්‍රන්ථ, **කවිශික්ෂාව, විරිත්වැකිය**, වැනි උපදේශ කාව්‍ය ග්‍රන්ථ කීපයක් ද නිර්මාණය කොට ඇත. **ව්‍යාකරණ විවරණය, ක්‍රියා විවරණය සහ කුමාර ව්‍යාකරණය,** වැනි විවරණ පොත් ද සංගීතය හැඳින්වීම සඳහා '**හෙළමියැසිය**' නමින් පොතක් ද කළ මෙතුමා 1944 මාර්තු මස 02 වැනි දින අප අතරින් වියෝ විය.

'**හිඟන්නා** පැදිපෙළ ශික්ෂා මාර්ගය 2 නැමැති කෘතියෙන් උපුටා ගත්තකි. කුමාරතුංග කවියා වැඩි වශයෙන් ප්‍රිය කළ ගී විරතකින් රචනා කොට ඇති මේ පැදි පෙළ යාචකයෙකුගේ ස්වභාවය මතු කරමින් හිඟන්නකුගේ මුවින් නිකුත් වන ශෝකාලාපයක් සේ ඉදිරිපත් කෙරේ.

හිඟන්නකුගේ ස්වාභාවය, ඔහු විඳින දුක් පීඩා, සමාජය ඔහු දෙස බලන අයුරු සහ ඔහු සමාජය දෙස බලන අයුරු කවියා ඉදිරිපත් කරන්නේ සියුම් සමාජ විවරණයක් ද කරමිනි.

"එළවා දමතත් මෙමා දනන්
නිල මැස්සෝ මට ආදරේ කරත්
පණුවන් හට නම් මගේ ඇගේ
හිඟයෙක් නෑ මට බත් පිඩක් නැතත්"

යනුවෙන් හිඟන්නාගේ ස්වභාවය පෙන්වන කවියා.
බොහෝ සේ පෝසත්තු නම් නොදෙත්
ලැබුනෝතින් දිළින්දා ගෙනුයි යමක්
පොහොසත් අයගේ මුදල් දෙතොත්
ගරු නා මත් පදවිත් ලැබීමට යි
"දනයෙන් පෙර පින්බෙලෙන් ලැබූ
පල ගන්නා සැටි දන්නේ නෑ ඔවුන්"

යැයි ඇති හැකි සමාජ පරතරයේ ස්වභාවය ඉදිරිපත් කරන්නේ සමාජ ගවේෂකයෙකුගේ ස්වරූපයෙනි

"කැරපන් වැඩ ගොස් සිඟා    නොකා
කිම අත් පා නැතිවාද අෑ කියා
එළැවීම ඉතා පාසුවෙයි.
වැඩ දෙන්නැයි කියුවත් වැඩක් නොදෙයි."

යන යෙදුම කෙරෙහි ද අපේ අවධානය යොමු විය යුතු ය.

මෙලොව ඇති නැති බව පෙර පින් පව් අනුව සිදුවන බව පිළිගන්නා කවියා තමාට උපකාර නොකරන බව පවසන්නේ,

දනයෙන් පෙර පින් බෙලෙන්    ලැබූ
පළ ගන්නා සැටි දන්නේ නෑ    ඔවුන්
එහෙයින් මම නම් ඔවුන් කෙරේ
අනුකම්පාවට සිත් මා නමා සිටිමි.    යනුවෙනි.

සමස්තයක් ලෙස පද්‍ය පන්තියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කවියා යොදා ගෙන ඇති චරිත, භාෂාව, ආදිය ගැන ද කරුණු විමසා බැලීම අවශ්‍ය වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.7.2 අභිමතාර්ථ

- මුනිදාස කුමාරතුංග මහතා පිළිබඳ තොරතුරු සහ ඔහුගේ පද්‍ය නිර්මාණ පිළිබඳ විමසා බැලීම.
- කවියාගේ අරමුණු පිළිබඳ ව හා ඒවා ඉටුකර ගැනීමට යොදා ගත් උපාය මාර්ග පිලිබඳ ව අවබෝධ කර ගැනීම
- කවියා පද්‍ය පන්තියෙන් සමාජයට දීමට බලාපොරොත්තු වන පණිවුඩය පිලිබඳ සොයා බැලිම.

4.7.3 අභිමතාර්ථ සාධනය

4.7.3.1 ප්‍රවේශය

- නිතර අසා පුරුදු හිඟන්නන් ගායනා කරන කවියක් ගායනා කොට ඒ පිළිබඳ විමසීමෙන්
- සිසුන් ඇසූ දුටු දෙයක් විමසා බැලීමෙන් හෝ
- ඔබට අභිමත සුදුසු ප්‍රවේශයක් තෝරා ගෙන හෝ පාඩමට පිවිසිය හැකි ය.

4.7.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- සිසුන් ලවා පද්‍ය පන්තිය ගායනා කරවීම
- කවියාගේ ජීවන තොරතුරු සහ ඔහුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීම.
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතු කොට දක්වා ඒ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කිරීම
- හිඟමන හා හිඟන්නන් පිළිබඳ ව ලියැවී ඇති වෙනත් නිර්මාණ එක් රැස් කරවා කියැවීමට සැලැස්වීම
- ළමුන්ට හමුවන තවත් මෙබඳු චරිත ගැන කුඩා පද්‍ය පන්ති නිර්මාණය කරවීම.

4.7.4 තක්සේරුව/ ඇගයීම

- සිඟන්නා පද්‍ය පන්තියෙන් කවියා ඉදිරිපත් කිරීමට අදහස් කළ සමාජ විවරණය කෙතරම් සාර්ථක වී ඇත්දැයි විමසා බැලෙන අභ්‍යාසයක් කරවීම.
- විරිදුකාරයා, ශාස්ත්‍රකාරයා, නයිනටවන්නා, වැනි සිසුන් දැක ඇති චරිතයක් ඇසුරු කොට කුඩා කවි පන්තියක් නිර්මාණය කරවීම
- මුනිදාස කුමාරතුංග කවියාගේ වෙනත් පද්‍ය නිර්මාණ කීපයක් එක්රැස් කොට කියවා බිත්ති පුවත්පතක් නිර්මාණය කරවීම.

4.7.5 පරිශීලනය

- **ශික්ෂා මාර්ගය 2** - මුනිදාස කුමාරතුංග
- **පිය සමර** - මුනිදාස කුමාරතුංග
- **කුමාරතුංග පැදිසගනුව** - සංස්කෘතික දෙපාර්තමේන්තුව

## 4.8 හැවිල්ල

### 4.8.1 හැඳින්වීම

දකුණු අලුත්කුරු කෝරලයේ ගණේපළ නම් ගමේ 1899 වසරේ දී උපත ලැබූ රැපියල් තෙන්නකෝන් මහතා හෙළ හවුලේ ප්‍රබල සාමාජිකයෙකි. රද්දොළුව පාසලෙන් අධ්‍යාපනය ලැබූ තෙන්නකෝන් මහතා ප්‍රාචීන භාෂාත් ඉංග්‍රිසි භාෂාත් ඉගෙනීමෙන් තම සාහිත්‍යය ප්‍රභාවත් කරගෙන ඇති දක්ෂ ගුරුවරයෙකි. මෙතුමා නිට්ටඹුව ගුරු විදුහලින් ගුරු පුහුණුව ලබා පසුව එහි ම ගුරුවරයකු වශයෙන් සේවය කොට ඇත. ඉතිහාසය පිළිබඳ විශාරදයෙකු වූ ඔහු ගුරු විදුහලේ ඉගැන්වීම කර ඇත්තේ භූමි ශාස්ත්‍රය හා ඉතිහාසය යන විෂය දෙකයි. කුමාරතුංග මුනිදාසයන්ගේ ඇසුර ලැබීමෙන් පසු භාෂා ප්‍රේමියෙකු වී භාෂා ප්‍රබෝධය සඳහා පෙළඹී ඇත. ගුරු විදුහලේ සේවයේ යෙදී සිටිය දී එහි පැවති ඇතැම් දූෂණ හෙළිකරමින් ලියූ "**එළුසඳෙස**" ඔහුගේ පළමු පද්‍ය නිර්මාණය ලෙස පිළිගැනේ. එහෙත් මෙය මුද්‍රණය වී නැත.

සම්භාව්‍ය ග්‍රන්ථ රාශියක් සංස්කරණය කර ඇති අතර **එළු අත්තනගලු වංශය, කෝකිලසන්දේශය, ගිරා සන්දේශය, සැවුල් සන්දේශය හා සිදත් සඟරාව** ඒ අතර වේ. **වවුලුව, හැවිල්ල, සක්පුබුදුව, සිංහල වංශය, රුප්පෙ අන්දරය** ආදිය ඔහුගේ උසස් නිර්මාණ අතර වේ.

ගැමි තොරතුරු ගැමි වහරින් ම එහෙත් වියත් ලෙස පැවසීමේ අපූරු හැකියාවක් ඇති ව සිටි මෙතුමාගේ උපහාසාත්මක රචනා ශෛලිය, නිවැරදි පද බෙදීම, නිදහස් ව අදහස් ඉදිරිපත් කිරීම, කැපී පෙනෙන විශේෂ ගුණ අතර වේ.

තම කුකුළා සොරකම් කළ අයකුට කරන ශාපයක් වශයෙන්, උපහාසාත්මක ව කළ පද්‍ය නිර්මාණයක් ලෙස හැවිල්ල හැඳින්විය හැකි ය.

රුහුණු රට කතරගම දෙවිඳුන්ට කරන පැමිණිල්ලක් වශයෙන් මෙම පද්‍ය පන්තිය නිර්මාණය වී ඇත. මුලින් ම සුරිඳුන්ගේ තේජස හා බල පරාක්‍රමය ඉදිරිපත් කොට දෙවිඳුන්ට සිදු වූ කිසියම් හානියක් ඉදිරිපත් කරයි.

දුද නොද      බිඳ
ඔද තෙද      කඳ
කඳ දෙවි      රුද    සාමිනේ
මගෙ කුකුළා නැසූ      එකා
දදය ඔබගේ පාළු      යකා

යන යෙදුමෙන් එය ප්‍රකට වේ. කතරගම දෙවිඳුන්ගේ කොඩියේ ඇත්තේ කුකුළාගේ රූපයයි. කුකුළා සොරකම් කිරීම නිසා දෙවියන්ගේ කොඩිය පාළුවී ඇත. කුකුළා ඉවත් ව ගොසිනි. කුකුළා නැතිවීමේ පඩුව කවියාට පමණක් සිදු වූවක් නොවන බවත් එයින් බරපතල ම හානිය සිදුව ඇත්තේ දෙවියන්ට ම බවත් පවසා එම සොරාට දඬුවම් දීමේ වගකීම දෙවියන්ට ම බාර දී ඇති ආකාරය අපූරු ය.

සොරාට දඬුවමක් දෙන්නැයි පමණක් නොකියා දඬුවම් නියම කිරීම ද කවියා විසින් සිදු කර ඇත. තවත් එක් කෙම්මුර දිනයක් ගතවන්නට නොදී සොරාගේ බෙල්ලට ම සිය හෙල්ලෙන් අනින්නැයි පැවසීමේ දී බස හසුරුවා ගෙන ඇති ආකාරය විසිතුරු ය.

බලා      එල්ල
හෙළුව      හෙල්ල
මුලැටු      බෙල්ල
මරු      තැනේ.

සොරාට විඳීමට සිදුවන අපහසුතාව ඉදිරිපත් කරන්නේ හාස්‍යයත් උපහාසයත් මුසුකරවමිනි. ඒ සඳහා කවියා තම කාව්‍ය භාෂාව උපයෝගී කරගෙන ඇති ආකාරය විමසීමට ලක් කළ යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

දිගට ඇදී
නැගෑ පෑහැදී
මහ හඬ දී
දෙවියනේ.
රනින් කැකුළු රුවක් පුදමි
රිදියෙන් බිප්පුවටක් පුදමි
රන් දුනු හී දෙකක් පුදමි
රුවට රිදී රුවක් පුදමි

වැනි යෙදුම් අවධානයට යොමු විය යුතු ය.

ගැමි වහර යොදා ගැනීම පිළිබඳ ව කවියා දක්වා ඇති කුසලතාව විමසිය යුතු වේ.

නැසූ එකා
පාළු යකා
දිනක් නකා
නොදී මකා

වැනි පදත් මරුතැනේ, - පොළොව, උලා, වැනි පදත් සැලකිල්ලට ගත යුතු වේ.

4.8.2 අභිමතාර්ථ

- කවියා සහ ඔහුගේ වෙනත් නිර්මාණ පිළිබඳ ව තොරතුරු සොයා බැලීම
- කවියාගේ කාව්‍යමය බස්වහර තුළ ඇති සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම
- පද්‍ය පන්තියේ රස ජනනය සඳහා යොදාගත් අවස්ථා පිළිබඳ ව අවබෝධයක්

4.8.3 අභිමතාර්ථ සාධනය

4.8.3.1 ප්‍රවේශය

- දේවාලයක කෙරෙන කන්නලව්වක් පන්තියට ඉදිරිපත් කිරීමෙන්
- සිසුන් සමඟ කෙරෙන සාකච්ඡාවකින් හෝ
- ඔබට කැමති සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.

4.8.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පද්‍ය පන්තිය කීපවරක් ගායනා කරවීම
- කවියා පිළිබඳ ව හඳුනා ගැනීමට සැලැස්වීම
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතුකර දැක්වීම
- හාසය හා උපාහාසය මතු කිරීම සඳහා කවියා සිය කවි බස හසුරුවාගෙන ඇති ආකාරය විමසමින් පද්‍ය පන්තිය රස විඳීම
- සිසුනට දුරවබෝධ වචන හා යෙදුම් පැහැදිලි කරදීම
- පද්‍ය නිර්මාණයට යොමු කරවීම

4.8.4 ඇගයීම / තක්සේරුව

- රැපියල් තෙන්නකෝන් කවියා සහ ඔහුගේ පද්‍ය නිර්මාණ පිළිබඳව විමසා බැලෙන අභ්‍යාසයක් ලියැවීම.
- හෑවිල්ල පද්‍ය පන්තියෙන් හාසය හා උපාහාසය මතු කර ඇති ආකාරය හෙළි වන අභ්‍යාසයක් කරවීම

4.8.5 පරිශීලනය

- **වවුලුව** - රැ- තෙන්නකෝන්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.9 මගේ රට

### 4.9.1 හැඳින්වීම

වඩාත් ලිහිල් බසින් කාව්‍යකරණයෙහි යෙදීමට ප්‍රිය කළ කවියෙකි, පී.බී. අල්විස් පෙරේරා. විසිවන සියවසේ සිංහල පද්‍යයෙහි දෙවන භාගයට අයත් මොහු උපත ලැබුවේ 1917 මාර්තු 03 වැනි දින කොළඹ කොල්ලුපිටියේ පල්ලියවත්තේ දී ය. සාම්ප්‍රදායික කාව්‍ය මාර්ගයෙන් පෝෂණය වුවද එයට වහල් නොවී තමන්ගේ ම සරල කාව්‍ය සම්ප්‍රදායක් අනුගමනය කරමින් සිය නිර්මාණකරණයෙහි යෙදීම මෙතුමාගේ විශේෂ ලක්ෂණයකි. අගනුවර තරුණ කවි සමාජයේ සභාපතිවරයා වශයෙන් ද කටයුතු කළ පී.බී. අල්විස් පෙරේරා සිය ප්‍රථම කාව්‍ය සංග්‍රහය "**උක් දඬු දුන්න**" නමින් 1942 දී පළ කෙළේ ය. ඊට අමතර ව සාර්ථක පද්‍ය නිර්මාණ කීපයක් ද රචනා කළේ ය. "**සොබා දහම, අපේ හටන, වේදනාව, ළමයින්ගේ සුරපුර, මියගිය කිරිල්ලී, සංවාදය, අන්ධ කවියා, මිණි පහණ, දෙව්ලොව ගිය කම්මැලියා, ජන්මභූමි, අඳුරු සිහිනය, සුවඳ විලවුන්, සුදු මැණිකෙ**" යනු ඒ අතර ඇති ප්‍රධාන පද්‍ය පන්ති කිහිපයකි. "**ස්වදේශ මිත්‍රයා, ලංකාදීප, දිනමිණ**" ආදී පුවත්පත් හා සඟරාවලට සම්බන්ධ වෙමින් පුවත්පත් කලාවේදියෙකු ලෙස ද කටයුතු කළ මෙතුමා, සමකාලීන සමාජ වාතාවරණය පසුබිම් කොට කළ නිර්මාණයකි "**මගේ රට**".

දේශානුරාගී හැඟීම් මතු කළ යුතු යුගයක ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් සමකාලීන සමාජ අවශ්‍යතාවන් සපුරාලීමට කළ උත්සාහයක් ලෙස මගේ රට නම් පද්‍ය නිර්මාණය හැඳින්විය හැකි ය. කවර දේශයක් ජාත භූමි කොට ගත්ත ද එම භූමිය පිළිබඳ ව සිතිය යුත්තේ තම මව හා සමාන ලෙසිනි. දේශානුරාගී හැඟීම් ජනිත වන ආකාරයෙන් ඉතා සරල ව එහෙත් සිත් ගන්නා සුලු ආකාරයෙන් වර්ණනා කිරීමට කවියා සමත් වෙයි. ශ්‍රී ලංකාව තුළ පවත්නා ස්වාභාවික සෞන්දර්යය උද්දීපනය වන ලෙස, තුරුලතා, ගංගා දියඇලි, ඇළදොළ, වන, උයන් ගොමු, තුරු වදුල්, මහ සයුර, පස් පියුමෙන් සුසැදි විල්, කුරුලු නද, බමර ගුමු ගුමුව ආදිය වර්ණනා කරයි. එපමණකුදු නොව සැදී ඉදුණු අඹ, දඹ, පේර, වැල වරකා, අන්නාසි, රඹුටන්, දිවුල්, බෙලි, මොර, ඈ අමරස වෑහෙන පළතුරු ද, සුවදායක සම සීතෝෂ්ණ දේශගුණය ද නිල්ල දිලෙන කෙත් යාය ද, සංකල්ප රූප ජනනය වන ආකාරයෙන් පෙන්වා දෙයි. සිය ගණන් වැව්වලින් තෙත් වූ සාර භූමිය අපේ සශ්‍රීකත්වයට සාධකයි. මතු ද නොව අවුකන, ගල්වෙහෙර, සීගිරිය, ලෝවාමාපාය, රජරට නටබුන්, ලොවට ම කියාපාන්නේ සිරිලක අතීත ශ්‍රී විභූතියයි. දේශයේ අභිමානයයි. මෙවන් දෙයින් ආඪ්‍ය මේ දේශය ශ්‍රී දළදා මාලිගාවෙන් පූජනීයත්වයට පත්වෙයි. සියල්ලේ සංකලනය වූ මේ රට ලොව අන් රටකට නොදෙවෙනි වනවා පමණක් නොව දණ බිම ඔබා සදා නැමැදුමට ද සුදුසු බව කවියා වඩාත් සංවේදීව ඉදිරිපත් කරයි.

### 4.9.2 අභිමතාර්ථ

- පී.බී. අල්විස් පෙරේරා හා ඔහුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ ව විමසා බැලීම.
- මගේ රට පද්‍ය පන්තිය තුළින් කවියා මතු කිරීමට බලාපොරොත්තු වූ අරමුණු පිළිබඳ ව සොයා බැලීම.
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතු කොට දැක්වීම
- කවියා යොදා ගත් කාව්‍යමය උපක්‍රම හඳුනා ගැනීම
- පද්‍ය නිර්මාණයට යොමු කරවීම.

4.9.3 අභිමතාර්ථ සාධනය

4.9.3.1 ප්‍රවේශය

- තේමාවට අදාළ වෙනත් ගීතයක් හෝ පද්‍ය නිර්මාණයක් ඉදිරිපත් කරමින්
- දේශාභිමානය ඇති වන ආකාරයේ අවස්ථා, සිද්ධි හා පුද්ගලයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමින්
- පද්‍ය නිර්මාණයට පාදක වූ සමාජ වතාවරණය පැහැදිලි කරමින්

4.9.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කේවල ව හෝ සාමූහික ව තාලානුරූප ව පද්‍ය ගායනයෙහි නිරත කරවීම
- භාෂාව හා කාව්‍යමය ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කිරීම
- සාහිත්‍යමය රස ජනනය සඳහා යොදාගත් කාව්‍යමය උප කාව්‍යමය උපක්‍රම වූ පිළිබඳ අවධානය කිරීම
- පද්‍ය නිර්මාණයේ ඇති දේශාභිමානී හැඟීම් ජනනය වන අවස්ථා ඓතිහාසික, පාරිසරික, දේශගුණික ආදී අංශ යටතේ ගොනුගත කිරීම

4.9.4 තක්සේරුව/ ඇගයීම

- දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය නිර්මාණයක් රචනා කරවීම
- මෙම තේමාව යටතේ නිර්මාණය වුණු ගීත පද්‍ය නිර්මාණ එකතු කොට කියවා
- සංග්‍රහයක් ලෙස නිර්මාණය කරවීම (පන්ති මට්ටමින්).

4.9.5 පරිශීලනය

- **නූතන කාව්‍ය සංග්‍රහය** - ආරිය රාජකරුණා

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.10 පිටිසර ළමයෙක්

### 4.10.1 හැඳින්වීම

කොළඹ යුගයේ සිංහල පද්‍යයේ ද්විතීය භාගය නියෝජනය කළ කවියෙකි, මීමන ප්‍රේමතිලක. නව අත්හදා බැලීම් කරමින් කොළඹ යුගයේ කවිය ප්‍රචලිත කිරීමට උත්සාහ ගත් මෙතුමා නව කාව්‍ය උපක්‍රම ප්‍රයෝජනයට ගත්තේ ය. චිරන්තන පද්‍ය සම්ප්‍රදාය ඉවත නොදා, එය අධ්‍යයනය කොට එහි ආභාසය ලැබී ය. මීමන ප්‍රේමතිලකයන්ගේ නිර්මාණ කෞශල්‍යය අංශ දෙකක් යටතේ ප්‍රකට විය. එක් අංශයක් වූයේ බටහිර කවියෙහි අභාසය ලබමින් ගොඩ නගාගත් කවි කතා අනුවර්තන කලාවයි. දෙවැන්න වූයේ ශෘංගාරාත්මක පද්‍ය රචනයයි. මෙයින් අපර දිග කාව්‍යාභාසය වැඩි බලපෑමක් එල්ල කළ බව පෙනෙයි. **සුසාන කාව්‍යය 'සොහොන් බිම' 'කිරිහාමි' 'ගමේ ගතිය' 'යමුනා' 'දෙවැනි ආදරය' 'සුරපුර'** ආදී කවි කතා සියල්ල ඉංග්‍රිසි කවියෙහි අනුවර්තන යි. මීට අමතර ව ඔහුගේ කාව්‍ය තේමාවන් වූයේ ස්ත්‍රිය, ආදරය, ගම, ස්වභාව සෞන්දර්යය, සමාජ පන්ති භේදය, ආදිය යි. **ශ්‍රී ලංකා, මිනිසා, නෙළුම් කැකුළු, අන්ධ ළමයා, අඹ මල්, පඬුර, පෙම් රාජිනී, වනගත කවිය, ජීවන ගංගා, ආදරය, රන් සාගරය** යන කෘතීන් ඊට නිදසුන් ලෙස දැක්විය හැකි ය. මීමන නම් ගම්පියස ජාත භූමිය කොට ගනිමින් 1918 සැප්තැම්බර් මස 20 වැනි දින මෙතුමා උපත ලැබි ය.

"**පිටිසර ළමයෙක්**" නම් පද්‍ය කීපය උපුටා ගැනෙන්නේ මීමන ප්‍රේමතිලක කවියාගේ "**කිරිහාමි**" නම් කවි කතාවෙනි. මෙම කෘතිය 1949 රචනා වූ විලියම් වර්ඩ්ස්වර්ත්ගේ "මයිකල්" නම් ඉංග්‍රිසි කාව්‍යයේ අනුවර්තනයකි.ඉංග්‍රිසි කෘතියෙහි ඇතුළත් චරිත වන්නේ මයිකල් (පියා) ඉසබෙල් (මව) ලූක් (පුතා) ය. මේවා කිරිහාමි කවි කතාවට ගෙන ඇත්තේ කිරිහාමි (පියා) රන්මැණිකේ (මව) පුංචිරාළ (පොඩි පුතා) වශයෙනි. ඊට අමතර ව මහාරාළ නම් ලොකු පුතෙකුගේ චරිතයක් ද එක් කර ගනියි. මේ පවුලේ වාසය "හැදගම" නම් ගම්මානය යි. මෙහි ඇතුළත් කතා පුවතට අදාළ සිද්ධි හා අවස්ථා රැසකි. පුංචිරාළ නම් දසවන වියැති පුතු පිළිබඳ ව කෙරෙන වර්ණනාවක් පෙළ පොතින් නිර්දේශිත ය. ගැමි සමාජ වටපිටාවක හැදුණු වැඩුණු දරුවෙකුගේ සහජ ලක්ෂණ රැසකි. එවන් දරුවෙකු දෙමාපියනට සමාජයට සේම නිවසට ද සිරියාවකි. ගැමි සමාජ පසුබිමක හැදෙන වැඩෙන දරුවාට ඇත්තේ ඉගෙනුම පමණක් ම නොවෙයි. ඉන් පරිබාහිර ව එදිනෙදා ගත කෙරෙන ජීවිත අරගලයට මුහුණ දීමට ද සිදුවේ. ඒ සඳහා හොඳ පන්නරයක් ලැබූ දරුවකු ලෙස පුංචිරාළ චරිතය නිරූපණය කෙරේ. ඉගෙනුමෙන් පසුව ගව ආදී සතුනට අහර සෙවීම, උන් දිගේලි කිරීම, පොල්, පුවක් කැඩීම, පැළ ඉණි කැපීම, හා කුඹුරේ කොරටුවේ වැඩවල ද නිරත වන අතර යහළු යෙහෙළියන් සමඟ සෙල්ලම් කිරීමට ඇළේ දොළේ පහස ලැබීමට හා හිඹුටු මාදම් ආදියේ රස විඳීමට ද අමතක කළේ නැත. මෙවැනි පුතෙකු ලද කිරිහාමි සිය දහස්වර සතුටට පත්වෙයි. මෙම අන්තර්ගතය වඩාත් රසවත් ව උද්දීපනය කර ගැනීම සඳහා කවියා යොදා ගත් රසාස්වාදනීය අංග පිළිබඳ ව අවධානය යොමු කරමින් ළමුන් සමඟ සාකච්ඡා කළ හැකි ය. එසේ ම කාව්‍ය රසාස්වාදයට අදාළ නොවන අවස්ථා ඇත්නම් ඒ පිළිබඳව ද සොයා බැලිය හැකි ය.

### 4.10.2 අභිමතාර්ථ

- මීමන ප්‍රේමතිලක කවියා සහ ඔහුගේ පද්‍ය නිර්මාණ පිළිබඳ ව තොරතුරු සොයා බැලීම
- ඉගෙනීමට ජීවිතයේ මතු වන අභියෝග බාධාවක් නොවන බව පසක් කිරීමට කවියා ගත් උත්සාහය පිළිබඳ ව අවබෝධ කර ගැනීම.
- කාලය නිසිලෙස පරිහරණය කරමින් ක්‍රියාශීලී ව කටයුතු කරන දරුවකුගේ ස්වභාවය කවි පන්තියෙන් මතු වන අවස්ථා ද පිළිබඳ විමසා බැලීම.

4.10.3 අභිමතාර්ථ සාධනය

4.10.3.1 ප්‍රවේශය

- කිරිහාමි කවි කතාව සරලව ඉදිරිපත් කරමින්
- මීමන ප්‍රේමතිලක කවියාගේ වෙනත් ජනප්‍රිය කවි කීපයක් ගායනා කරමින්
- වෙනත් කවීන් විසින් ලියනු ලැබූ මෙවැනි කවි කතා හඳුන්වා දෙමින් (නිදසුන්: කේයස්ගේ **සුදෝසුදු)**

4.10.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි පන්තිය ගායනා කරවීම
- පුංචිරාළගේ චරිත ලක්ෂණ ගැන සාකච්ඡා කිරීම
- පුංචිරාළගෙන් වර්තමාන ළමා පරපුර සඳහා ගත හැකි උපදේශ සොයා බැලීමට යොමු කිරීම
- කාව්‍යමය ලක්ෂණ ගැන අවධානය යොමු කරවීම
- තමන් සිත්ගත් අවස්ථා මතු කරමින් ඒවා රසවත් වූ අයුරු සාකච්ඡා කිරීම.

4.10.4 තක්සේරුව/ ඇගයීම

- පුංචිරාළගේ චරිතයෙහි ඇති චරිත ලක්ෂණ පෙළ ගැස්වීම කණ්ඩායම් ක්‍රියාකාරකමක් වශයෙන්
- වර්තමාන ශිෂ්‍ය පරම්පරාවට පුංචිරාළගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පෙළගස්වා ලිවීම
- පුංචි රාළගේ කඩිසරකම රසවත් ව දැක්වීම සඳහා භාෂාව යොදාගත් අයුරු මතුකර දැක්වීම.
- කාව්‍ය නිර්මාණකරණයට යොමු කිරීම

4.10.5 පරිශීලනය

- **සුදෝ සුදු** - කේයස්
- සිරිමත් මගෙ සකි - යහපත් ළමයෙකි, කවි පන්තිය - කුමාරතුංග මුනිදාස4.11 දුප්පත් ළමයෙක්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.11 දුප්පත් ළමයෙක්

### 4.11.1 හැඳින්වීම

කොළඹ යුගයේ කවීන් අතර නමක් දිනාගත් කවියෙකි, කේයස්, 1908 මාර්තුවල කලල් ඇල්ලේ කොස්සින්න ගමේ උපන් මේ කවියා දෙවරක් ම පැවිදි බව ලබා දෙවන වරට ද උපැවිදි වූ අයෙකි. පළමු වන වර කලල්ඇල්ලේ පේමානන්ද නමින් පැවිදි වී මද කලකින් උපැවිදි ව පසුව හිතවත් අයගේ බල කිරීම මත බලංගොඩ ආනන්ද මෛත්‍රෙය හිමියන් වෙත කලල්ඇල්ලේ ආනන්ද සාගර නමින් නැවත පැවිදි වී ය. කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනින් ඉගෙනුම ලැබූ සාගර හිමි එස්. මහින්ද හිමියන් සමඟ එක් වී 1928 දී පමණ කාව්‍ය මාලනී සඟරාවෙන් සිය කාව්‍ය නිර්මාණ පළ කරන්නට විය.

පුවත් පත් සඟරා ආදියට කවි ලිවීමේ දී තමාගේ පැවිදි නාමය වන කලල් ඇල්ලේ ආනන්ද සාගර යන නම කෙටි කොට කේ.ඒ.එස්. (K.A.S.) යන ඉංග්‍රිසි අකුරු තුන යොදන්නට විය. පසුව එම අකුරු තුන එක වී කේයස් යන නම අපර නාමයක් ලෙස භාවිත වන්නට විය.

1931 දී ශාන්ති නිකේතනයට ගොස් මහා කවි රවිද්‍රනාත් තාගෝරයන්ගේ ආභාසය ලබා සිය කවිත්වය වඩාත් ඔප මට්ටම් කරගත් කේයස් හෙළදිව, මාවත, ලංකාදීප යන පුවත්පත්වල කර්තෘත්වය දරා ඇත. පුවත්පත් කලාවේදියෙක් විචාරකයෙක් කවියෙක් හා කථිකයෙක්ද වූ කේයස් හෙවත් සාගරපලන්සූරිය පාර්ලිමේන්තු මන්ත්‍රී වරයෙක් වශයෙන් දේශපාලනයට ද පිවිස ඇත.

කේයස් නම කියවත් ම නිතැතින් මතකයට නැගෙන්නේ **සුදෝසුදු** කාව්‍යයයි. 1943 දී නිර්මාණය කළ කවි කතාවක් වන **සුදෝසුදු** නිසා කේයස් තම රසිකයන් අතරට වඩාත් ම ළංවී ඇත.

මුහුදු ගිය සිය සැමියා සිහි කරමින් ළතැවෙන ආදරබර බිරිඳකගේ ජීවන සංවේදනා භාවාත්මක ලෙස ඉදිරි පත් කෙරෙන පැදිපෙළකි **ධීවර ගීතය.** මෙය ද පාඨක හදවත්වලට සමීප වූ පද්‍ය නිර්මාණයකි. **කාලකණ්ණියා, මල්හාමි, පිළිරුව, අපේ ඇත්තන්ගේ විත්ති, යාත්‍රා, විසි වුණු තරු, දෙවියන් නැති දොවොල** වැනි කාව්‍යපන්ති ඔහු පුවත්පත් සඟරා ආදියට සැපයූ නිර්මාණ අතර වේ.

"**දුප්පත් ළමයෙක්**" කවි පෙළ ද කේයස්ගේ කාව්‍ය නිර්මාණ අතර එකකි.
ගමේ අනෙක් දරුවන්ගෙන් කොන්වන ඉතා දුප්පත් ගැමි දරුවෙකු දවල් කාලයට ගමපුරා ඇවිද ගොම්මන් අඳුරේ තම බීමත් පියාට බියෙන් පෑළදොරින් ගෙපැලට රිංගාගෙන පැදුරු කඩමල්ලක සීතලේ ගුලි වී නිදා සිටින අයුරුත් මව දරුවා වෙනුවෙන් කඳුළු සලන අයුරුත් ඉදිරිපත් කරන මෙම කවි පෙළේ දී අයාලේ යන දරුවා වැඩෙන අයුරුත් ඉදිරිපත් කරයි.

පොදුජන ජීවිතයේ දුක්බර තැන්වලට කවි ඇස යොමුකළ කවීන් අතර ඉදිරියෙන් සිටින කේයස් කවියා උක්ත කතාපුවත මගින් දරිද්‍රතාවයේ පතුලට ම ගොස් සිටින දරුවාත් ඒ දරුවා ගැන මව නිරතුරු ඒ දරුවා දුක්වන ආකාරයත් පෙන්වා දෙන අතර එම දරිද්‍රතාවට හේතුව කුමක් ද යන්නත් නොකියා කියා ඇති බව පෙනේ.

අසරණ දරිද්‍රතාව නිසා ම මේ දරුවාට ගමේ දරුවන් අතර ද ඉඩක් නොමැත.

| | |
|---|---|
| ගම් දරුවන් තරග වැද තාලය | අල්ලා |
| බැඳගෙන පදිද්දී උඩ යන | ඔන්චිල්ලා |
| වැඩක් නැති නිසා එය පදිනට | ඉල්ලා |
| බලා සිටිනවා මේ දුප්පත් | කොල්ලා |

යන කවියෙන් ඒ බව පැහැදිලි වේ.

දවල් කාලය පුරා ම ගමේ තැන තැන ඇවිදීමට මේ දරුවා යොමු වී ඇත්තේ ගෙදර පරිසරය ඔහුට අම්හිරි වී ඇති නිසා විය හැක. එයට හේතුව බීමත් පියා බව කවියා සඟවා පවසයි.

| | |
|---|---|
| බීගත් පියා සමහර විට ගෙදර | පොරේ |
| මේ ගේ තමා උගෙ දුප්පත් මවගෙ | හිරේ |

යන යෙදුමෙන් එය සනාථ වේ.

ගෙදර ඇති දිළිඳු බව කොපමණ ද යන්න කවියා එක් කවියකින් පෙන්වා දෙන්නේ මෙසේ ය.

| | | |
|---|---|---|
| කඩමලු පැදුර ගෙයි මුල්ලක | එලා | ගෙන |
| සීතල නිසා අත පය වක | ගසා | ගෙන |
| වැතිරී නිදන කොලුවා දෙස | බලා | ගෙන |
| අම්මා කඳුළු වගුරයි දුක | දරා | ගෙන |

කවි පන්තියේ යෙදී ඇති කඩමලු පැදුර, අත - පය වක ගසාගෙන, කඳුළු වගුරයි, හිරේ යන යෙදුම් කෙරෙහි අවධානය යොමුවිය යුතු ව ඇත.

දරුවකුට ලැබිය යුතු මා - පිය සෙනෙහස, රැකවරණය, කායික මානසික සන්තෘප්ත-බව, නො ලැබෙන විට, එම දරුවාගේ ප්‍රතික්‍රියා සමාජයට අහිත කර ලෙස බලපාන බව ද කවියා ඉදිරිපත් කරයි.

| | |
|---|---|
| ඇඟපත කොරළ ගැල වී ලේ මස් | වැඩිය |
| දෙ ඇස ද තියුණු වී මහතින් දොඹ | ගෙඩිය |
| සවි බල ලැබී සිරුර ද අත පය | දඬිය |
| තරමක් දුරට කොලුවා දැන් | තක්කඩිය |

සමස්තයක් ලෙස ගත් විට කවි පන්තියෙන් කරුණා රසය මතු කෙරෙන බව දැක්විය හැකි ය. කවියා යොදා ගෙන ඇති පද මාලාව, භාෂාව, රූපක ආදිය කෙරෙහි අවධානය යොමුකරවීම අවශ්‍ය වේ.

### 4.11.2 අභිමතාර්ථ

- කේයස් කවියා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ ව විමසා බැලීම
- පැදිපෙළ තාලානුරූප ව ගායනා කිරීම
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතුකර දැක්වීම
- පද්‍ය පන්තිය රස විඳීමට සැලැස්වීම
- පද්‍ය නිර්මාණයට යොමු කිරීම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.11.3 අභිමතාර්ථ සාධනය

4.11.3.1 ප්‍රවේශය

- ගොඩමඩ දෙක ම සරු සාරය පළ බරය වැනි කේයස් කවියාගේ **සුදෝ සුදු** කාව්‍යයේ හෝ **ධීවරී ගීතයේ** කවියක් මිහිරි ලෙස ගායනා කිරීමෙන්
- තමන් දැක පුරුදු දුප්පත් නිවසක ස්වභාවය විමසමින්
- සමාජ හා ආර්ථික දුෂ්කරතා නිසා දුප්පත් මිනිසුනට විඳින්නට සිදුවන විවිධ ගැහැට ගැන සාකච්ඡා කරමින්.
- ගුරුතුමා / ගුරුතුමිය වෙනත් සුදුසු ප්‍රවේශයක් ලබා ගනිමින්

4.11.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි පන්තිය කණ්ඩායම් වශයෙන් ගායනා කරවීම
- එක් එක් සිසුනට තමා සිත්ගත් කවිය ගායනා කිරීමට සලස්වා එම කවිය එසේ සිත් ගැනීමට හේතු විමසා ඒ පිළිබඳ අනෙක් සිසුන්ගේ ද අදහස් ලබා ගනිමින් සාකච්ඡාවක් කිරීම.
- කේයස් කවියාගේ ජීවන තොරතුරු හා ඔහුගේ නිර්මාණ පිළිබඳ ව කරුණු එක්රැස් කිරීම
- කවි පන්තියේ අන්තර්ගතය මතුකොට දැක්වීම
- දරුවාගේ දුප්පත්කමට හේතු කවි පන්තියෙන් මතු වන්නේ දැයි විමසා බලා එම සමාජ ප්‍රශ්න පිළිබඳ ව සාකච්ඡා කිරීම
- කවි පන්තිය රස විඳීමට සැලැස්වීම

4.11.4 තක්සේරුව/ ඇගයීම

- කේයස් කවියා සහ ඔහුගේ නිර්මාණ පිළිබඳව විමසා බැලෙන අභ්‍යාසයක් කරවීම
- 5 - 6 - 7 කවිවලින් කියැවෙන පරිදි අම්මාගේ හඬා වැටීමටත් දරුවා නින්දේදී කරන විවිධ ක්‍රියාකාරකම්වලටත් හේතු විමසමින් ප්‍රශ්න කීපයකට පිළිතුරු ලබා ගැනීම.
- සිසුන් ලබා ඇති මෙබඳු අත්දැකීමක් ආශ්‍රයෙන් පද්‍ය කීපයක් නිර්මාණය කරවීම

4.11.5 පරිශීලනය

- ධීවරී ගීතය - කේයස්
- සුදෝ සුදු - කේයස්
- කාලකණ්ණියා- කේයස්

## 4.12 කුරුලු කූඩුවක්

### 4.12.1 හැඳින්වීම

1918 වසරේ කළුතර කුඩලිගම දී උපත ලැබූ එච්.එම්. කුඩලිගම 13 වැනි වියේ දී ම කවි දිවිය අරඹා ඇත. ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ කුඩලිගම පිරිවෙන් අධ්‍යාපනයෙන් ද පෝෂණය ලබා ඇත. ඔහුගේ කවි සිතුවිලි අවදි වී ඇත්තේ පිරිවෙන් අධ්‍යාපනය ලබන කාලයේ දී ය. **මීවදය, දේදුන්න, සුවඳ, චින්තන** ආදී මෙකල කවීන් වෙනුවෙන් පවත්වා ගෙන ගිය කවි සඟරාවලට කවි ලිවීම සඳහා ඔහු පෙළඹී ඇත.

කපිල සෙනෙවිරත්න කවියා සමඟ එක් ව '**සුවඳ**' කවි සඟරාව සැකසූ අතර කපිල සෙනෙවිරත්නයන්ගේ අභාවයෙන් පසු එය පවත්වා ගෙන යාම ද සිදුව ඇත්තේ මොහු අතිනි.

ස්වභාව ධර්මයට සජීවී බවක් එක් කොට කවියාත් ස්වභාව ධර්මයත් අතර සබඳතාවක් දැක්වීමට උත්සාහ කළ කවියෙකි කුඩලිගම. මොහු විසින් පළ කරන "**ඈ**" කාව්‍ය ග්‍රන්ථය එම යුගයේ කවීන්ට මහත් ආලෝකයක් වූවක් මෙන් ම ඔහුගේ කවිත්වය හඳුනා ගැනීමට ද උපකාරයක් වී ඇත. **කුණාටුව, සිරිමලී**, ඔහුගේ අනෙක් කාව්‍ය සංග්‍රහ වේ. ස්වභාවය ධර්මය වර්ණනා කරන කාව්‍ය රචනා කීපයක් ම මෙහි ඇතුළත් වේ. **ගංගාවේ ගීතය, කුරුලු කූඩුවක්, ඉව ඔස්සේ, ඇය හමුවීම, සුබසීනය, කවියාගේ සොහොන, සවන්දීම, තරුඑළිය, එම්බා මුහුද,** ඒ අතර වේ.

සෞන්දර්ය වර්ණනාවල දී ඔහු උපයෝගි කර ගන්නා විචිත්‍ර පදමාලාව නිසා කුඩලිගමගේ කවි අලංකාර වී ඇත. සොබා දහමේ සොඳුරු බවත්, ජීවිතයේ යථාර්ථය මැනවින් අවබෝධ කර ගනිමින් රසවත් නිර්මාණ කළ කුඩලිගම කවියාට ලංකාවේ ෂෙලී යන අපර නාමයක් එක් ව ඇත.

**කුරුලු කූඩුව** ඔහුගේ එක් පද්‍ය නිර්මාණයකි. පරිසරයෙන් ලද අත්දැකීමත් සිය කාව්‍ය සංකල්පනාත් මානව චර්යාවන් සමඟ ගළපමින් තම ආකල්ප ඉදිරිපත් කිරීම මෙම පද්‍ය පන්තියේ අරමුණ වී ඇත. කුරුලු කූඩුව ඉදිකරන්නේ කුරුල්ලා නොව කිරිල්ලියයි. කූඩුවක වැඩි අවශ්‍යතාව ඇත්තේ කිරිල්ලියටයි. ඒ තම කැදැල්ල සම්පූර්ණ කර ගැනීමටයි. එනම් බිත්තර දමා ආරක්ෂා කොට දරුවන් ඇති කර ගැනීමටයි. මේ බව පද්‍ය පන්තියේ ආරම්භයේ දී ම කවියා දක්වයි.

ලස්සන කිරිල්ලියක් වන ලැහැබකට ගියා
දිටියෙමි ඇගේ කූඩුව කොතැනක ද කියා

කුරුලු කූඩුවේ ආරක්ෂාව ගැන කිරිල්ලිය සොයා බැලූ ආකාරය මේ කවියෙන් කියැවේ.

නොපොවන පරිදි මිනිහෙකුගේ පියවි ඇස
ළැහැබෙහි කූඩා පඳුරක අතු රිකිලි හිස

කුරුලු කූඩුවේ නිමාව ගැන තුන්වන කවියෙන් කියැවෙයි. සොබාදහමේ දායා ද එක්රැස් කර ගෙන අපූරු නිර්මාණයක් කරයි. මෙහිදී කූඩුවේ සුන්දරත්වය සැප පහසුකම මෙන් ම ආරක්ෂාව ගැන ද සිතා ඇති බව පෙනේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

අමු කොළවල ම පාටින් ඉවතට නොයන
දිය පෙඳ පාසි බිතු රස අඳුනක නයන

අමු කොළවල පාටින් කූඩුව තනා ගැනීමට අදහස් කර ඇත්තේ විශේෂයෙන් ආරක්ෂාව සලකා ගෙන ය. එසේ ම දොර පියන සඳහා යොදා ගත්තේ ද කැකුළු මල් පොකුරකි. මේ නිසා කිසිවකුට මෙය කුරුළු කූඩුවක් ලෙස පහසුවෙන් සොයා ගත හැකි නො වේ.

"නොපොවන පරිදි මිනිසෙකුගේ පියවි ඇස," යන යෙදුම සමඟ සසඳා බැලීමෙන් ඒ බව තහවුරු කරගත හැකි වේ.

හතර වන පද්‍යයෙන් තවදුරටත් කුරුළු කූඩුවේ සුන්දරත්වය හා සුරක්ෂිත බවත් ගැන කියන කවියා එබඳු ගෙයක් තමා ද පතන බව පවසයි. ස්වභාව ධර්මයෙන් මොවුනට ලැබී ඇති දායා ද නිසිසේ ප්‍රයෝජනයට ගෙන නිදහස් සුවයක් විඳින අයුරුත් මානව සමාජයේ පවත්නා දුර්ගුණ මෙම කුරුළු සමාජයේ නොමැති බවත් 5 - 6 පද්‍යවලින් පවසන්නේ මානව සමාජයේ ද දුබලතා ද මතු කර දක්වමිනි.
"උරුමය අනුව ඔවුනට මහ පොළොව මත
හැම සැප පහසුව ම නොඅඩුව ලැබෙනු ඇත."

මහ පොළොවේ සහ ඒ මත පිහිටි සියලු සැප පහසුකම් සොබා දහමේ දායාද ලෙස කුරුළු (සත්ව) සමාජයට පමණක් නොව මානව සමාජයට ද ලැබී ඇත. එහෙත් මිනිසා ඒවා නිසි පරිදි පරිහරණය කරනු වෙනුවට සිදු කරන්නේ අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමයි. මෙම දුබලතාව කුරුළු සමාජයේ නොමැති බව.

එය තව එකෙකු උදුරන්නට දරන තැත
මෙහි කිසි තැනක කිසිවකු හට පුරුදු නැත

යනුවෙන් කවියා වක්‍රෝක්තියෙන් කියා ඇත.

කුරුළු කැදැල්ලේ පවත්නා සතුට සාමය එකමුතුකම හා සුවය ගැන කියන කවියා එයට කොතරම් ඇලුම් කළේ ද යන්න තමාට ද එහි එක පැයක උණුසුමක් ලබා දෙන ලෙස කරන ආයාචනයෙන් පෙනේ.

පවුල් ජීවිතයක පැවතිය යුතු අන්‍යෝන්‍ය අවබෝධය හා අඹු - සැමි යුතුකම් ගැන අවසාන පද්‍යයෙන් පෙන්වා දෙයි.

පියා පවුලේ සාමාජිකයන්ට අවශ්‍ය ආහාර සොයා ගෙන ඒම, බිරිඳ පෙර ගමන් ගොස් ඔහු පිළිගැනීම හා මිහිරි වචනයෙන් සතුටු කරවීම කොතරම් අපූරු ද? කැදැල්ලේ සාමයට හා සතුටට මෙය කොතරම් වැදගත් වේද? මේ තුළින් මානව සමාජය වෙත හෙළන දෘෂ්ටිය කෙතරම් අර්ථවත් දැයි සිතා බැලිය යුතු වේ.

පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියා යොදා ගෙන ඇති කාව්‍යමය භාෂාව, උපමා ආදී කාව්‍යෝපක්‍රම පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

මල් කැකුලකට නෑකම් ඇති තුඩග
අමු කොළවල ම පාට
දිය පෙඳ පාසි බිතු
මායා සිහිනයක හැඩහුරුකම්
පිනිබර කැකුළු මල් පොකුරකි දොර පියන
මිණි කිකිණියකි හඬ
හුරතල් කිරිල්ලිය සංගීතය දුන්නා

වැනි යෙදුම් පිළිබඳ ව අවධානය යොමු කළ යුතු වේ.

4.12.2 අභිමතාර්ථ

- එච්. එම්. කුඩලිගම කවියා සහ ඔහුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමසා බැලීම
- කුඩලිගම කවියාගේ කාව්‍ය නිර්මාණවල ඇති විශේෂත්වය සොයා බැලීම
- පද්‍ය පන්තිය ගායනා කිරීම
- පද්‍ය පන්තියේ අන්ගතර්ගතය මතුකොට දැක්වීම
- කවියා යොදා ගෙන ඇති කාව්‍යෝපක්‍රම උපයෝගි කර ගනිමින් පද්‍ය පන්තිය රසවිඳීම.
- පද්‍ය නිර්මාණයට යොමු කරවීම

4.12.3 අභිමතාර්ථ සාධනය

4.12.3.1 ප්‍රවේශය

- එක් පද්‍යයක් තෝරා ගෙන සිසුවෙකු ලවා ගායනයට සැලැස්වීමෙන්
- කුඩලිගම කවියාගේ වෙනත් කවියක් ගායනා කිරීමෙන්
- ඔබට අභිමත වෙනත් සුදුසු ප්‍රවේශයක් තෝරා ගන්න.

4.12.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි පන්තිය සිසුන් ලවා ගායනා කරවීම
- කුඩලිගම කවියාගේ ජීවන තොරතුරු ඔහුගේ කාව්‍ය නිර්මාණ හා ඒවායේ විශේෂතා පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් සිසුන් සමඟ සාකච්ඡා කිරීම
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතු කොට දක්වමින් කවියා කුරුලු කැදැල්ල මඟින් මානව සමාජයට හෙළන දෘෂ්ටිය පිළිබඳ ව විමසීමක් කිරීම
- කවියා යොදාගෙන ඇති කාව්‍යෝපක්‍රම මතු කරමින් පද්‍ය පන්තිය රස විඳීමට සැලැස්වීම.

4.12.4 තක්සේරුව/ ඇගයීම

- කුඩලිගම කවියාගේ සුවිශේෂ කාව්‍ය ලක්ෂණ විමසා බැලෙන අභ්‍යාසයක් ලියවීම
- "කුරුලු ලොවින් අපේ ලොවට" මැයෙන් පැවරුමක් කරවීම
- සොබා දහමේ සරල සිදුවීමක් යටතේ කෙටි පද්‍ය පන්තියක් නිර්මාණය කරවීම

4.12.5 පරිශීලනය

- සිරිමලී - එච්.එම්. කුඩලිගම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.13 කාසි

### 4.13.1 හැඳින්වීම

1918 වර්ෂයේ කෑගල්ලේ උඩුගොඩ නම් ගම්මානයේ දී උපන් උඩුගොඩ නවරත්න විසිවන සියවසේ කවියට වැඩි මෙහෙයක් ඉටු කළ කවියෙකි. මොහු සමාජයේ සෑම තරාතිරමකට ම අයත් පුද්ගලයන්ට ගැළපෙන ලෙස කාව්‍ය නිර්මාණ කළ ද ඉන් වඩාත් අවධානය යොමු කර ඇත්තේ ළමා මනසට ගැළපෙන නිර්මාණ කෙරෙහි ය. **සූර්යයා, මාළුවෝ, මුහුද, සමනලයා,** වැනි නිර්මාණ ඊට සාධකයි. මීට අමතර ව **නවෝදය හා නවරත්න** රචනා නමින් පාසල් පාඨ ග්‍රන්ථාවලියක් ද සම්පාදනය කළේ ය. "**සුදු**" කවි කතාව, බොර වතුර, යන කාව්‍ය සංග්‍රහ දෙක ද එතුමාගේ කවිත්වය නිරූපණය කරන කෘතිය. කවියෙකු වශයෙන් පමණක් නොව නවකතා කරුවෙකු ලෙස ද යම් මෙහෙයක් ඉටු කළ කවියෙකි උඩුගොඩ නවරත්න.

සමකාලීන සමාජ විවරණය මුල්කොට ගනිමින් ඔහු විසින් ලියන ලද පද්‍ය නිර්මාණයකි '**කාසි**' යන්න. '**මුදල**' යන්න ඉස්මතු වී සමාජ හර පද්ධතීන් යට යන අයුරු විදහා පෑමට මෙහිදී උත්සාහ ගනියි. රජ මැති ඇමතිවරුන් අත පමණක් නොව දුගී මගී යාචකදීන්ගේ දෑත්වල සංසරණය වන මුදල දුරාචාරයේ යෙදුණ ස්ත්‍රියක හා සමාන කර දක්වයි. මුදල පිළිබඳ ව කවර තරාතිරමක අයෙකු වුවද දක්වන සැලකිල්ල ඉන් කියන්නට වෙර දරයි. එනිසා ම එක් මුහුණක් කාසියට ඇතත් අත් කකුල් දහස් ගණනක් ඇත. විශාල පිරිසකගේ අතිනතට යයි. එම කාසිය ම වරෙක සුරපුරය ද වරෙක අවපුරය ද මිනිසා අබියස මවාපායි. එවැන්නක් වෙනුවෙන් මිනිසා තම මිනිස්කම ද පාවා දී තිරිසන් ගතිලක්ෂණ ප්‍රකට කරයි. එනිසා කාසියට, මුදලට, ධනයට අර්ථයක් දෙන්නේ එහි නිෂ්පාදිත ලෝහමය හෝ මුල්‍යමය වටිනාකම නොව මිනිසාගේ දහදිය යි. ඒ බැව් නොසලකා තිරිසනෙකු ද ප්‍රිය නොකරන මුදල නිසා සමාජය තිරිසන් ගතිලක්ෂණ ප්‍රදර්ශනය කරන අයුරු අපූර්වත්වයෙන් යුතු ව ඉදිරිපත් කරයි.

### 4.13.2 අභිමතාර්ථ

- උඩුගොඩ නවරත්න කවියා සහ ඔහුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ සරල අවබෝධයක් ලබා ගැනීම.
- ධනය මිනිසාගේ දියුණුවට මෙන් ම පරිහානියට ද හේතු වන ආකාරය සොයා බැලීම.
- සමාජ සංවර්ධන කාර්යයෙහි දී කාව්‍ය නිර්මාණයේ අන්තර්ගතය භාවිතයට ගත හැකි ආකාරය විමසීම.
- කවියෙහි එන කාව්‍ය ආකෘතිය ගැන අවධානය යොමු කිරීම

### 4.13.3 අභිමතාර්ථ සාධනය

#### 4.13.3.1 ප්‍රවේශය

- එක් පද්‍යයක් ගායනයට සලස්වා එහි ඇති ව්‍යංගාර්ථවත් අදහස සිසුන්ගෙන් මතු කර ගනිමින්.
  කාසි ප්‍රයෝජනයට ගන්නා ආකාරය හා අවස්ථා අනුව මුදල නිසා සිදුවන යහපත් හෝ අයහපත් ස්වභාවයන් පිළිබඳ සාකච්ඡා කරමින්.

4.13.3.2 ඉගෙනුම් ක්‍රියාකරම්

- පද්‍ය නිර්මාණයෙන් කියවෙන සමාජමය පණිවිඩය පිළිබඳ ව වැඩිදුර සාකච්ඡා කිරීම
- කවි පන්තියේ ඇතුළත් කාව්‍ය ආකෘතිය පිළිබඳ විමර්ශනය කිරීම
- නිර්මාණයේ ඇති රස වින්දනාත්මක අවස්ථා සාකච්ඡාවට භාජනය කිරීම
- භාෂා උපක්‍රම

4.13.4 ඇගයීම් / තක්සේරුව

- ■ මුදල් නිසා සමාජයට වන යහපත හා අයහපත පිළිබඳ ව පුවත්පතකට ලිපියක් ලියවීම
- ■ මුදල උපදින්නේ මිනිසාගේ දහඩියෙනි, යන්න තේමා කර ගෙන පද්‍ය කිපයක් නිර්මාණය කරවීම.
- ■ මුදලට වඩා මිනිස්කම වටිනා බව දැක්වීමට කවියා යෙදූ උපක්‍රම පිළිබඳව විමසීමට අභ්‍යාසයක් කරවීම

4.13.5 පරිශීලනය

- ■ **සුදු කවි කතාව කාව්‍ය සංග්‍රහය** - උඳුගොඩ නවරත්න
- ■ **බොර වතුර කාව්‍ය සංග්‍රහය** - උඳුගොඩ නවරත්න

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.14 කිරාගේ පවුල

### 4.14.1 හැඳින්වීම

කොළඹ කවියෙහි ද්විතීය භාගය නියෝජනය කළ කවියෙකු ලෙස ධර්ම ශ්‍රී කුරුප්පු මහතා හැඳින්විය හැකි ය. සමාජයේ පවතින පන්ති විෂමතාවන් හා දුප්පත් පොහොසත් භේදය පිළිබඳ වැඩි අවධානයකින් කවි ලිවීමට යොමු වූ මෙතුමා පුවත්පත් කතුවරයෙකු වශයෙන් ද සිය හැකියා ප්‍රකට කර ඇත. "**සිංහලේ**" නම් පුවත්පතෙහි කතුවරයෙකු වශයෙන් කටයුතු කිරීමෙන් ඒ බැව් වඩාත් තහවුරු වෙයි. කාව්‍ය අනුභූතීන් පිළිබඳ ව මෙන් ම කාව්‍ය ආකෘතීන් පිළිබඳ ව නව අත්දැකීම්වලට යොමු වූ මේ කවියා "**කිරාගේ පවුල**" නම් කෘතියෙන් ඒ බැව් සනාථ කරයි.

ආර්ථික අපහසුතා නිසා ගම්බද පවුලක් තුළ ඇති වන චිත්ත ස්වභාවයන් මෙන් ම භෞතික පරිහානිය ද කිරාගෙ පවුල පද්‍ය නිර්මාණය තුළින් ඉස්මතු කිරීමට උත්සාහ දරයි. එවන් දුෂ්කරතාවලින් පිරි නිවසක ප්‍රමාණය, දිරා අබල දුබල ව ගිය ආරක්ෂක වැට, හෙවිළි කළ පොල් අතු දිරා ගොස් බේරුණු ඉරටු තුළින් අහස පෙනෙන වහලය, වැටෙන ජල බිඳකිනුදු හැරෙන පොළොව. සිදුරු වී ගිය කටුමැටි බිත්ති ආදිය ඉතා සරල ව සංකේතාත්මක ව ඉදිරිපත් කරයි. මේ සංවේග ජනක පරිසරය තුළ ජීවත් වන නිවැසියන්ගේ දුක්ඛදායක ස්වරූපය ද වඩාත් සරලව කවියට නඟයි. සෙම්සොටු නොසෝදා නිරුවත් ව සිටින කිරි දරුවෝ කිසිදු අනාගත අපේක්ෂාවකින් තොරව අබලන් ව ගිය ඇඳේ වැතිර සිටින කිරා ඉගෙනුමට යොමු නොවී කුසගිනි ද දරා පැදුරේ ඇල වී සිටින වැඩිමහල් දරුවෝ කිසිදු අහරක් නො ඉදෙන ලිප දෙස බලා සිටින මව, මේ දරිද්‍රතාව තව තවත් ඉස්මතු කර පෙන්වති. වැලි කොස් ඇට හත අටකට සීමා වූ කෑම වේල ද මේ අනුවේදනීය හැඟීම් මත පදනම් වූ කරුණා රසය තවදුරටත් තහවුරු කරයි. මේ ඉදිරිපත් කිරීම සාර්ථක වීම සඳහා සරල බස් වහරින් කවර පිටුවහලක් ලැබී ඇද්දැයි තවදුරටත් විමසා බැලීම වටී. වස්තු විෂයට උචිත කාව්‍ය ආකෘතියක් තෝරා ගැනීම ද කතුවරයා තුළ පැවැති දක්ෂතාවක් ලෙස අගය කළ හැකි ය.

### 4.14.2 අභිමතාර්ථ

- සමාජ හා ආර්ථික දුෂ්කරතා නිසා දුප්පත් මිනිසුන්ට ඇති වන ඉරණම ගැන කවියා දක්වන අදහස් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම
- කරුණා රසය ඉස්මතු කරමින් පාඨක අනුකම්පාව කවි පන්තිය කෙරෙහි යොමු කරවීමට කවියා ගත් උත්සාහය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම

### 4.14.3 අභිමතාර්ථ සාධනය

#### 4.14.3.1 ප්‍රවේශය

- තමන් දැක පුරුදු දුප්පත් නිවසක ස්වභාවය විමසමින්
- සමාජ හා ආර්ථික දුෂ්කරතා නිසා දුප්පත් මිනිසුනට විඳින්නට සිදුවන විවිධ ගැහැට ගැන සාකච්ඡා කරමින්.
- ගුරුතුමාට / ගුරුතුමියට අභිමත වෙනත් සුදුසු ප්‍රවේශයක් ලබා ගනිමින්

4.14.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම

- කවි පන්තියෙහි පවතින විශේෂතා එකිනෙක විග්‍රහ කරවීම
- දුප්පත් නිවසක පවත්නා අගහිගකම් හා නිවසෙහි ස්වභාවය සාකච්ඡා කිරීම.
- පද්‍ය ගායනයට යොමු කරවීම
- පද්‍ය පන්තියෙන් නිරූපිත සමාජ රටාව හඳුනා ගැනීම

4.14.4 තක්සේරුව / ඇගයීම

- ■ දුප්පත් ගැමි පවුලක් තේමා කරගෙන ලියවුනු පද්‍ය පන්තිය තුළින් පාඨක අනුකම්පාව දිනා ගන්නා ආකාරය විමසා බැලෙන අභ්‍යාසයක්
- ■ මෙම පද්‍ය පන්තිය ඇසුරින් කෙටි කතාවක් නිර්මාණය කරවීම

4.14.5 පරිශීලනය

- ■ **නූතන පද්‍ය සංග්‍රහය** - විමල් දිසානායක

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.15 ගවපල්ලාගේ මඟුල

### 4.15.1 හැඳින්වීම

හඳ පාන්ගොඩ උපනන්ද බටුගෙදර කවියා පැරණි කාව්‍ය රචනා සම්ප්‍රදාය ආරක්ෂා කරමින් තමා විසින් ම ගොඩ නඟාගත් රචනා ශෛලියකින් කාව්‍ය නිර්මාණ කළ කවියෙකි. නූතන කවීන්ගේ සිතුම් පැතුම් හා කවිමග අනුගමනය කළ ද පැරණි සම්ප්‍රදායෙන් බැහැර වීමට මැලිවිය. ගැඹුරු අරුත් ඇති පද නිරාසයෙන් ඔහුගේ කවිවලට ඇතුළු වී ඇත.

තමා විසින් තෝරා ගනු ලබන ගැඹුරු හැඟීම් දැනවීමට උචිත වූ ව්‍යක්ත පදමාලාවකින් ප්‍රබල අරුත් පළ කිරීමට උපනන්ද කවියා සමත් වී ඇත. සාම්ප්‍රදායික විචාරය කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇති මොහුගේ රචනා ජනප්‍රියත්වයට පත් වී ඇත. උපනන්දගේ පද්‍ය නිර්මාණවල ඇත්තේ පැරණි සම්ප්‍රදායේ නවීකරණයක් යැ යි ඇතැමෙක් පවසති. "**අභිචාරිකාව**" හා "**වලාකුළ**" ඔහුගේ කාව්‍ය කෘති වේ. මොහුගේ පද්‍ය නිර්මාණ අතර ගවපල්ලාගේ මඟුල එක් නිර්මාණයකි. මෙය වන ලැහැබක තණ පිටියක සිදුවන ගවපල්ලෙකුගේ මංගල්‍ය උත්සවයක් ගැන කියැවෙන පද්‍ය පන්තියකි. ගවපල්ලා යනු ගවයන් රැකබලා ගන්නා තැනැත්තායි. ඔහුගේ ජීවිතය ගෙවී යන්නේ වනය ආශ්‍රිත වූ තණ පිටියකයි. තරුණ ගවපල්ලාට විවාහ මංගල්‍යයක් සිදු කිරීමට අවශ්‍ය වී ඇත. මෙම විවාහ මංගල්‍යය සිදුවන්නේ සුවිශේෂ මන්දිරයක තැනූ මංගල ශාලාවක නො වේ. මෙහි තොරණ, මංගල පෝරු, සැරසිලි කිසිවක් අමුතුවෙන් තනා නැත. මංගල්‍යයට සූදානම් වන විට පරිසරය ද ඒ සඳහා සූදානම් වී ඇත. වන පරිසරය එසේ සූදානම් වූ අයුරු කවියා මනාල යුවල සූදානම් වූ අයුරු සහ විවාහ මංගල්‍යය සිදු වූ අයුරු කවියා අපූර්වත්වයෙන් ඉදිරිපත් කරයි. එසේ ම එහිදී මනාලියගේ රූ සපුව වර්ණනා කිරීමට ද කවියා අමතක කර නැත.

වනයේ හා අවට පරිසරයේ සිදුවන ස්වාභාවික සංසිද්ධි කවියා තම අරමුණ ඉටුකර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ආකාරය ඉතා චමත්කාර ජනක ය.

ලස්සනයි සිරියා බරයි වනයේ　　පුස්පිතයි
　　මලුත් දැන්　　පුස්පිතයි
දික් ලියන්ගෙල රස තබා සුලු
　　ලා හිරුත් මිණිරැස්　　ඔතයි
පක්ෂියාණගෙ සිත්　　දුවයි
නෙක් දෙසේ සුළඟින්　　දුවයි

උදේ හිරු පායා එන විට ම වනයේ තුරු ලතාවල මල් පිපීම, මද සුළඟ හැමීම කුරුළු හඬ පැතිරීම සිදු වෙයි. මෙය ස්වාභාවික ය. එහෙත් කවියා දකින්නේ පරිසරය මේ මංගල උත්සවයට සූදානම් වන ලෙසිනි. මංගල ශාලාව ඉදිරිපස තොරණ ඉදි කිරීම ද, අවට විවිධ විසිතුරු වර්ණවත් මල්වලින් සැරසිලි කිරීම ද, බිමට පලස් එලීම ද සිදු වේ. මෙහිදී ඒ සියල්ල ම සිදුව ඇත. සල්, සමන් ආදී මල්, ගොක් රැහැන්, තොරණ, නිල් තණ පලස, මල් සුවඳ ආදියෙන් මඟුල් හල සැකසී ඇත.

විසිතුරු මඟුල් පෝරුවක් ද ඉදි වී ඇත. වැල් එතීමෙන් සැදුණු යන මලොලඹු, වියන දෙපස තැඹිලි මල්, කළු උක්, දොඩම් ආදියෙන් එය ඉදි වී ඇත. දෙවන පද්‍යයෙන් කෙරෙන මෙම වර්ණනාවන් නිසා සහෘද සිතෙහි අලංකාර චිත්‍රයක් මැවේ.

මීළඟට කෙරෙන්නේ මනාලියගේ රූ සපුව හා ඇය හැඩ වැඩ වී ඇති ආකාරය ඉදිරිපත් කිරීමයි. එහිදී සඳවන් මුහුණ, කොඳ කැකුළු දත්, නෙළුම් පෙති තොල්, දෙව්දුනු බැම, කිංකිණි බැඳි පා පියුම්, වශයෙන් දක්වන කවියා වටොරට උපමා නැති බව ද කියයි. රන හස තන නිලුපුල් නෙත්, "ඩැනියුබ්" ගඟ වැනි වරලස හඳුන්වා දෙන කවියා කදිම උපමා රූපක හා ශෘංගාර රසය මතු කිරීමට සමත් කවි බසක් ද උපයෝගි කරගෙන ඇත.

දෙඅත්, නළල, ගෙල රන් රුවනින් සැරසූ මනාලියගේ ගත දුහුල් සාරියකින් සරසා ඇත. පෝරුවට නැගුණු ඇය උපමා කොට ඇත්තේ සැළලිහිණියකට ය. ඇයගේ කොණ්ඩය කොඳි දෑසමන් ආදියෙන් සරසා ඇති අතර සුදු වේට්ටියක් හැඳි මනාලයාගේ හිසෙහි මල් වොටුන්නක් පළඳා ඇත.

එක් වැඩිහිටියෙකු වනමල් පෙතිවලින් තැනූ හුයකින් දෙපළගේ අතැඟිලි බැඳ රන් - රස සේ එක්ව සිටිත්වායි ආශීර්වාද කරද්දී සුවඳ ජල බිඳු ඉසීම සිදුවෙයි. මේ සමඟම වන දෙවියන්ගේ බටලී නළා හඬ පැතිරෙන්නට විය. මංගලසීනු හැඬ වූ දෙවියෝ යුවතිපතීන්ට ජය මංගල ආසිරි පතමින් කාහල නාදය පැතිර වූහ.

ස්වාභාවික සංසිද්ධියක් කවිබසට නංවා අපූර්වත්වයෙන් යුතුව ඉදිරිපත් කිරීමේ දී කවියා දක්වා ඇති කුසලතා ඇගයීමට ලක්විය යුතුව ඇත. යොදාගත් පදමාලාව ගීතවත් ය. ඊට ම අදාළ විරිතක් ද උපයෝගී කොට ගත් ඔහු සාම්ප්‍රදායික කාව්‍යෝපමා යොදා ගැනීමට ද උත්සාහ දරා ඇත.

"විල් හදේ රන් හංසයින් තන
නිල් උපුල් නෙතු රොන් රි සී
සෙල්ලුවා තුඩු රන් පටින් බැඳි
සැට්ටයත් කරමින් වි සී"

වැනි යෙදුම් ශෘගාරය ඇති කරවීමෙහි කෙතරම් සමත් වී ඇත්දැයි විමසිය යුතු වේ.

"නූලකින් වන මල් රොනින් තැනූ
මේ ජයම්පතිකා ව රුන්
ගේ සුරත් සුලඟිල්ලෙනි බැඳ
"රන් රසේ මුන් යයි හො රුන්
එක් මහල්ලෙක් සිල් ඇසින්
නෙක් සුපුල් රුක් මල් යුසින්

වැනි යෙදුම්වල ඇති ධ්වනිතාර්ථවත් බව ද සිතා බැලිය යුතු ව ඇත.

"මේ මඩුල්ලද තේ රුවයි
ඒ මඟුල් ගෙය පෝ රුවයි"
"කිංකිණි බිඟු පා පියුම්
රන් වටොරට නෑ කියුම්"
"පෝරුවේ කමලා වියන්
ඈරුවේ සැළලිණිය යන්
වැනි යෙදුම් අතරට

නිස් ලෙසේ කියයුත් වගයි
කෙස් ති සේ "ඩැනියුබ්" ගඟයි
වැනි යෙදුම්වල එක් වීම ගැන ද සිතා බැලිය යුතු වේ.



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.15.2 අභිමතාර්ථ

- උපනන්ද බටුගෙදර කවියා හා ඔහුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ ව විමසා බැලීම.
- කවියා පද්‍ය නිර්මාණයේ දී යොදාගත් භාෂාව හා කාව්‍යෝපක්‍රම පිළිබඳ හඳුනා ගැනීම
- පද්‍ය පන්තියෙහි රස ජනනය වන අවස්ථා පිළිබඳ අවබෝධ කර ගැනීම
- පද්‍ය පන්තියක් නිර්මාණය කිරීම

4.15.3 අභිමතාර්ථ සාධනය

4.15.3.1 ප්‍රවේශය

- මංගලම් ජය මංගලම් ජය මංගලම් ජය මංගලම් වැනි ගීයක් ගායනා කිරීමෙන්
- මංගල උත්සවය අවස්ථාවක තොරතුරු විමසා සිසුන් සමග කෙරෙන සාකච්ඡාවකින් වෙනත් ඔබට සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.

4.15.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි පන්තිය කීපවරක් ගායනා කරවීම
- කවියාගේ ජීවන තොරතුරු හා ඔහුගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ ව කරුණු ඉදිරිපත් කොට සාකච්ඡා කිරීම
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතු කොට දැක්වීම
- ස්වාභාවික පරිසරයක සිද්ධි ඇසුරෙන් මංගල උත්සව අවස්ථාවක් මවාපෑම සඳහා කවියා තම කවි බස හසුරුවා ගෙන ඇති ආකාරය පැහැදිලි කරමින් කවි පන්තිය රස විඳීමට සැලැස්වීම

4.15.4 තක්සේරුව/ ඇගයීම

- සොබා දහමේ සාමාන්‍ය සිදුවීම් ඇසුරු කර ගනිමින් මංගල උත්සවයක් නිර්මාණය කර ඇති ආකාරය විමසා බැලෙන අභ්‍යාසයක් කරවීම
- වන අසිරිය වැනි තේමාවක් යටතේ කෙටි පද්‍ය පන්තියක් නිර්මාණය කරවීම

4.15.5 පරිශීලනය

- **දොරට වැඩුම** පද්‍ය පන්තිය - කුමාරතුංග මුනිදාස

## 4.16 කවිකොළ කාරයා

### 4.16.1 හැඳින්වීම

වෘත්තියෙන් පොලිස් නිලධාරියෙකු වූ විල්සන් හෑගොඩ ගාල්ලේ උළුවිටිකේ උපත ලද්දෙකි. ස්වභාව ධර්මයට වඩාත් ඇලුම් කළ මොහු කවිය රූපයට නැගීමට උත්සාහ කර ඇත. මෙම උත්සාහය ඡායාරූපය බිහිවීමට ද හේතු වී ඇත. මේ නිසා ම විල්සන් හෑගොඩ කවියෙකු වශයෙන් හා ඡායාරූප ශිල්පියකු වශයෙන් කලා ක්ෂේත්‍රයට විචිත්‍රතා එකතු කළේ ය.

1956 දී "**ස්වප්න මංගල්‍යය**" නමින් කවීන්ගේ හා ලේඛකයන්ගේ අත් අකුරුත් ඡායාරූපත් එක් කොට ප්‍රදර්ශනයක් පැවැත්වී ය. **කැමරාව** හා ඡායාරූපකරණය හඳුන්වා දීම සඳහා 1961 දී "කැමරා" නමින් සඟරාවක් නිර්මාණය කළ ඔහු "කැමරා ළමා සමාජයේත්" ලංකා ජාතක ඡායාරූප කලා සංගමයේත් නිර්මාතෘවරයා ය.

අගනුවර තරුණ කවි සමාජයේ සභාපති තනතුර හොබවමින් කවියකුගෙන් ඉටුවිය යුතු යුතුකම් මැනවින් ඉටු කළ ඔහු මීවදය - දේදුන්න වැනි සඟරාවලට කවි ලිවීම ද කළේ ය.

පොලිස් නිලධාරියකු වශයෙන් රාජකාරී කටයුතුවල දී කවිය යොදාගත් ඔහු එහිදී ලබාගත් අත්දැකීම් සිය කාව්‍ය නිර්මාණවලට වස්තු විෂය කර ගෙන ඇත. කවියකු, ඡායාරූප ශිල්පියකු හා පොලිස් නිලධාරියෙකු වූ විල්සන් හෑගොඩ කලා කරුවා 1948 සැප්තැම්බර් මස 26 වන දින දැයෙන් සමුගත්තේ ය.

"**කවිකොළ කාරයා**" මේ කවියාගේ තවත් එක් කාව්‍ය නිර්මාණයකි. වැඩි දෙනෙකුගේ අවධානය යොමු නොවන දශක කීපයකට පෙර ගමේ නගරයේ සෑම තැනක ම දක්නට ලැබුන සමාජයට හුරුපුරුදු චරිතයක් මෙම කාව්‍ය නිර්මාණයේ දී වස්තු විෂය කරගෙන ඇත. වර්තමානයේ තරම් මාධ්‍ය දියුණුවක් නොපැවති එදා කවි කොළ කාරයාට හිමිව තිබුණේ ප්‍රබල මාධ්‍යවේදියකුගේ භූමිකාවකි.

කවිය මාධ්‍යය කරගෙන සිය භූමිකාවේ වගකීම් ඉටුකළ කවිකොළ කාරයාගේ චිත්‍රය රසිකයාගේ මනසෙහි සටහන් කරවීම කවි පන්තියේ පළමු කවියෙන් මැනවින් ඉටු කොට ඇත.

වම් අත කණේ කවිකොළ ටික දකුණු අත
හක්කේ බුලත්විට හපවී ඉවර නැත
නෙත් සැර වරින් වර යවමින් සෙනඟ වෙත
හඬ දී ගිරිය පාදා කවි කියනු ඇත

"එදා සමාජයේ ප්‍රබල මාධ්‍ය මධ්‍යස්ථානය බවට පත් ව තිබුණේ කවිකොළ කාරයා බව
රිය අනතුරක - සැණකෙලියක - පැසළු දොරෙන්
තොරතුරු ඇදී එයි - මොහු වෙත විදුලි සැරෙන් "

යන කියමනෙන් ඉදිරිපත් කරයි. පුවත ඉතා සුළු එකක් වුවද පාඨක අවධානය දිනා ගැනීමට හැකි වන සේ ඉදිරිපත් කිරීමට කවිකොළ කාරයා සමත් ව ඇති බව පැදි පෙළින් කියැවේ. එය ඔහුගේ නිර්මාණ හැකියාවත් ප්‍රකාශන හැකියාවත් නිසා සිදුවන්නක් බව දැක්වීමට පද්‍ය පන්තියෙන් උත්සාහ ගෙන ඇති බව දක්නට ලැබේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

"සුළු පුවතක් නමුදු ගණනට ගත නොහෙන"
"කවි වැලකට ගොතා ගෙන නව රස වැහෙන"
"මොහුගේ කට හඬට පිටු පා යා නොහැක."
වැනි යෙදුම් ගැන සැලකිලිමත් විය යුතු වේ.

කවි කොළයට ලැබුණු ප්‍රතිචාර කෙසේ ද යන්නත් පද්‍ය පන්තියෙන් ඉදිරිපත් වේ. මේ නිසා ම වෘත්තියක් වශයෙන් ද මෙය ලාභදායි බවට ඉඟි කරයි.

"කිසි මගියකුට මුණ නොගැසී සිටුනු බැරි
මොහු වට කොට බලා ඇත මහ සෙනග පිරි"

එක සත දහය ගණනේ මිල තිබුණාට
විකිණෙයි! දහස් ගණනින් සමහර දාට

4.16.2 අභිමතාර්ථ

- කවියා පිළිබඳ තොරතුරු විමසා බැලීම
- හාස්‍ය, උපාහාස්‍ය දනවන අවස්ථා පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම
- කාව්‍ය නිර්මාණය කිරීම
- ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයක් ලෙස කවියට තිබූ තැන මාතෘකාව යටතේ කථාවක් පැවැත්වීම

4.16.3 අභිමතාර්ථ සාධනය

4.16.3.1 ප්‍රවේශය

- පන්තිය එළිමහන් තැනකට ගෙන තරමක් හඬනගා "සකල සිරින් පිරි සිරි ලංකාවේ "දකුණු පළාතේ අති සොබනා" වැනි කවියක් කීමෙන්
- ඔබට අභිමත සුදුසු ප්‍රවේශයකින්

4.16..3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කවි පන්තිය ගායනා කරවීම
- කවියාගේ ජීවන තොරතුරු ඉදිරිපත් කිරීම
- කවි පන්තියේ අන්තර්ගතය මතුකොට දක්වා කවිකොළ කාරයා හඳුනා ගැනීමට සැලැස්වීම.
- කවි පන්තිය කියවමින් රසාස්වාදයේ යෙදීම
- කාව්‍ය නිර්මාණයට යොමු කරවීම

4.16.4 තක්සේරුව / ඇගයීම

- සාමාන්‍ය සිදුවීමක් කෙරෙහි වුවද සංවේදී විය හැකි මනසක් ඇති කවියකට සාර්ථක නිර්මාණයක් කළ හැකි ය. මේ ගැන අදහස් ලියන්නට හෝ කියන්නට අභ්‍යාසක් කරවීම.
- පත්‍ර කාරයා, ලියුම්කාරයා, කිරිකාරයා, වැනි මාතෘකාවක් යටතේ කුඩා පද්‍ය පන්තියක් නිර්මාණ කරවීම

4.16.5 පරිශීලනය

- **නූතන පද්‍ය සංග්‍රහය** - විමල් දිසානායක

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.17 සුරාපානය

### 4.17.1 හැඳින්වීම

රටට මහත් ව්‍යසනයක් ඇති කළ සුරාපානයේ ආදීනව දක්වමින් ගාල්ලේ ජෝන් රාජදාස කවියා කළ පද්‍ය නිර්මාණයකි **සුරාපානය.** එක් පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට පමණක් නොව මුළු මහත් සමාජයට ම විනාශය ගෙන දෙන්නකි සුරාව. ආර්ථිකය, සෞඛ්‍යය, සාමය, සදාචාරය හා සම්භාවනීයත්වය පිරිහීමට සුරාපානය හේතු වන බව සිගාලෝවාද සූත්‍රයේ දී ද දක්වා ඇත. මෙම ආදීනව සියල්ල ම සිය පද්‍ය පන්තියේ දී ඉදිරිපත් කිරීමට කවියා සමත් ව ඇත. මේ එක් එක් කරුණක් මතුකරමින් සුරාපානය නිසා සිදු වී ඇති හානිය ඉදිරිපත් කරන කවියා තම රට පිළිබඳ ව සංවේදී වී ඇති ආකාරය දක්නට ලැබේ.

පද්‍ය පන්තිය ආරම්භ කරන්නේ සුරාව යකෙක් ලෙස දකිමිනි.

"මත්පැන් යකා මගෙ හෙළ දිවයිනට වැදී
මිනිහා මිනිස් ගතියෙන් වෙන් කරන ලදී"

යනුවෙන් තම චිත්තවේගය පළ කර ඇත.

තම රට පිළිබඳ ව වූ ඇල්ම හෙළි කිරීම සඳහා,

"මෙය යම් දිනෙක නැති විද ඒ දිනයෙහි සිට
සදහම් දීපයක් වෙයි මගෙ සිහල රට"

"මත්පැන් නිසා එහි ඇති විස ගතිය පෙනී
ලක්මව හඬයි ඇවිලී හදවතට ගිනි"

වැනි යෙදුම් කොතරම් සමත් වී ඇත්දැයි විමසා බැලිය යුතු වේ.

"මෙය එළිපිට ම අසරණයාගෙ ඇඟට පනී
රහසින් එළඹ නායකයින් වැළඳ ගනී"

"අනුවණ දිළිඳු දන මින් පොළඹ වන ලදි
ඉන්පසු උඩුමහල්වල ගොස් ජයට ඉදී"

වැනි යෙදුම් මඟින් සමාජය දෙස හෙළා ඇති දෘෂ්ටිය කෙබඳු දැයි සිතා බැලිය යුතු වේ.

අවසාන වශයෙන් කවියාගේ ප්‍රාර්ථනය වී ඇත්තේ සුරාව මේ රටින් බැහැර වී යනු දැකීම බව පෙනේ. කවියෙන් සමාජ මෙහෙවරක් කිරීමට ගත් උත්සාහයක් ලෙස ද මේ කවි පන්තිය හැඳින්වීමට හැකි ය.

### 4.17.2 අභිමතාර්ථ

- යුගයේ අවශ්‍යතාවක් ලෙස කතුවරයාගේ මෙහෙවර පිළිබඳ ව අගය කිරීම
- සුරාපානයේ ආදීනව පිළිබඳ ව විමසා බැලීම
- කවි පන්තියෙන් ලබන අත්දැකීම් තම දිවිමග සකස් කර ගැනීමට ඉවහල් කර ගැනීම
- කාව්‍ය නිර්මාණ කිරීම

4.17.3 අභිමතාර්ථ සාධනය

4.17.3.1 ප්‍රවේශය

- සුරාපානයේ ආදීනව කියැවෙන ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන්
- සිසුන් සමඟ කෙරෙන සුහද සාකච්ඡාවක් මඟින් හෝ
- පද්‍ය පන්තියේ යම් සිද්ධියක් මතු කරමින්
- පුවත්පත් වාර්තා (සුරාපානයෙන් සිදු වූ හානි ගැන කියැවෙන) කීපයක් කියවීමෙන් හෝ "බුදු තාත්තා බොන්න එපා" යන ගීතයෙන්

4.17.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පද්‍ය පන්තිය ගායනා කරවීම
- පද්‍ය පන්තියේ අන්තර්ගතය මතුකර දැක්වීම
- කවියා හා කවි පන්තිය පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට යොමු කරවීම
- කවි පන්තිය රසාස්වාදනය කිරීම
- කාව්‍ය නිර්මාණයට යොමු කරවීම

4.17.4 තක්සේරුව/ ඇගයීම

- සමාජ පරිහානියට සුරාපානය බලපා ඇති ආකාරය විමසා බැලෙන අභ්‍යාසයක් කරවීම
- කවියෙකුට කළ හැකි සමාජ මෙහෙවර විග්‍රහ කරමින් කවි පෙළ ඇගයීමට ලක් කිරීමේ අභ්‍යාසයක් කරවීම

4.17.5 පරිශීලනය

- **කොළඹ කවි යුගය** - පී. මලල්ගොඩ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.18 අකුරට යනවයි කියලා

### 4.18.1 හැඳින්වීම

වර්ෂ 1913 ජුනි 19 වැනි දින රුහුණු රට පුවක්දණ්ඩාවේ දී උපත ලද ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා විසිවන සියවසේ සිංහල කවියේ අභිවර්ධනය උදෙසා මහඟු මෙහෙයක් කළ කවියෙකි. තම නිවසේ වටපිටාව ම ස්වකීය නිර්මාණ කෞශල්‍යය ඔප් නංවා ගැනීමට මනා පිටිවහලක් වූ බව මානවසිංහයෝ ම පවසති. කවියෙකු වශයෙන් පමණක් නොව ගීත නිබන්ධකයෙකු හා පුවත්පත් කලාවේදියෙකු වශයෙන් ද ස්වකීය හැකියා ප්‍රකට කළ අයෙකි. **"කෝමල රේඛා," "පොසොන් සිවුපද," "සෙල් පිළිම," "සලිලා," "සමදරා" රන්තිලකා, නිදි කුමරිය,** වැනි නිර්මාණ ඔහුගේ මේ නිර්මාණ කුසලතාවට සාක්ෂ්‍ය දරයි. මානවසිංහයන්ගේ නිර්මාණවල දක්නට ලැබෙන සුවිශේෂතා කීපයකි. බොහෝ නිර්මාණවල ඇති ගීතවත් බස්වහර බොහෝ විචාරකයන්ගේ අවධානයට ලක් වූවකි. **කෝමල රේඛා** වැනි නිර්මාණයක් ඊට කදිම නිදසුනකි. නව අත්හදා බැලීම් සහිත ව කළ කාව්‍ය ආකෘති, මෙන් ම නාට්‍යමය ස්වරූපයෙන් යොදාගත් ආකෘති, ද ඒ අතර වෙයි. **'වෙසක් මිහිර' ඈට වසඟ නොවනු කවුරු, ගුරු ගෙදරට යන අතරමඟ, ඇත්ගාලේ දරු පෙම.** යන කෘති මේ සඳහා නිදසුන් කළ හැකි ය. ගීත නාටක කලාවෙහි ද ස්වකීය හැකියා ප්‍රකට කරමින් **'රන්තිලකා' 'සමදරා'** ආදී කෘති නිර්මාණය කළේ ය. සිකුරු තරුව, දෛවයෝගය, රන්මුතු දුව, යන චිත්‍රපටවලට කළ ගීත නිබන්ධන නිසා සම්භාව්‍ය ගීත නිබන්ධකයෙකු වශයෙන් ද ප්‍රසිද්ධියක් අත් කර ගනියි. මෙතුමාගේ "**ගුරු ගෙදරට යන අතරමඟ**" නම් කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් නිර්මාණයකි. "**අකුරට යනවයි කියලා**" නම් පද්‍ය පන්තිය.

අකුරට යන අතරමඟ දී ටිකිරිත්, සිළිඳුත් අතර සිදුවන රසවත් සංවාදයක් පාදක කර ගනිමින් මෙම පද්‍ය පන්තිය නිර්මාණය කර ඇත. ඔවුනගේ ළමා ලෝකයත්, එහි ඇති අහිංසක හා සරල බවත් සුන්දර බලාපොරොත්තුත් ඉතා සජීවී ලෙස ඉදිරිපත් කරයි. කවියා යොදාගත් සංවාදශීලී කාව්‍ය ආකෘතියෙන් මේ සජීවී බව තවදුරටත් විචිත්‍රවත් වෙයි. එනිසා ම කාව්‍ය අනුභූතිය වඩාත් අපූර්වත්වයෙන් යුතුව ප්‍රතිනිර්මාණය කිරීමට හැකියාව ලැබී ඇත. ළමුන් අතර සිදුවන පුංචි ආරවුල් දීර්ඝ කාලීන මිතුදමකට ද මුල පුරන අයුරු මනාව ධ්වනිත කෙරෙයි. අත් විඳීමට උචිත සරල භාෂාවක් යොදා ගැනීම වඩාත් අවධානයට යොමු කළ යුත්තකි. සරල මෙන් ම ගැමි භාෂා භාවිතය ද රසවත් බව තීව්‍ර කිරීමට බලපායි.

ඉඳුණු කරඹ ගොඩාරියක්<br>
මගේ ඔඩොක්කුවෙ තියෙනවා<br>
ටිකිරි අයියටත් දෝතක්<br>
පුරවල දෙන්නම්<br>
පුරවල දී තව මදි නම් හිඹුටුත් දෙන්නම්.

මෙවැනි ගැමි වදන් භාවිතය නිර්මාණය පුරා ම දක්නට ලැබේ. එපමණක් නොව ගැමි ජීවන රටා, සාරධර්ම, සිරිත්විරිත්, පිළිබඳ ව ද මේ තුළින් අධ්‍යයනය කළ හැකි ය.

මාළු ඇඹුල් තියල් කරලා<br>
පොල් සම්බල් රසට හදල<br>
ඇල් හාලේ බතුත් එක්ක<br>
අනල කවන්නම්........

ගමේ සොබා සොඳුරු බව ද කවියාගේ වර්ණනයට ලක් විය.

හැන්දෑවට කහ සුදු රතු
හෙන්දිරික්ක මල් පිපුණාම
ඒ ළඟ ගල් පොත්තක් උඩ
වාඩි කරන්නම්
වාඩි කරල ළඟින් ඉඳන් නලා පිඹින්නම්

රටා පුරලා බෝවිට දා පන් පැදුරක් වියා ගැනීමේ සිට සියලු කාර්යයන්හි දක්ෂතාව පෙන්වන ගැමි කතකගේ ස්වභාවය ද මේ තුළින් හෙළි කරයි. මෙලෙස විවිධ අංශ යටතේ සාකච්ඡා කළ හැකි කාව්‍ය නිර්මාණයකි "අකුරට යනවයි කියලා" යන්න.

4.18.2 අභිමතාර්ථ

- කවියාගේ තොරතුරු සහ ඔහුගේ නිර්මාණ පිළිබඳ විමසා බැලීම
- කවි පන්තියේ අන්තර්ගතය හා එකී කාව්‍යෝපක්‍රම හඳුනා ගැනීම
- ළමා ලෝකයේ සුන්දරත්වය, ගැමි ජීවිතයේ ස්වභාවය පිළිබඳ ව කරුණු අවබෝධ කර ගැනීම

4.18.3 අභිමතාර්ථ සාධනය

4.18.3.1 ප්‍රවේශය

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ වෙනත් ළමා කාව්‍ය නිර්මාණයක් ඉදිරිපත් කරමින්
- දෙබස් ස්වරූපයෙන් ඉදිරිපත් වූ වෙනත් කාව්‍ය නිර්මාණ හඳුන්වා දෙමින්
- වෙනත් ළමා කාව්‍ය නිර්මාණ ගැන විමසමින්
- කතුවරයාගේ ගුවන් විදුලි ගීතයක් ඇසීමට සැලැස්වීමෙන්

4.18.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ කවියාගේ ගීත / පද්‍ය නිර්මාණ ගැන අවබෝධයක් ලබාදීම
- එතුමාගේ කවිවල තිබූ සරල හා ගීතවත් බව කෙරෙහි අවධානය යොමු කිරීම
- සංවාද ස්වරූපයෙන් කවි පන්තිය ඉදිරිපත් කර ඇති ආකාරය අවබෝධ කරවීම
- ගැමි සමාජය හා එහි හැසිරීම්, සාරධර්ම, ජීවන රටාව පිළිබඳ විමසීමට ලක් කිරීම
- කාව්‍ය ආකෘතිය සහ සජීවී බව පිළිබඳ අවධානය යොමු කිරීම

4.18.4 ඇගයීම/ තක්සේරුව

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ විශේෂ කාව්‍ය ලක්ෂණ පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමට යොමු කිරීම
- කවි පන්තියේ විශේෂ භාෂා ප්‍රයෝග හා ධ්වනිත වන වෙනත් තොරතුරු පිළිබඳ අධ්‍යයනයක් කර ලිවීමේ අභ්‍යාස
- මෙවැනි සරල නිර්මාණකරණයෙහි යෙදීමට අවස්ථාව සැලසීම

4.18.5 පරිශීලනය

- **කෝමල රේඛා** - චන්ද්‍රරත්න මානවසිංහ
  **වෙසක් මිහිර** - චන්ද්‍රරත්න මානවසිංහ

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.19 ඉර පායා ඉර මුදුනට එන්ට එපා

### 4.19.1 හැඳින්වීම

විසිවන සියවසේ සිංහල කවියේ අභිවර්ධනය උදෙසා විශාල මෙහෙයක් කළ කවියෙකි විමලරත්න කුමාරගම. වෘත්තියෙන් රජයේ ආදායම් පාලක නිලධාරියෙකු ලෙස කටයුතු කළ ද කාව්‍යකරණයෙහි ලා දැක්වූයේ වැඩි නැඹුරුතාවකි. බින්තැන්න, වන්නිහත්පත්තුව, පුත්තලම, අනුරාධපුරය වැනි ප්‍රදේශවල සේවය කිරීමේ දී ලද බොහෝ අත්දැකීම් ස්වකීය නිර්මාණ සඳහා පාදක වී ඇත. අහිංසක ගැමියාගේ කටුක ජීවන යථාර්ථය භාෂා රටාව, සමාජමය, පැතිකඩවල්, කාව්‍ය වස්තු බීජ කොට ගත්ත ද කිසි විටෙකත් ඔවුන්ට ගැරහුවේ නැත. උපහාසයට, අපහාසයට ලක් කළේ ද නැත. අතිශය මානව හිතවාදී දෘෂ්ටි කෝණයකින් බැලීමට කවියාට හැකියාව තිබිණ. එනිසා ම ඔහුගේ කවිවලින් ගැමි සුන්දරත්වය වහනය විය. ඒවා සරල විය. **අයියනායක හේරත්හාමි, ආගන්තුක සත්කාරය, වලස් දඩයම, සපුමලී,** යනාදී නිර්මාණ ඒ සඳහා කදිම නිදසුන් ය. 1919 ජනවාරි මස 18 වැනි දින පාතදුම්බර නාරම්පනාවේ දී උපත ලද මෙතුමාගේ ප්‍රථම කාව්‍ය නිර්මාණය බිහි වන්නේ 1940 දී ය. ඒ "**සංවේග වේදනා**" නමිනි. වන්නියේ කැලෑවක සිදුවන අනුවේදනීය පුවතක් වස්තු බීජ කර ගනිමින් රචිත **ඉර පායා ඉර මුදුනට එන්ට එපා**යන නිර්මාණය ද විමලරත්න කුමාරගම කවියාගේ දැඩි මානව දයාව ප්‍රකට කෙරෙන තවත් නිර්මාණයකි.

ගම ආසන්නයේ වන රොදක දී වැදි කොල්ලෙකු අතින් වෙඩි කා මියැදෙන මුව දෙනකගේ විලාපයත්, කිරි වෑහෙන මළ බුරුල්ලෙන් සංකේතවත් කරන ඇගේ දරුපෙමින් කෙනෙකුට ඉතා සංවේගජනක හැඟීමක් මතු කරයි. දඩයම්කරුවන්ගෙන් බේරීමට මිනිස් වාසයට පලා එන මුව දෙනට එහි දී ම මියැදෙන්නට සිදුවීම තවත් සංවේගය උපදවන්නකි. පැටවුන්ට කිරි දී ළපලු අහරට ගනිමින් තුරු සෙවණේ කල් ගෙවූ ඇයට මෙවන් ඉරණමක් අත් වූයේ ඇයි දැයි තමාගෙන් ම විමසයි. වඩාත් ඛේදජනක සිදුවීම වන්නේ මුවදෙන මිය ගිය පසු ඇගේ පැටවුන්ට අත්වන ඉරණමයි. මවගෙන් වියෝ වූ දරුවන්ට විඳින්නට වන දුක ගැන කියවෙන ජන කවියක ආභාසයෙන් රචනා කළ කවියකින් ඒ ස්වභාවය ප්‍රකට කිරීමට කවියා උත්සාහ ගනී.

ඉර පායා ඉර මුදුනට එන්ට　　එපා
සඳ පායා සඳ මුදුනට එන්ට　　එපා
දිවි නරි පිඹුරු කටකට කැපවෙන්ට　　එපා
අම්මා නැති අපට බඩගිනි වෙන්ට　　එපා

යනුවෙන් ඒ බැව් දක්වයි. මේ කවිය නැවත නැවත යොදමින් අනුප්‍රාසමය ලක්ෂණ ද කවියට එකතු කරයි.

අනතුරු ව පිඹුරාට ගොදුරු වන මුව පැටව් බේරා ගන්නේ ද මුව දෙනට වෙඩි තැබූ වැදි කොල්ලාම ය. සමාජය තුළ ද මවගෙන් වියෝ වූ දරුවන් ඩැහැ ගැනීමට පිඹුරන් වැනි මිනිස්සු මාන බලති. යමෙකුගේ අසරණ බවට, උකුස ගින්නට, මාපිය සෙනෙහසට, වියෝදුකට සංවේදී නොවන සමාජයක ගති ස්වභාවය ද මේ කවිය තුළින් ධ්වනිත කෙරෙයි.

කවියා ස්වකීය අත්දැකීම ප්‍රතිනිර්මාණය කිරීමට සරල සුගම ශෛලියක් යොදා ගනී. කාව්‍ය ආකෘතිය මෙන් ම බස් වහර ද ඒ සඳහා මනා රුකුළක් සපයයි. 'නාඹර, බුරුල්ල, මිරිසට උයා' වැනි වචන ගැමි සමාජයට ම හුරු ඒවා ය. සහෘදයා තුළ සංකල්ප රූප ජනනය කෙරෙමින් කිසියම් අපූර්වත්වයක් ගෙන ඒමට මේ කාව්‍ය රටාව බලපා ඇත. කටුක ගැමි

පරිසරයක මිනිසාට විඳින්නට සිදුවන අනේක, විධ දුක් කම්කටොලු සංකේතවත් කරමින් රචනා කෙරුණු ඉර පායා ඉර මුදුනට එන්ට එපා. කාව්‍ය නිර්මාණය කරුණ රසයට මුල් තැන දෙන අතර මානව දයාව ප්‍රකට කරන්නක් ලෙස ද අගය කළ හැකි ය.

4.19.2 අභිමතාර්ථ

- ■ ඔහුගේ පද්‍ය නිර්මාණ පිළිබඳ ව විමසා බැලීම
- ■ කවියාගේ බොහෝ නිර්මාණවලට මානව දයාව නැමැති මිනිස් ගුනය ගැබ් වී ඇති බැව් අවබෝධ කර ගැනීම
- ■ කවියා පදය පන්තිය සඳහා යොදාගත් බස්වහර පිළිබඳ හඳුනා ගැනීම

4.19.3 අභිමතාර්ථ සාධනය

4.19.3.1 ප්‍රවේශය

- කවි පන්තියේ එන සිදුවීමට සමාන වර්තමාන සමාජයේ සිදු වූ වෙනත් සිදුවීම් ගැන විමසමින්
- කතුවරයාගේ වෙනත් පද්‍ය නිර්මාණ හා ජීවන තොරතුරු ගැන විමසමින්
- ගුරුතුමාට ගුරුතුමියට අභිමත පාඩමට ගැළපෙන වෙනත් සරල ප්‍රවේශයක් සකසා ගත හැකි ය.
- ඉර පායා ඉර මුදුනට එන්ට එපා යන ජන කවිය ඉදිරිපත් කරමින්

4.19.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පද්‍ය පන්තිය කේවලව/ කණ්ඩායම් වශයෙන් ගායනා කිරීම
- කාව්‍ය නිර්මාණයේ සිදුවීම හා වර්තමාන සමාජයේ දී හමුවන ඒ හා සමාන සිදුවීම් ගැන සාකච්ඡා කිරීම.
- මව් සෙනෙහස/ දරු සෙනෙහස පිළිබඳ සංවේදී බව ඇති වන සේ ළමුන් සමග සාකච්ඡා කිරීම

4.19.4 තක්සේරුව/ ඇගයීම

- ■ පද්‍ය ගායනා කරවීම
- ■ මෙවැනි අත්දැකීම් පාදක කර ගනිමින් කාව්‍ය නිර්මාණයට යොමු කිරීම
- ■ මානව දයාව ඉස්මතු කෙරෙන පද්‍ය පන්තියක් ලෙස අගය කෙරෙන අභ්‍යාසයක්

4.19.5 පරිශීලනය

- ■ **අයියනායක** - විමලරත්න කුමාරගම
- ■ **ආගන්තුක සත්කාරය**- විමලරත්න කුමාරගම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.20 වක්කඩ බඳිමු

### 4.20.1 හැඳින්වීම

1929 වර්ෂයේ ගාල්ලේ යටලවත්තේ දී උපත ලැබූ ගුණදාස අමරසේකර මහතා ගමේ පාසලෙන් සහ කොළඹ නාලන්දා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළත් ව දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ගත්තෙකි. එහෙත් එතුමා ප්‍රකට පුද්ගලයකු බවට පත් වූයේ දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් නොව ප්‍රබුද්ධ සාහිත්‍ය ධරයෙකු වශයෙනි. නිර්මාණශීලී ලේඛකයකු වූ එතුමා සිංහල නවකතාව, කෙටි කතාව සහ කවිය සම්බන්ධයෙන් ඉටු කරන ලද සාහිත්‍ය මෙහෙවර අතිශයින් ප්‍රශංසනීය යි. **කරුමක්කාරයෝ, යළි උපන්නෙමි, දෙපා නොලද්දෝ , ගන්ධබ්බ ආපදානය, ප්‍රේමයේ සත්‍ය කතාව, ගමනක මුල, ඉණිමගේ ඉහළට** යන නවකතා ද **ජීවන සුවඳ, කතාපහක්, රතු රෝස මල, ගල් පිළිමය සහ බොල් පිළිමය**, යන කෙටි කතා සංග්‍රහ ද **භාව ගීත, අමල්බිසෝ, ගුරුළු වත, උයනක හිඳ, ලියූ කවි, ආවර්ජනා** යන පද්‍ය සංග්‍රහ ද එතුමා විසින් රචනා කරන ලද සාහිත්‍ය කෘති අතර වෙයි. පාඨක විචාරක ප්‍රසාදය දිනාගත් එතුමා නිර්මාණ කරුවෙක්, විචාරකයෙක් සහ චින්තකයෙක් ද වෙයි. එතුමා අතින් ලියැවුණු ශාස්ත්‍රීය හා විචාර ග්‍රන්ථ අතර **අලියා සහ අන්ධයෝ, අනගාරික ධර්මපාල, අබුද්දස්ස යුගයක්, ගණදුරු මැදියම දකිනෙමි අරුණලු**, සිංහල කාව්‍ය සම්ප්‍රදාය යන කෘති ද වෙයි.

**වත්කඩ බඳිමු** කවි පන්තිය දැඩි නියඟයකින් පසුව මුදුන් වන වැහි කළුවක් දුටු ගොවියෙකුගේ සිතෙහි මෝදුවන සතුට සහ අපේක්ෂාවන් වස්තු විෂය කොට ගෙන රචනා කරන ලද්දකි. ගෑණියකුගේ ප්‍රකාශනයක් ලෙසින් කවි පන්තිය විකාශනය වෙයි. ඉඩෝරය හේතුවෙන් පරිසරයෙහි ඇති වූ කටුක බවත් වැස්ස හේතුවෙන් පිළිසිඳෙන අපේක්ෂාවන් නැවුම් අත්දැකීමක් ලෙස විවරණය කිරීමට කවියා සමත් වී ඇත. අත්දැකීම සුචනය කිරීමට උචිත එළිසම සහිත දෙපද විරිතක් කවියා යොදා ගෙන ඇත. ගැමියෙකුගේ භාව ප්‍රකාශනයට උචිත භාෂණ රිද්මයක් නිර්මාණය කිරීමට එයින් කවියා සමත් වී ඇත.

වැස්ස ස්වභාව ධර්මය හා බැඳුණු සංසිද්ධියකි. ගැමියන්ට අනුව වැස්ස ලැබෙන්නේ දෙවියන්ගේ ආශීර්වාදයෙනි. වැස්ස ගෙන එන්නේ වැස්ස වලාහකයා ය. වැස්ස වලාහක එවන්නේ දෙවියන් විසිනි. වැස්ස හේතුවෙන් නියඟට ඉරිතලා ගිය මහ පොළොව තෙත් වී සශ්‍රීක වෙයි. සශ්‍රීකත්වය අපේක්ෂා කරන ගොවියාට වැස්ස ආශිර්වාදයකි. කවි පන්තියේ වස්තු විකාශනය සඳහා කවියා ජනශ්‍රැතියේ එන විශ්වාසයන් ද සාර්ථක ලෙස උපයෝගී කොට ගෙන ඇති අයුරු දක්නට ලැබෙයි. නිර්මාණකරණයෙහි ලා කවියාගේ ප්‍රතිභාවයත් ව්‍යුත්පත්තියත් ප්‍රකට කරන කවි පන්තියක් ලෙස මෙය අගය කළ හැකි ය. අත්දැකීම ප්‍රතිනිර්මාණය කිරීමේ දී ඊට අපූර්වත්වයත් ලබාදීමට කවියාගේ පරිකල්පන ශක්තිය ඉවහල් වී ඇත. වැහි ලකුණු දකින ගොවියා වෙලට බැස වත්කඩ බැඳ සූදානම් වීම සාමාන්‍ය අත්දැකීමකි. වැහි ලකුණු දැකීමෙන් ගොවියෙකු තුළ හටගන්නා ප්‍රබෝධයත් ඔහුගේ අපේක්ෂාවනුත් නිර්මාණාත්මක ලෙස විවරණය කිරීමට කවියා සමත් වී ඇත.

අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමේ දී කවියා නිර්මාණාත්මක ලෙස භාෂාව යොදා ගැනීමට සමත් වී ඇති අයුරු විශේෂයෙන් විමසා බැලිය යුතු ය. කවියාගේ මුඛ්‍යාර්ථය ප්‍රකාශ කිරීමට උචිත අයුරින් භාෂාව හසුරුවා ගෙන ඇත. ප්‍රස්තුතයට ගැළපෙන අයුරින් ගැමි වහර යොදා ගැනීම කවි පන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇත. "හනිකට බැඳපන් වක්කඩ දෙයියෝ" "අපි ගැන බලලා" "ඔන්න ඔන්න පොද වැටෙනවා," "හෝස් ගාල ඒ මොහොතෙම" වැනි යෙදුම් පිළිබඳ ව සලකා බලන්න. ගැමියෙකුගේ හැඟීම ප්‍රකාශනයට උචිත පරිදි භාෂාව හසුරුවා ගෙන ඇත.

භාෂාව සම්බන්ධයෙන් ඊටත් වඩා වැදගත් ලක්ෂණයක් ලෙස සඳහන් කළ යුතු වන්නේ කාව්‍යමය උත්ප්‍රාසයක් දනවන අයුරින් විචිත්‍ර සංකල්ප රූප නිර්මාණයට උචිත වන පරිදි නිර්මාණාත්මක ලෙස භාෂාව යොදා ගෙන තිබීමයි.

"පොළොව සතුටෙ හූම් ලනව"
"පොළොව පැළිල පිපාසයෙන් ඇරිල තිවුණ ආකාසෙට"
"පොළොව ලොවිනවා වැහිපොද දිව දික්කරලා හනිකට"
"ගැබ් ගැනිලා කිරි එරිලා මහ පොළවට සැන සෙන්නට"

මෙම කාව්‍යෝක්තීන් ප්‍රස්තුතයට අදාළ ව ප්‍රබල සංකල්ප රූපාවලියක් සහෘද සන්තානයෙහි චිත්‍රණය කිරීමට සමත් වන අයුරු විමසා බැලීම සුදුසු ය. පොළොව සජීවී වස්තුවක් ලෙස ගෙන ඉඩෝරයේ දැඩි කටුක බව ප්‍රකාශ කිරීමටත් වැස්සේ ආශිර්වාදයෙන් සශ්‍රීක බව උදා වන ආකාරය ප්‍රකාශ කිරීමටත් කවියා සංක්ෂිප්ත භාවිකාර්ථවත් පද මාලාවක් යොදා ගෙන ඇත.

කවියෙහි මූලික අරමුණ වන්නේ රසික ජනයා තුළ ආනන්දය හා ප්‍රඥාව ඇති කිරීමයි. ආනන්දය හට ගන්නේ රසිකයා තුළ චමත්කාරය දැන වීමෙනි. චමත්කාරය යනු සිත පුරවා දමන විස්මයයි. විස්මය හට ගන්නේ නිර්මාණයෙහි ඇති අපූර්වත්වය හේතුවෙනි. සුලබ අත්දැකීමක් වුව අපූර්වත්වයෙන් යුතු නව තම වස්තුවක් ලෙස රස විඳීමට හැකි වන්නේ කවියාගේ ප්‍රතිභාවත් පරිකල්පන ශක්තියත් හේතුවෙනි. මෙම පද්‍ය පන්තිය සඳහා පාදක කොට ගෙන ඇත්තේ ද සුලබ අත්දැකීමකි. එහෙත් කවියා එම අත්දැකීම ප්‍රතිනිර්මාණය කිරීමේ දී දක්වා ඇති කුසලතාව හේතුවෙන් රසවත් කාව්‍ය නිර්මාණයක් බවට පත් වී ඇත.

4.20.2 අභිමතාර්ථ

- කතුවරයා සහ ඔහුගේ නිර්මාණවලින් සිංහල සාහිත්‍යයට ඉටු වූ සේවය
- ඉඩෝරයට මුහුණ දෙන ගැමියන්ගේ ශෝකාලාපය කවියා ඉදිරිපත් කළ ආකාරය පිළිබඳ අවබෝධ කර ගැනීම
- ගැමි බස්වහර කවියට ආලෝකයක් වූ අයුරු අවබෝධ කර ගැනීම

4.20.3 අභිමතාර්ථ සාධනය

4.20.3.1 ප්‍රවේශය

- වැස්ස / නියගය පිළිබඳ ලියැවුණු වෙනස් කාව්‍ය නිර්මාණයක් ඉදිරිපත් කරමින් හෝ කවි පන්තියේ අත්දැකීම හා සම්බන්ධ පරිසරය පිළිබඳ සාකච්ඡාවකින් ප්‍රවේශයක් ලබාගත හැක.
- නිර්මාණාත්මක ලෙස ඔබට අභිමත සුදුසු ප්‍රවේශයක් ලබා ගැනීම වඩාත් සුදුසු ය.
- සිසුන් සමඟ කෙරෙන සාකච්ඡාවකින්
- වැස්ස වලාහක දෙවියන් දිවැස් හෙලනු මැන - ගීතයෙන් පිවිසය හැක.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

4.20.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පද්‍ය පන්තිය ගායනා කරවීම
- කවියා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කිරීම
- කවි පන්තියේ අන්දැකීම පැහැදිලි කිරීම
- කවි පන්තිය සමස්තයක් ලෙස ගෙන රස විඳීම
- කාව්‍යෝපක්‍රම භාවිතය පිළිබඳ සාකච්ඡා කිරීම

4.20.3.3 තක්සේරුව/ ඇගයටීම

- ■ කවි පන්තිය පිළිබඳ රසස්වාදයක් ලියවීම
- ■ කවියා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු එකතුවක් සකස් කිරීම

4.20.3.4 පරිශීලනය

- ■ **භාව ගීත** - ගුණදාස අමරසේකර

## 4.21 මරණය

### 4.21.1 හැඳින්වීම

ඔහු කවියෙකි. ගීත රචකයෙකි. චිත්‍ර ශිල්පියෙකි. භාෂා පරිවර්තකයෙකි. දක්ෂ ගුරුවරයෙකි. ගුරු විද්‍යාල කථිකාචාර්ය වරයෙකි. නවකථා කරුවෙකි. ගුවන් විදුලි ශිල්පියෙකි. කෙටියෙන් දැක්වුවහොත් ප්‍රතිභා පූර්ණ කලා කරුවෙකි. 1929 අප්‍රේල් මස 7 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවාන ගමේ ඉපිද 1976 ජනවාරි මස 15 වන දින දැයෙන් සමුගත් ඔහු මහගමසේකර නම් මිනිසා ය. සේකර විචාරකයන් අතර ජනාදරයට පත්ව ඇත්තේ කවියෙකු හා ගීත රචකයෙකු වශයෙනි. සේකරගේ ගීත රචනාවල දක්නට ලැබෙන සෞන්දර්ය ගුණය, යුගයේ විශිෂ්ට තම ගීත රචකයා බවට ඔහු පත් වීමට හේතු වන්ට ඇතැයි විශ්වාස කෙරේ. නිතර අත්හදා බැලීම් කළ පර්යේෂණ කවි මනසකින් හෙබි ඔහුගේ මුල් නිර්මාණවල දක්නට ලැබෙන්නේ සරල නොගැඹුරු ශබ්ද රසයෙන් යුක්ත රසික හදවත සමීප වූ ලක්ෂණයි.

නූතන කවියට උචිත කාව්‍ය භාෂාවක් නිර්මාණය කිරීමට උත්සාහ කළ සේකර කවියා ජන කවියේ භාෂාව, ආකෘතිය, විවිධ රටා හා කටවහර සිය නිර්මාණකරණයේ දී උපයෝගී කර ගෙන ඇත. ඔහු රචනා කළ ගද්‍ය පද්‍ය කෘති අතර **ප්‍රබුද්ධ, ව්‍යංගා, සක්වාලිහිණි, හෙට ඉරක් පායයි, මක් නිසාද යත්, බෝඩිම, නොනිමි, මනෝ මන්දිර, තුංමන් හන්දිය,** යන කෘතීන්වලට උසස් තැනක් හිමි වේ. "මරණය" ඔහුගේ එක් පද්‍ය පන්තියකි.

මරණය යන ස්වාභාවික සංසිද්ධියට ජීවයක් ආරෝපණය කොට මරණය අමතා තමා වෙත පමා නොවී පැමිණෙන්නැයි ආරාධනා කරමින් නිර්මාණය කොට ඇති මෙම පද්‍ය පන්තියෙන් මරණයේ ස්වභාවය පැහැදිලි කර දී ඇත. පද්‍ය පන්තියේ කිසිම තැනක මරණය යන වචනය දක්නට නොලැබේ. එහෙත් සෑම පද්‍යයක ම වෙනත් මගකින් (සංකල්ප රූප) මරණය මතුකොට දක්වයි. සදාකාලික නින්ද, හීන නොමැති නින්ද, වශයෙන් ආරම්භයේ දී මරණය හඳුන්වන කවියා අනෙක් තැන්වල දී මරණයේ ලක්ෂණ කියා පෑම මඟින් මරණය හඳුනා ගැනීමට ඉඩ සලසා ඇත.

උපන් දිනයේ සිට අත් නොහරින බව, හුස්ම නොගන්නා බව, ඇඟපත සීතල වීම, අහස පොළොව ආදී සෑම තැනක ම වාසය කිරීම, සියලු දෙනා අල්ලා ගැනීම සඳහා දැලක් එළා ගෙන සිටීම මරණයේ ස්වභාවයන් බව කවියා ප්‍රකාශ කරයි. බුදු දහමේ ඉගැන්වෙන

"උප්පත්තියා සහේවෙදං - මරණං ආගතං සදා.
න අන්තලික්ඛේ න සමුද්ද මජ්කෙඩ න පබ්බතානං විවරං පවිස්ස"

යන ඉගැන්වීම කවියා තම බසින් සරල ලෙස ඉදිරිපත් කොට ඇති ආකාරය ඉතා කදිමය.

මරණය සියල්ලට ම උරුම වූ සදාතනික නියතයක් වූ නමුදු මිනිස් සමාජයේ ඇතැම් කෙනෙක් ඒ ගැන නොසිතන බවත්, මේ නිසා ම අනෙක් අයගේ දියුණුවට එරෙහි ව ක්‍රියාකොට අපේක්ෂා නොකළ මරණය සිදු වූ පසු නෑසියන් එක් වී හඬා වැටෙන අයුරුත් බණක් කියා පින් දී විමුක්තිය පතන අයුරුත් ඉදිරිපත් කරන්නේ උපහාස රසය මතු කරවමිනි.

සිංහල කවියේ සම්භාව්‍ය ලක්ෂණ ඇසුරු කරමින් පද්‍ය පන්තිය නිර්මාණය කළ කවියා එයට ජන කාව්‍ය ලක්ෂණ ද එක් කරගෙන ඇත්තේ නිරුත්සාහයෙනි.

සෑම කවියකම පාහේ මුල හා අග එළිවැට යොදා ගත් අතර තම කවි බසට ජන කවියේ ආභාසය ද ලබා ගෙන ඇත.



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

දපන්නේ, දියන්නේ මන්ද, වරෙන්, ඉන්න වගේ දඩු ගැහෙන්නේ, ලගින්නේ, දවාලේ උඩ බැල්ලෙන්, මලේ, පිලේ, යමන් නේ, වැනි යෙදුම් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

නොකා නොබී වස්තුව සරි කරන්නේ
සදා කල්ම ලොව ඉන්නයි බලන්නේ

පිනක් කිසිම කාලෙක නැත කරන්නේ
කුණක් සේ ම පොළොවට ඇද වැටෙන්නේ
බණක් කියා එතකොට පිං දෙවන්නේ
කණක් නැතිව කොහොමද බණ අහන්නේ

වැනි යෙදුම් මඟින් සමාජය කෙරෙහි හෙළා ඇති දෘෂ්ටිය කුමක් දැයි සිතා බැලිය යුතු ව ඇත. සමස්තයක් වශයෙන් ගත් කළ කවි පන්තිය පුරා දක්නට ලැබෙන්නේ කවියා මරණය සතුටින් අපේක්ෂා කළ බවයි. එසේ ඔහු මරණය අපේක්ෂා කිරීම තුළින් ප්‍රකට වන්නේ කුමක් ද යන්න අපේ විමසුමට යොමු විය යුතු ව ඇත.

4.21.2 අභිමතාර්ථ

- සේකර සහ ඔහුගේ නිර්මාණ පිළිබඳ ව සොයා බැලීම
- කතුවරයාගේ භාෂාවේ ඇති සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම
- සේකර කවි පන්තිය රසවත් කිරීමට යෙදූ ධ්වනිතාර්ථ, උපහාසාත්මක බස පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම.

4.21.3 අභිමතාර්ථ සාධනය

4.21.3.1 ප්‍රවේශය

- මරණය ගැන ලියැවුණ වෙනත් කවියක් ගායනා කිරීමෙන්
- සිසුන් සමඟ කෙරෙන සුහද සාකච්ඡාවකින් හෝ
- ඔබට අභිමත වෙනත් සුදුසු ප්‍රවේශයකින්

4.21.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කණ්ඩායම් වශයෙන් හා තනි තනිව කීපවරක් ගායනා කරවීම
- කවියා හඳුනා ගැනීමට සැලැස්වීම
- කවියේ අන්තර්ගතය මතු කර දැක්වීම
- ප්‍රස්තුතය ඉදිරිපත් කිරීමේ දී කවියා යොදා ගෙන ඇති කාව්‍යමය භාෂාව පිළිබඳ ව සාකච්ඡා කරමින් කවි පන්තිය රස විඳීම.
- කාව්‍ය නිර්මාණයට යොමු කරවීම

4.21.4 තක්සේරුව/ ඇගයීම

- මහගමසේකර කවියා හා ඔහුගේ කවි මග පිළිබඳව අවධාරණය කෙරෙන අභ්‍යාසයන් කරවීම
- කවි පන්තියක් නිර්මාණය කරවීම

4.21.5 පරිශීලනය

- **සක්වාලිහිනි** - මහගම සේකර
- **හෙට ඉරක් පායයි** - මහගම සේකර
- **මහගම සේකර හා කලා නිර්මාණ** - එච්.එම්. මොරටුවගම

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.22 සිට්ටම්මා

### 4.22.1 හැඳින්වීම

විමල් දිසානායක මහත්මා ස්වකීය වෘත්තීය ජීවිතය ආරම්භ කරන්නේ විශ්ව විද්‍යාල කථිකාචාර්ය වරයෙකු වශයෙනි. අනතුරු ව කැලණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අංශයේ මහචාර්ය වරයෙකු බවට පත්විය. දක්ෂ පර්යේෂකයකු, විචාරකයකු, පරිවර්තකයකු මෙන් ම විශිෂ්ට කවියෙකු ලෙස ද ක්ෂේත්‍ර ගණනාවක දක්ෂතා ප්‍රකට කළ මෙතුමා රාජ සම්මානලාභී ග්‍රන්ථ කර්තෘවරයෙක් ද වෙයි. මොහුගේ විචාර කෘති අතර **විවාදාත්මක ලිපි සනාතන අරගලය, ගිරිකුල හා සඳ මඬල, නාට්‍ය කලාව** පිළිබඳ හැඳින්වීමක් යනාදිය ප්‍රමුඛතාවක් ගනී. සිය කාව්‍යමය දක්ෂතා ප්‍රකට කරන්නේ "**නර රකුසා, ඉන්ද්‍ර චාපා, කල්ප විනාශය, රැව්පිළි රැව්, දුරු රට සිට** " යන ආදී කාව්‍ය නිර්මාණ මඟිනි. නිසඳැස් කාව්‍ය සම්ප්‍රදායේ දියුණුව සඳහා මෙතුමාගෙන් ලැබුණු දායකත්වය අති මහත් ය. එම කාව්‍ය ක්ෂේත්‍රයේ අත්හදා බැලීම් රැසක් සිදු කිරීමට ද විමල් දිසානායක කවියා සමත් විය. පැරණි චීන කවි නමින් පරිවර්තනය කළ කෘතිය ද මෙතුමාගේ පරිවර්තන දක්ෂතාවට සාධකයකි. නව අනුභූතියක් පාදක කර ගනිමින් රචිත "**සිට්ටම්මා**" නම් පද්‍ය නිර්මාණය ද නව මඟක ගමන් ගත් එකක් ලෙස හැඳින්විය හැකි ය.

සාතිශය සංවේග ජනක සිදුවීම් කීපයක් සංකේතාත්මක ව නිරූපණය කිරීමෙහි ලා කතුවරයා දක්වා ඇති දක්ෂතාව අගය කළ යුතු ය. තම ආදරබර ස්වාමියා මිය යන සිට්ටම්මා තම සෙනෙහෙබර පුතු සමඟ මෙලොව තනි වේ. එසේ වුවද පුතුගේ සෙනෙහස ද ටික කලකින් අහිමි වේ. මෙය මවකට කිසිසේත් දරා ගත හැකි ඛේදවාචකයක් නොවෙයි. ඇගේ ජීවිතයේ පැවැති අරමුණු නිමාවෙයි. දැන් අරමුණක් නැති අනාගතයකි ඇයට ඇත්තේ. එබැවින් බලාපොරොත්තුව සිටින්නේ තමා වෙත ද මරණය පැමිණෙන තුරු ය.

> කඩුල්ල ළඟ හබරල කොළ අතරින් ඇගෙ මුණ පෙනේ
> අමුතු බලාපොරොත්තුවක් ඇගෙ ඇස් දෙක තුළ ලෙළ දෙයි

යන පද්‍ය දෙපදය ඒ බව තහවුරු කරයි. නැවතත් කෝන් ගහේ කොළ හැලෙන තුරු, වැව උතුරා වාම් දමන තුරු, උලමාගේ හඬ ඇසෙන තුරු, ඇය දෙවියන් යදිමින් සිටින්නීය.

මරණ දෙකක් පිළිබඳ ව කියවුණ ද මරණය යන වචනය කිසි විටකත් කවියා භාවිත කර නැත. ඒ සඳහා යොදන්නේ ගැමි සමාජයේ පවතින විශ්වාස කීපයකි. සංකේත කීපයකි. එය මෙසේ ය.

> කෝන් ගහේ කොළ හැලුණා
> වැව උතුරා වාම් දැම්මා
> මහ රෑ වැව ඉස්මත්තෙන්
> උලමෙකුගේ හඬ ඇසුණා

මේ සංකේත මුලින් ඇයට බියකරු වුවද දැන් ඇය ඒවා ප්‍රාර්ථනා කරන්නීය. සැමියා මිය යාමෙන් පුතුගේ ආරක්ෂා ව නොමැති වර්තමාන සමාජයේ වෙසෙන කාන්තාවන්ගේ ඛේදවාචකය මේ මඟින් ධ්වනිත කිරීමට කවියා දරා ඇති උත්සාහය වඩාත් සාර්ථක ව ඇත.

කවි දෙපද බැගින් යොදා යම් රටාවකට ගායනා කළ හැකි සේ පද්‍ය ආකෘතිය සකසා ගෙන ඇත. තම අත්දැකීම ප්‍රතිනිර්මාණය කිරීමටත්, ඒ තුළින් අපූර්වත්වයක් මතු කිරීමටත් කවියා උත්සාහ ගනී. සරල කාව්‍ය ආකෘතිය පමණක් නොව භාෂා ව්‍යවහාරයේ සරල බව ද කවියේ සාර්ථකත්වය තවත් වර්ධනය කරයි. ගමක පවතින ඇදහිලි, විශ්වාස, පවුලක

පවතින මානව සම්බන්ධතා, භෞතික පරිසරය ආදී බොහෝ දේවල් කවි පන්තිය මඟින් ධ්වනිත වීමට ඉඩ හැර ඇත. භාෂා භාවිතය, සංකේත, භාවිතය, කාව්‍ය ආකෘතිය, සමාජමය දෘෂ්ටිය හා මතුවන සාහිත්‍යමය රස පිළිබඳ ව ද තවදුරටත් ඔබට අවධානය යොමු කළ හැකි ය.

4.22.2 අභිමතාර්ථ

- කතුවරයා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ ව සොයා බැලීම
- කවි පන්තිය රසවත් කිරීමට යෙදූ බස්වහර හා කාව්‍යෝපක්‍රම පිළිබඳ ව අවබෝධයක් ලැබීම
- සමාජ අත්දැකීම් පිළිබඳ කියැවෙන කවි පන්ති මැනවින් වටහා ගැනීම

4.22.3 අභිමතාර්ථ සාධනය

4.22.3.1 ප්‍රවේශය

- වර්තමාන සමාජ වටපිටාවේ මෙවැනි අවස්ථා සිහියට නඟමින්
- මරණයක දී ගැමියා තුළ පවතින විශ්වාස පිළිබඳ විමසා බලමින්

4.22.3.2 ඉගෙනුම් ක්‍රියාකාකරම

- කවි පන්තිය ගායනා කිරීම
- කවි පන්තිය රසවත් වීම සඳහා භාවිත කර ඇති උපක්‍රම සාකච්ඡා කිරීම
- සංකේත හා භාෂා භාවිතය ගැන විස්තර කිරීම

4.22.4 තක්සේරුව/ ඇගයීම

- ජීවිතයේ විවිධ සිදුවීම්වල දී දක්නට ලැබෙන ගැමි විශ්වාස ඒකරාශී කිරීම
- තමන් කම්පනයට පත් වූ මෙවැනි සිද්ධියක් පාදක කර ගනිමින් කාව්‍ය නිර්මාණයක් කිරීම
- කවියා කවි පන්තිය රසවත් කිරීමට යොදා ගත් උපක්‍රම පිළිබඳ ව විමසීමසඳහා අභ්‍යාසයක්

4.22.5 පරිශීලනය

- **නව කවි සරණිය** - විමල් දිසානායක

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.23 සෙවණැලි

### 4.23.1 හැඳින්වීම

මර්සලින් ජයකොඩි පියතුමා ජනාදරයට පාත්‍ර වූයේ කතෝලික පූජක වරයෙකු වශයෙන් පමණක් නොවෙයි. ප්‍රතිභා සම්පන්න කවියෙකු, ගීත රචකයෙකු මෙන් ම සංගීතඥයකු ලෙස එතුමා සාහිත්‍ය, සංගීත, කලා ක්ෂේත්‍රයේ දක්වන ලද කුසලතාව බොහෝ දෙනාගේ ප්‍රසාදයට හේතු විය. "පන්සලේ පියතුමා" යන විරුදාවලියෙන් හැඳින්වීමට තරම් එතුමා බෞද්ධ ජනතාවගේ ද ගෞරවාදරයට පාත්‍රව වන්නේ ය. කලා කරුවකු වශයෙන් එතුමාට සීමා මායිම් නොතිබුණි. එතුමාගේ "**මුතු**" කාව්‍ය ග්‍රන්ථයට රාජ්‍ය සම්මාන හිමි විය. සිංහල චිත්‍රපට ගණනාවකට ම ගීත රචනයෙන් දායක වූ එතුමා රේඛාව චිත්‍රපටයට ලියූ "**වෙසක් කැකුළු අතු අග ඉඳ**" ආදී ගීත අතිශයින් ජනප්‍රියත්වයට පත් විය. කිතුණු ගීතිකා, ළමා කවි, බොදු ගී රැසක් නිර්මාණය කළ එතුමා භාෂා ප්‍රේමියකු ද විය. හෙළ හවුලේ බස්වහර ප්‍රිය කළ එතුමන්ගේ කවි ආර සරල හා සුගම එකක් විය. "සකල විශ්වයම එකම කවි කෙතක් සේ දකින මිනිස් වර්ගයා සිය කවි තොටිල්ලේ නැළවෙන සුරතලුන් සේ සිතන, චින්තා පරපුරකට ද, කාව්‍යමය පුණ්‍ය මහිමයකට ද, උරුමක්කාරයෙකි" (පී. මලල්ගොඩ - කොළඹ කවි යුගය).

**සෙවණැලි** පද්‍ය පන්තිය අනුරාධපුර පූජා භූමිය වස්තු විෂය කොට ගෙන රචනා කරන ලද්දකි. බුදු සසුනේ සෙවණැල්ල අනුරාධපුරයට තුන්රුවනේ සැනසිල්ල ළඟා කර දුන් අයුරු සිහිපත් කරමින් සහෘදයා තුළ භක්තියත්, දේශාභිමානයත් දැනවීම කවියාගේ අරමුණ වී ඇති බව පෙනේ. අනුරාධපුරයේ පෙර ශ්‍රී විභූතිය සිහියට නඟන කවියා යළි ඒ තත්ත්වයට පත්වේ යයි සිතීම සිහිනයක් බව පවසයි.

අනුරාධපුරය හරහා ගිය අවස්ථාවක තමා ඇසූ දුටු දේ කවියා විස්තර කරයි. පූජා භූමියෙහි වෙහෙර විහාර මල් පහන් පුදන වන්දනා කරුවන් ගිමන් හරින්නන් දැකීමෙන් අතීත ශ්‍රී විභූතිය පිළිබඳ සිතිවිලි අවදි වන බව කවියා පවසයි. එයින් හෙළයකු වශයෙන් මහත් අභිමානවත් සතුටක් ලබයි.

සිය අත්දැකීම කවියක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමේ දී කවියා ඊට උචිත ආකෘතියක් ලෙස සමුද්‍ර ඝෝෂ විරිත තෝරා ගෙන ඇත.

කවි පන්තිය සඳහා කවියා යොදා ගෙන ඇත්තේ සරල බස් වහරකි. ඇතැම් තැනක සම්භාව්‍ය කාව්‍ය ග්‍රන්ථ සිහිපත් කරවන යෙදුම් ද ඇත.

"කොත් සෙවනේ හිඳ නිවනේ ගිමන් හැර"

ඇතැම් තැන ශබ්දානුප්‍රාසය කෙරෙහි ද යොමු වී ඇත.

"ගොනු ගොනු වී වැඳ වැඳ යති"
"ගිය දිනවල මල් රැලි දික්වෙනවා"

කවියා විසින් යොදා ගෙන ඇති වෙනත් කාව්‍යෝක්තීන් පිළිබඳ ව ද සලකා බැලීම සුදුසු ය.

"මා දැක වන වසා හිරු කීවා රහසේ"
"පුන්සඳෙනුයි කිරි හැළුනේ පුද බිමට"
"හිස බා ඇත කරවට ඇති ගල් ගොල්ලේ"
"අනුරාපුර අද ගල් ගැසිලා සිටිනා"

අරුත් ප්‍රතිපාදනයේ දී මෙම කාව්‍ය ප්‍රයෝගවලින් ලැබෙන පිටුවහල විමසා බලන්න.

4.23.2 අභිමතාර්ථ

- මර්සලින් ජයකොඩි පියතුමා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ අවබෝධයක් ලැබීම
- කතුවරයා තම නිර්මාණවලට පාදක කරගත් වස්තු විෂය පිළිබඳ ව හඳුනා ගැනීම

4.23.3 අභිමතාර්ථ සාධනය

4.23.3.1 ප්‍රවේශය

- මර්සලින් ජයකොඩි පියතුමා ලියූ ගීයක් රස විඳීමට සැලැස්වීම
- අනුරාධපුරයේ ඓතිහාසික වටිනාකම පිළිබඳ සාකච්ඡාවක්
- ඔබට අභිමත සුදුසු ප්‍රවේශයක්

4.23.3.2 ඉගෙනුම් ක්‍රියාකාරකම

- කවි පන්තිය ගායනා කරවීම
- කවියා සහ ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම
- කවි පන්තියේ අරමුණු හඳුනා ගනිමින් එහි අගය විමසීම
- කවි පන්තිය රස විඳීමේ සාකච්ඡාවක්

4.23.4 තක්සේරුව/ ඇගයීම

- කවි පන්තිය පිළිබඳ රසාස්වාදයක් ලියවීම
- කවියා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු එකතුවක්
- කවි ගායනය

4.23.5 පරිශීලනය

- මර්සලින් ජයකොඩි පියතුමා විසින් ලියන ලද ගීත

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

සිංහල සාහිත්‍ය රසාස්වාදය

10, 11 ශ්‍රේණි

කාලච්ඡේද

| | | |
|---|---|---|
| 1. උම්මග්ග ජාතකය | - | 70 |
| 2. බුදුගුණ අලංකාරය | - | 50 |
| 3. නූතන පද්‍ය සංග්‍රහය | - | 40 |
| 4. නව කතාව (පෙත්සම) | - | 20 |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.